කාර්යසාධන වාර්තාව
செயல்திறன் அறிக்கை
Performance Report
2022



ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
Ministry of Defence

කාර්යසාධන වාර්තාව
2022

වැය ශීර්ෂ අංක 103

ආරක්ෂක අමාත්‍යාංශය

අන්තර්ගතය

		පිටු අංකය
ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය		
පරිච්ඡේදය 1 -	ආයතනික පැතිකඩ	
1.1	හැඳින්වීම	1
1.2	අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර	2
1.3	අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්	3
1.4	අමාත්‍යාංශයේ සංවිධාන සටහන	4-7
1.5	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන, ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්	8-9
1.6	විදේශ ආධාර ලබන ව්‍යාපෘති සහ විදේශ ණය යෝජනා ක්‍රම	10-17
පරිච්ඡේදය 2 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	19
2.1	ප්‍රගතිය	21-90
2.2	ඉදිරි දැක්ම	91-98
පරිච්ඡේදය 3 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	99
3.1	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය ආරක්ෂක අමාත්‍යාංශය	101
3.1.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය	103
3.1.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	104
3.1.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය	105-106
3.1.4	මූල්‍ය ප්‍රකාශ සටහන් - ආරක්ෂක අමාත්‍යාංශය	107
3.1.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය	108
3.1.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය	108
3.1.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - ආරක්ෂක අමාත්‍යාංශය	108
3.1.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය	109-110
3.1.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව - ආරක්ෂක අමාත්‍යාංශය	111-128
පරිච්ඡේදය 4 -	කාර්යසාධන දර්ශක විගණකාධිපතිවරයාගේ වාර්තාව - ආරක්ෂක අමාත්‍යාංශය	
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	131-135
පරිච්ඡේදය 5 -	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	137
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු	138-206
පරිච්ඡේදය 6 -	මානව සම්පත් පැතිකඩ	207
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	209
6.1.1	ආරක්ෂක අමාත්‍යාංශය	209
6.1.2	ජාතික ශිෂ්‍ය භට නිලධාරීන්	209
6.1.3	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය	210
6.1.4	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	210
6.1.5	ජාතික ආරක්ෂක අධ්‍යන ආයතනය	210
6.2	මානව සම්පත් සංවර්ධනය - ආරක්ෂක අමාත්‍යාංශය	211-213
පරිච්ඡේදය 7 -	අනුකූලතා වාර්තාව	215
7.1	ආරක්ෂක අමාත්‍යාංශය	217-222
7.2	ජාතික ආරක්ෂක විද්‍යායතනය	223-229
7.3	රණවිරු සේවා අධිකාරිය	230-237
7.4	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	237-244

ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය.....



"සැම සුරැකි සාමකාමී දේශයක්" යන දැක්ම පෙරදැරිව භෞමික අඛණ්ඩතාවයෙන් යුත්, සුරක්ෂිත ස්වෛරී රටක් තහවුරු කිරීම උදෙසා උපායමාර්ගික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම මඟින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රමුඛතම වගකීමයි.

ඒ අනුව, ගරු ආරක්ෂක අමාත්‍යතුමාගේ උපදේශකත්වය යටතේ ආරක්ෂක අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සියලුම දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනයන්හි ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩල විසින් සිය විෂයයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් කාර්යක්ෂමව හා මැනවින් ඉටු කිරීම පිණිස නිරන්තරයෙන් කැපවීම අමාත්‍යාංශයේ කාර්යසාධනය ඉහළ මට්ටමක පවත්වාගැනීම සඳහා ප්‍රශංසනීය මෙහෙවරක් ඉටු කරනු ලබයි.

ගෝලීය වශයෙන් නිර්මාණය වූ සමාජ, ආර්ථික, දේශපාලන අස්ථාවරත්වයන් හරහා දේශීය වශයෙන් පැණනැගුණු අර්බුදයන් හමුවේ ස්ථාවර රටක් නිර්මාණය කිරීමේ මූලික වගකීම ආරක්ෂක අමාත්‍යාංශයට පැවරුණු අතර එකී වගකීම ඉටුකිරීම උදෙසා සියලු බුද්ධි අංශ ශක්තිමත් කරමින් හා ත්‍රිවිධ හමුදා මෙහෙයවමින් මහජන සාමය ආරක්ෂා කරමින් හා ජාතික ආරක්ෂාව තහවුරු කරමින් සුරක්ෂිත රටක් ගොඩනැගීම උදෙසා සියලු ආයතන 2022 වර්ෂයේදී එක්සිතව කැපවීමෙන් කටයුතු කිරීම පැසසිය යුතුය.

එපමණක් ද නොව නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම, මිනිස් ජාවාරම, නීතිවිරෝධී මසුන් ඇල්ලීම මෙන්ම මුහුදු මංකොල්ලකරුවන් කෙරෙන් සමුද්‍රීය කලාපය ආරක්ෂා කිරීම සඳහාත්, භෞමික අඛණ්ඩතාවයෙන් යුත් ස්වෛරී සුරක්ෂිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීම හා ආරක්ෂා කිරීම සඳහාත් වූ ත්‍රිවිධ හමුදාවේ මැදිහත්වීම අගය කළ යුතුය. විශේෂයෙන් මත්ද්‍රව්‍ය උවදුර පිටුදැකීම උදෙසා අමාත්‍යාංශයේ කැපවීම මඟින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මර්දනය කිරීමට හා අනාගත පරපුර සඳහා සුබවාදී සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයට හැකිවීම සුවිශාල ජයග්‍රහණයකි.

එමෙන් ම, ස්වාභාවික ව්‍යසන මඟින් ආපදාවන්ට ලක් වූ ජනතාව මුදාගැනීම හා සහන සැලසීම, ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා පෙර සූදානම, ආපදා අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම මෙන් ම අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, ආපදාවන්ට ලක්විය හැකි හදුනාගත් අධි අවදානම් කලාප වලින් ජනතාව ඉවත් කිරීම යනාදී වූ විධික්‍රම මඟින් ජනතාවගේ උපරිම යහපත උදා කිරීම පිණිස අමාත්‍යාංශය මඟින් පියවර රැසක් ගෙන ඇත. එමඟින්, සියලුම ජනතාව උදෙසා යහපත් පරිසරයක ජීවත්වීමේ අවස්ථාව උදාකරදීම මෙන් ම ජීවන තත්ත්වය උසස් කිරීම මඟින් සුබවාදී අනාගතයකට අවැසි පසුබිම සැකසීමට ආරක්ෂක අමාත්‍යාංශයට හැකිවී ඇත.

ඒ අනුව, 2022 වර්ෂයේදී අමාත්‍යාංශයට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අභියෝග රැසකට මුහුණදීමට සිදුවූ අතර 2023 වර්ෂයේදී රට සහ ජාතිය ප්‍රමුඛත්වයෙහිලා සලකා විවිධ බාධාවන්, අවහිරතාවන් මැඩගනිමින් රට මුහුණ දී ඇති අර්බුද අභියස ජාතික ආරක්ෂාව බිඳ නොවැටීමටත්, කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයන්හි වර්ධනයටත් සහ ශ්‍රී ලාංකික ජනතාව ආර්ථිකමය වශයෙන් නැගී සිටීමට දරන ප්‍රයත්නයේ දී අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දීමටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්ය ආරක්ෂක අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදාව ප්‍රමුඛ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලුම ආයතනවල සේවයේ නියුතු සෑම දෙනාටම ලැබේවා'යි ප්‍රාර්ථනා කරන අතරම, අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීමට දායක වූ සියලුම දෙනා වෙත මාගේ ස්තුතිය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.



ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)

ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්

ලේකම්

ආරක්ෂක අමාත්‍යාංශය

පරිච්ඡේදය

1

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

භෞමික අඛණ්ඩතාවයෙන් යුත්, සුරක්ෂිත ස්වෛරී රටක පැවැත්ම තහවුරු කර ගැනීම මෙන්ම වත්මන් හා අනාගත පරපුරට අභිමානවත් ලෙස ජීවත්වීම උදෙසා ජාතික ආරක්ෂාව හා සාමය සුරක්ෂිත කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම ආරක්ෂක අමාත්‍යාංශය සතු ප්‍රමුඛතම වගකීමයි. " සැම සුරැකි සාමකාමී දේශයක් " යන දැක්ම පෙරදැරිව ත්‍රිවිධ හමුදාව ඇතුළු අමාත්‍යාංශය යටතේ වූ ආයතනයන් මෙහෙයවමින් සිය ප්‍රමුඛ වගකීම ඉටුකිරීමෙහි ලා ආරක්ෂක අමාත්‍යාංශය සුවිශේෂී වූ කාර්යය භාර්යයක නිරත වේ.

2022 වර්ෂයේ ආරක්ෂක වියදම් වෙනුවෙන් අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනයන් වෙත වෙන්කරනු ලැබූ ප්‍රතිපාදන ජාතික ආරක්ෂාවට තර්ජනයන් වන බෙදුම්වාදය, අන්තවාදය පදනම් වූ ත්‍රස්තවාදය පිටුදැකීම, දේශීයව හෝ ජාත්‍යන්තරව එල්ල විය හැකි තර්ජනයන් හා එම තර්ජනයන් ඇතිවීමට හේතු විය හැකි සාධකයන් සොයා බැලීම, ඒවා හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා පසු විපරම් කිරීම මෙන්ම බුද්ධි අංශවල ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරමින් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම, සන්නද්ධ හමුදා ශක්තිමත් කිරීම, සමුද්‍රීය හා ගොඩබිම් ආවේක්ෂණ කටයුතු මඟින් මත්ද්‍රව්‍ය ජාවාරම , මිනිස් ජාවාරම වැනි නීති විරෝධී ක්‍රියා මුලිනුපුටා දැමීම, දරිද්‍රතාවය පිටු දැකීම, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම, පරිසරය සුරක්ෂිත කිරීම, උසස් අධ්‍යාපනය තුළින් විනයගරුක සමාජයක් බිහිකිරීම, ආගමික හා සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කිරීම, ස්වාභාවික ව්‍යසනයන්ගෙන් හා වසංගත තත්ත්වයන්ගෙන් ජනතාව ආරක්ෂා කිරීම, නායකත්ව පුහුණුව මෙන්ම විදේශ මිත්‍ර සබඳතා ශක්තිමත් කිරීම සඳහා ද වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය කර ඇත.

එමෙන්ම, 2022 වර්ෂයේ දී සිදු වූ ආර්ථික හා මූල්‍ය අර්බුද හමුවේ ඇති වූ සමාජීය හා දේශපාලනික අස්ථාවරභාවය හේතුවෙන් උද්ගත වූ මහජන විරෝධතා, පෞද්ගලික හා පොදු දේපළ විනාශ කිරීම් හා තරුණ අසහනය පදනම් කරගත් අරගලයන් උපායශීලීව මැඩපැවැත්වීම සහ ඒ තුළින් ජාතික ආරක්ෂාව හා මහජන සාමය තහවුරු කරමින් සාමකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා ආරක්ෂක අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම වෙනුවෙන් දරන ලද පිරිවැය පුනරාවර්තන වියදම්හි ඉහළ යාමටත් ආර්ථික අර්බුදය හේතුවෙන් සංවර්ධන කටයුතු සීමා කිරීමටත් සිදු වීම හරහා 2022 වර්ෂය ආරම්භයේ දී සිදුකිරීමට අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම යම් දුරකට සීමා වූ බැව් සඳහන් කළ යුතු ය.

කෙසේ වුව ද, සමස්තයක් වශයෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අන්තවාදී හා බෙදුම්වාදී ක්‍රියා මෙන්ම ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වයන් ඇති කිරීම සඳහා සැලසුම්සහගතව ඒකරාශී වූ කණ්ඩායම්හි පටු අරමුණු කෙරෙහි ඉඩ නොතබමින් සුරක්ෂිත සාමකාමී දේශයක් බිහි කිරීමේ ප්‍රමුඛතම වගකීම සාක්ෂාත් කරගනු වස් ආරක්ෂක අමාත්‍යාංශය සිය මෙහෙය ඉටු කරමින් කටයුතු කළ අතර අනාගත පරපුර සඳහා සෞභාග්‍යමත් තිරසර දේශයක් බිහි කිරීමේ භාරදූර කර්තව්‍ය ද එලෙසින්ම ඉටු කිරීම උදෙසා කැපවීමෙන් කටයුතු කරනු ලබන බව වගකීමෙන් යුක්තව සඳහන් කරන්නෙමු.

1.2 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

''සෑම සුරැකි සාමකාමී දේශයක්''

මෙහෙවර

භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක්

තහවුරු කිරීම උදෙසා

උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම

සහ

ක්‍රියාවට නැංවීම

1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයයන්ට සහ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති , වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම
- අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම
- රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම
- රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් පවත්වාගෙන යාම
- ආගන්තුක හමුදාවන් හා සබඳතා පවත්වාගෙන යාම
- ජාත්‍යන්තර මානුෂීය මෙහෙයුම් සඳහා සහයෝගය ලබාදීම
- පුපුරණ ද්‍රව්‍ය හා ගිනිඅවි පිළිබඳ කටයුතු
- ප්‍රදීපාගාර නඩත්තුවට අදාළ කටයුතු (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාර හැර)
- ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබාදීම.
- ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම
- පෞද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු
- ගලවාගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම
- උද්ර්පණය නීතියට අදාළ කටයුතු
- වයෝ වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳ කටයුතු
- කාලගුණය හා දේශගුණය පිළිබඳ සේවාවන් සැපයීම
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදු කිරීම
- නායයෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධනය කටයුතු සිදු කිරීම
- ස්වාභාවික ව්‍යසන පෙරයිම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
- ස්වාභාවික ව්‍යසනවලට ඔරොත්තු දෙන පරිදි (ප්‍රත්‍යස්ථ) ඉදිකිරීම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන*




ආරක්ෂක අමාත්‍ය කුමා
ආරක්ෂක ලේකම
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන)
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති)
අතිරේක ලේකම් (පරිපාලන)
ප්‍රධාන මූල්‍ය නිලධාරී I
ප්‍රධාන මූල්‍ය නිලධාරී II
ජෝ.ස.ලේ. (සිවිල් ආරක්ෂක)
ජෝ.ස.ලේ (සංවර්ධන)
නි. පුහුණු ලබන පාලක 01
නි.අ. පුහුණු ලබන පාලක 02
ජෝ.ස.ලේ
අධ්‍යක්ෂ (අධ්‍යක්ෂණ හා ඇගයීම)
ප්‍රධාන ගණකාධිකාරී
සහකාර ලේකම් (සිවිල් ආරක්ෂක)
සහකාර ලේකම් (සංවර්ධන)
සහකාර පුහුණු ලබන පාලක 15
සහකාර ලේකම්
යාන්ත්‍රික ඉංජිනේරු
ගණකාධිකාරී (ආදායම් හා වත්කම් කළමනාකරණ)
ගණකාධිකාරී (වැටුප්)
ගණකාධිකාරී (ගෙවීම්)
ගණකාධිකාරී (මුදල්)
ගණකාධිකාරී (සැපයුම්)
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
අභ්‍යවකාශ හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී 03
පුහුණු කළමණාකරු, පර්යේෂණ සහකාර, මූල්‍ය සහකාර, සංවර්ධන නිලධාරී, බලාත්මක නිලධාරී, නීති සහකාර, කළමණාකරණ සේවා නිලධාරී, සංවර්ධන සහකාර, පිළිගැනීමේ නිලධාරී,පුස්තකාලයාධිපති
කාර්යාල කාර්ය සහායක, පියදුරු, ආරක්ෂක කුම ප්‍රදර්ශක
උදාහරණ කම්කරු

III- ඛණ්ඩය

ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ (මණ්ඩල)
හමුදා ස ස නිලධාරී
පුද්ගලික ලේකම්
අධ්‍යක්ෂ සේවාදායක (ලියාපදිංචි)
අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්

අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන	ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්
1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2. ශ්‍රී ලංකා නාවික හමුදාව 3. ශ්‍රී ලංකා ගුවන් හමුදාව 4. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව 5. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 6. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව 7. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 8. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය 9. රාජ්‍ය බුද්ධි සේවය 10. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය 11. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය 12. ජාතික ශිෂ්‍යභට බලකාය 13. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය 14. ආරක්ෂක පර්යේෂණය හා සංවර්ධන මධ්‍යස්ථානය 15. ආරක්ෂක සේවා විද්‍යාලය 16. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය 17. ජාතික ආරක්ෂක විද්‍යායතනය 18. රක්නා ආරක්ෂක ලංකා සමාගම 19. රණවිරු සේවා අධිකාරිය 20. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය 21. ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය 22. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 23. ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය 24. මිලෝදා ආයතනය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පීඨයක් ලෙස	○ 1949 අංක 17 දරන යුධ හමුදා පනත ○ 1950 අංක 34 දරන නාවික හමුදා පනත ○ 1949 අංක 41 දරන ශ්‍රී ලංකා ගුවන් හමුදා පනත ○ 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත ○ 1985 අංක 40 දරන හමුදා පනත ○ අංක අමප/19/3388/201/004 දරන 2019 දෙසැම්බර් පනත ○ 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ○ 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ○ 2008 අංක 05 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත ○ 1985 අංක 40 දරන මිනිස් බල උපයෝගිතා හා පරිපූරක හමුදා පනත ○ 1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය පනත ○ 1916 අංක 33 දරන ගිනි අවි ආඥා පනත ○ 1951 අංක 24 දරන වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත. ○ 1966 අංක 18 දරන පීඩාකාරී අවි පනත ○ 2001 අංක 9 දරන මුහුදු කොල්ලකෑමේ පනත. ○ 1979 අංක 48 දරන ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත ○ 1999 අංක 11 දරන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත ○ 2000 අංක 42 දරන සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමේ පනත

25. අපි වෙනුවෙන් අපි අරමුදල 26. ජාතික ආරක්ෂක අරමුදල	○ 1977 අංක 08 දරන උදර්පණ නීතිය ○ මහජන ආරක්ෂක ආඥාපනත (1947 අංක 25) ○ 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජිතායතන පනත ○ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනත ○ 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල පනත ○ 2005 අංක 13 ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත ○ 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ○ 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනත ○ 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘති සහ විදේශ ණය යෝජනා ක්‍රම

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
විදේශ ආධාර ව්‍යාපෘති					
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව					
	හදිසි බළඇණි සහ සන්නිවේදන පද්ධති සැපයීම පිළිබඳ මූල ලේඛනය	යුවාන් RMB 45,000,000	චීන ජන රජයේ අරමුදල්	-	මේ යටතේ හදිසි බළඇණි සන්නිවේදන පද්ධති ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත තවදුරටත් සැපයීමට නියමිතව ඇත. Mobile Command & Control Vehicle - 01 No Field Communication Vehicle - 01 No HE Communication System - 04 Nos
චීනය හා ශ්‍රී ලංකාව අතර අත්සන් කරන ලද 2017A-006-JY117 දරන මූල ලේඛනය (Protocol)	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත සන්නිවේදන උපකරණ සැපයීම	යුවාන් RMB 22,000,000	චීන ජන රජයේ අරමුදල්	-	මේ යටතේ පහත සඳහන් ගුවන් විදුලි යන්ත්‍ර 2022.12.06 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත භාරදීමට කටයුතු කර ඇත. 1. VHF Hand Held Radios - 200 Nos 2. VHF Mobile Base Stations - 550 Nos 3. VHF Repeaters - 100 Nos
ශ්‍රී ලංකා නාවික හමුදාව					
ඕස්ට්‍රේලියානු රජයේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබාදුන් ඩීසල් මෙට්‍රික් ටොන් 5000 ක් ඉන්දියාවේ සිට රැගෙන ඒම	ප්‍රදානය කිරීමක්	ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 10	ඕස්ට්‍රේලියානු රජය	2022/2023	ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකා මගින් මේ වන විට ඉන්ධන තොග රැගෙන එමින් පවතින අතර මේ වන විට ගමන් වාර 4 ක දී ඩීසල් මෙට්‍රික් ටොන් 1,130 ක් රැගෙන විත් ඇත.
ශ්‍රී ලංකා ගුවන් හමුදාව					
ඩෝනියර්- 228 ගුවන් යානය	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත.	ඉන්දියන් ජනරජය	2024 අගෝස්තු	දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. කාල සීමාව අවසානයේ ගුවන්

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
					යානය නැවත ඉන්දිය රජය වෙත භාරදීමට නියමිතය.
02 x B-350 ER ගුවන් යානා	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත.	ඇමරිකා එක්සත් ජනපදය	2023/2024	පළමුවන ගුවන්යානය 2023 ජනවාරි මාසය තුළදී ලබාදීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත.
FT-7 ගුවන් යානය	ව්‍යාපෘතියේ ස්වභාවය තීරණය කිරීම පිළිබඳව පවතින ගැටළු නිරවුල් කරමින් පවතී	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත.	පකිස්ථානු ජනරජය	2023	ගුවන් යානාවේ පද්ධති ගැළපීම් සහ නඩත්තු වියදම් සම්බන්ධව ගැටළු නිරවුල් කරමින් පවතී.
භාණ්ඩ හැසිරවීමේ දොඹකර පද්ධතියක් C-130 ගුවන් යානා සඳහා සැපයීම	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත.	ඇමරිකා එක්සත් ජනපදය	2023 මාර්තු	2023 මාර්තු මස ලබා දීමට නියමිතය.
C-130 ගුවන් යානා සඳහා අමතර කොටස් සැපයීම (විදේශීය ආරක්ෂක අංශ සඳහා භාණ්ඩ ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය යටතේ)	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත.	ඇමරිකා එක්සත් ජනපදය	2022 සිට ලැබෙමින් පවතී.	ලැබීමට නියමිත අමතර කොටස් 198න් 133 ක් දැනට ලැබී ඇත.
රුසියානු ණය යෝජනා ක්‍රමය	MI-17SH වර්ගයේ හෙලිකොප්ටර් 04ක් මිලදී ගැනීම	ඇ.ඩො.මී. 134.70	රුසියානු ණය යෝජනා ක්‍රමය	තහවුරු කර නොමැත.	ණය මුදල තහවුරු වී නොමැත.
ආපදාවකදී මුදා ගැනීමේ සහ මානුෂීය සහන සඳහා යොදා ගන්නා උපකරණ තොගයක් සැපයීම	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත.	ඇමරිකා එක්සත් ජනපදය	තහවුරු කර නොමැත.	උපකරණ භාර ගැනීමේ ලිපිය (LOA - Letter of Award) සඳහා ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලැබී නැත.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
පකිස්ථානු ණය යෝජනා ක්‍රමය	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භටයින් ප්‍රවාහනය කිරීමේ සන්නාහ සන්නද්ධ රථ (Armed Personal Careers-APC) 15ක් මිලදී ගැනීම	රු.මි. 335.00	පකිස්ථානු ණය යෝජනා ක්‍රමය	2024	මු.රෙ. 136 යටතේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති අතර මේ දක්වා අනුමැතිය ලැබී නොමැත.
ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ චීනවරාය විද්‍යා පීඨය සඳහා ආසන 700කින් සමන්විත අංග සම්පූර්ණ ශ්‍රවනාගාරයක් ඉදිකිරීම	ද්වීපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික සබඳතාවයන් වැඩි දියුණුකර ගැනීම සඳහා ඉන්දියානු ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ආරක්ෂක අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා සිදු කරන ලබන පරිත්‍යාගයකි.	ඇ.ඩො. 76,0000.00	ඉන්දියන් ජනරජය	දැනට එකඟතා ගිවිසුමට අදාල මූලික කටයුතු සිදු කරමින් පවතින බැවින් ව්‍යාපෘතිය ආරම්භ වන හෝ අවසන් කිරීමට දින තීරණය කොට නොමැත.	දැනට අදාල පාර්ශවයන් විසින් යෝජිත ඉදිකිරීමට අදාල වාචික සහ නෛතික ලියකියවිලි හා සම්බන්ධ කටයුතු සිදු කරමින් පවතී.
ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව					
ආපදා අවම කිරීම සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක අංශයේ උසස් තෙල් කාන්දුවීම් කළමනාකරණය	ආපදා අවම කිරීම සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක අංශයේ උසස් තෙල් කාන්දුවීම් කළමනාකරණ පුහුණු වැඩසටහනක් ස්ථාපිත කිරීමට ආයතනික සහාය ලබාදීම	දළ ඇස්තමේන්තුව ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය මගින් සහතික කර නොමැත	JICA	2024.12.31	-

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය					
ශ්‍රී ලංකාවේ ස්නායු විකෘති සක්‍රීය ආබාධ සහිත පුද්ගලයින් රැකබලා ගැනීම පිළිබඳ දුර්වලතා සපුරාලීම සඳහා වන ධාරිතාව සංවර්ධනය යුරෝපීය මුලපිරීමක් (nEUROcare)	1. පිළිගත් SLQF පද්ධතියට අනුකූලව (WP) මුළු ලකුණු 30 (පැය 91500) නියෝජනය කරන පාඨමාලා 8 කින් සමන්විත වන ස්නායු විකෘති සක්‍රීය රෝග අධ්‍යයන වැඩසටහනක් මෙම සමූහය විසින් වැඩි දියුණු කරනු ඇත. 2. සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ දැනුම වැඩි කිරීම සඳහා භාවිතා කළ හැකි වෘත්තීය සංවර්ධන පුහුණු මොඩියුල අඛණ්ඩව වැඩි දියුණු කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස රෝගීන් සඳහා සායනික සත්කාර සැපයීම වැඩිදියුණු කිරීම	63,856.00 Euro	Erusmus+	14.01.2025	nEUROcare grant number: 618596-EPP-1-2020-1-SE-EPPKA2-CBHE-JP
ඩෙංගු ප්‍රදානය (උපචාර අංක:2002706-286-381, La Jolla Institute of Immunology (LJI),USA සමඟ සහයෝගීතාවයෙන්	මිනිසුන් තුළ ඩෙංගු ආසාදනය පිළිබඳ අධ්‍යයනය	වසරකට ඇමරිකානු ඩොලර් 40,000.00	La Jolla Institute හරහා ජාතික සෞඛ්‍ය ආයතනය (NIH), ඇමරිකා එක්සත් ජනපදය	2022 මැයි 31 (මාස 2-3 කින් දීර්ඝ කරනු ලැබේ.)	ඩොලර් 40,000ක් ලැබුණු අතර මෙම ප්‍රදානයට අදාල වැඩ අවසන් කර ඇත.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
ක්ෂය රෝග (TB) ප්‍රදානය (උපචාර අංක: 20027-06-286-384, La Jolla Institute of Immunology (LJI), USA සමඟ සහයෝගීතාවයෙන්	මිනිසුන් තුළ ක්ෂය රෝගය ආසාදනය පිළිබඳ අධ්‍යයනය	වසරකට ඇමරිකානු ඩොලර් 40,000.00	La Jolla Institute හරහා ජාතික සෞඛ්‍ය ආයතනය (NIH) ඇමරිකා එක්සත් ජනපදය	2022 මැයි 31 මාස 2-3 කින් දීර්ඝ කරනු ලැබේ.	2022 වර්ෂය සඳහා ඩොලර් 40,000ක් ලැබුණු අතර මෙම ප්‍රදානයට අදාල වැඩ අවසන් කර ඇති අතර ප්‍රදානය තවත් වසර 5කට දීර්ඝ කර ඇත.විස්තර සහ වැඩ විෂය පථය අවසන් වෙමින් පවතී.
Latent TB (ගුප්ත ක්ෂය රෝග ප්‍රදානය (උපචාර අංක:3004901-286-368) La Jolla Institute of Immunology (LJI), USA සමඟ සහයෝගීතාවයෙන්	මිනිසුන් තුළ ගුප්ත ක්ෂය රෝගය ආසාදනය පිළිබඳ අධ්‍යයනය	වසරකට ඇමරිකානු ඩොලර් 85,000.00	La Jolla Institute හරහා ජාතික සෞඛ්‍ය ආයතනය (NIH), ඇමරිකා එක්සත් ජනපදය	ඔක්තෝබර්, 2022 කාර්ය සාධනය මත පදනම්ව වසර 1-2 කින් දීර්ඝ කරනු ලැබේ.	ශ්‍රී ලංකා රජයේ අනුමැතිය සඳහා වසර 1.5 වැඩියෙන් ගත විය. ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතිය අවම වශයෙන් තවත් වසරක් සඳහා දීර්ඝ කර ඇති අතර ඇ.ඩොලර් 63,517.00 ක් ලැබී ඇත. ඉතිරිය අපේක්ෂිත වසර 1-2ක දිගුව සමඟ ලැබෙනු ඇත. දැනට සාකච්ඡා කර අවසන් කර ඇත.
Melioidosis ප්‍රදානය (උපචාර අංකය 313-0921 Duke University ,USA සමඟ සහයෝගීතාවයෙන්	මිනිසුන් තුළ Melioidosis පිළිබඳ අධ්‍යයනය	ඇමරිකානු ඩොලර් 120,000.00	Duke University හරහා ආරක්ෂක දෙපාර්තමේන්තුව, ඇමරිකා එක්සත් ජනපදය	2023 මාර්තු	ශ්‍රී ලංකා රජයේ අනුමැතිය සඳහා වසර 1.5 වැඩියෙන් ගත විය ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රදානය 2023 මාර්තු දක්වා දීර්ඝ කර ඇති අතර පර්යේෂණය සම්පූර්ණ කිරීම සඳහා 2023 සැප්තැම්බර් දක්වා තවත් දීර්ඝ කිරීමක් සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී. KDU වෙත US$ 20,626.62ක් ලැබී ඇති අතර තවත් US$ 20,000ක ඉන්වොයිසියක් ඉක්මනින් ඉදිරිපත්

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
					කෙරේ.අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදය නිසා අපගේ වැඩකටයුතු ප්‍රමාද වී ආරම්භ වූ නමුත් මේ වන විට සතුටුදායක ලෙස කටයුතු කරමින් පවතී.
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය					
ස්ථායීකරණ ක්‍රමවේද මගින් නාය යාම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකාවේ නායයාම් පවතින පළාත් 06 ක දිස්ත්‍රික්ක 12 ක් ඇතුළත නායයාමේ අවදානම් ස්ථාන 127 ක නාය යාම් අවදානම අවම කිරීම	ඇ.ඩො.මි. 101.3	ආසියානු යටිතලපහසු කම් ආයෝජන (AIIB) බැංකුව	2023 ජුනි මස 30 දින	ව්‍යාපෘතිය සඳහා 2025 දෙසැම්බර් මස 31 දින දක්වා කාල දිගුවක් ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ආරක්ෂක අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

විදේශ ණය යෝජනා ක්‍රම

අදාළ රට	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	**2022 ප්‍රගතිය**
රුසියානු ණය යෝජනා ක්‍රම	BTR 82A 8 x 8 රෝද සහිත APC, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා ප්‍රතිසාදන සහ අණදෙන වාහන (ප්‍රමාණය තීරණය කිරීමට නියමිතයි)	ඇ.ඩො.මි. 134.7	ඉල්ලුම් කර ඇති භාණ්ඩ සහ එම භාණ්ඩවල ප්‍රමාණයන් සංශෝධනය වී ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ. (ඒ පිළිබඳව ඔබ අමාත්‍යාංශය දැනුවත් කර ඇත) BTR - 82 A සන්නද්ධ රථ - 10 7.62 MM SV - 98 ස්නයිපර් අවි - 60 7.62 MM SV - 98 ස්නයිපර් සයිට් - 60 7.62 MM SV - 98 ස්නයිපර් පතරොම් - 381942 KI - 126 BTR - 82 A කවර් අවුටර් - 72 ZU - 23 ගුවන් යානා නාශක අවි - 18 ZU - 23 ගුවන් යානා නාශක පතරොම් HEI- 47250 ZU - 23 ගුවන් යානා නාශක පතරොම් APIT - 15750
	MI-17SH වර්ගයේ හෙලිකොප්ටර් 04ක් මිලදී ගැනීම	ඇ.ඩො.මි.134.70	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) උපදෙස් ප්‍රකාරව තාවකාලිකව නැවතී ඇත.
ඉන්දියානු ණය	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා INDRA MK II	ඇ.ඩො.මි.100	PDF/AVN/20/10068 මෙම ගිවිසුම කොටස් 4 කින් සමන්විත වන අතර එහි

	MI-17SH වර්ගයේ හෙලිකොප්ටර් 04ක් මිලදී ගැනීම	ඇ.ඩො.මි.134.70	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) උපදෙස් ප්‍රකාරව තාවකාලිකව නැවතී ඇත.
ඉන්දියානු ණය යෝජනා ක්‍රම	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා INDRA MK II රේඩාර් පද්ධතියට අවශ්‍ය අමතර කොටස් උපාංග සහ විශේෂ පරීක්ෂණ උපකරණ මිලදී ගැනීම	ඇ.ඩො.මි.100	PDF/AVN/20/10068 මෙම ගිවිසුම කොටස් 4 කින් සමන්විත වන අතර එහි පලමුවන දෙවන හා තුන්වන කොටස් ගෙන්වා අවසන් වන අතර 4 වන කොටස ගෙන්වා ගැනීමට නියමිතය. මෙහි පළමු හා දෙවන කොටස් සඳහා ඉතිරි 60%ක කොටස ගෙවා අවසන් කර ඇති අතර 3 වන කොටස සඳහා වූ ඉතිරි මුදල 46,730.08 (USD) හා 4 වන කොටස සඳහා වූ 60%ක මුදල වන 161,404.06 (USD) මෙන්ම අවසන් 10% ගෙවීම වන 183,914.18 (USD) යන මුදල ඇතුලත්ව 392,048.32(USD) සැපයුම්කරු වෙත ගෙවීමට ඇත.
			PDR/AVN/20/10023 මෙම ගිවිසුමට අදාලව අළුත්වැඩියා කිරීමේදී අධික පිරිවැයක් දැරීමට සිදුවන (BER - Beyond Economical Repair) අයිතමයන් සඳහා වූ ගෙවීම් කරන ලද මුදල PDF/AVN/20/10068 ගිවිසුමෙහි ගෙවීමට ඇති ඉතිරි මුදලින් ආවරණය කිරීමට MOD/TB/01/03/02/2015 V-II දරන 2023 ජනවාරි මස 9 වන දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇත.
	ත්‍රිවිධ හමුදා සහ පොලීසිය වෙත අත්‍යාවශ්‍ය හා හදිසි ආරක්ෂක හා සන්නිවේදන උපකරණ මිලදී ගැනීම	ඇ.ඩො.මි.50	ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිරීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය යහපත් වනතුරු මෙම පහසුකම් සම්බන්ධ කටයුතු කල්දැමීමට තීරණය කර ඇති බව 2022 මාර්තු මස 10 වන දිනැති අංක MOD/FD/PB/09/1/01/2021 දරන ලිපිය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.
පාකිස්ථානු ණය යෝජනා ක්‍රම	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ නාවික හමුදාව සඳහා වාහන(තනි/ද්විත්ව කැබ් රථ) මිලදී ගැනීම	ඇ.ඩො.මි.10	පාකිස්තානු රජය මගින් මේ සම්බන්ධයෙන් පිළිතුරක් ඉදිරිපත් වී නොමැති හෙයින් තාවකාලිකව නැවතී ඇත.
	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා හටයින් ප්‍රවාහනය කිරීමේ සන්නාහ සන්නද්ධ රථ (Armed Personal Careers-APC) 10ක් මිලදී ගැනීම	ඇ.ඩො.මි.50 (නව)	

	STF සඳහා පොදු කටයුතු සඳහා වන ජීප්/4x2 ට්‍රක් රථ	ඇ.ඩො.මි.50 (පැරණි)	
	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භටයින් ප්‍රවාහනය කිරීමේ සන්නාහ සන්නද්ධ රථ (Armed Personal Careers-APC) 15ක් මිලදී ගැනීම	රු.මි. 335.00	මු.රෙ. 136 යටතේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති අතර මේ දක්වා අනුමැතිය ලැබී නොමැත.

පරිච්ඡේදය
2
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1
ප්‍රගතිය

2.1 ප්‍රගතිය

2.1.1 ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

අ. ජාතික ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදනය සහ ආරක්ෂක නීති සංශෝධනය

1. **ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය** - ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක යාන්ත්‍රණයක අවශ්‍යතාව අවබෝධ කරගත් රජය මීට වසර කිහිපයකට පෙර කෙටුම්පත් කරන ලද දැනට පවතින ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියේ විෂය පථය විස්තර කිරීම සඳහා ජනාධිපතිතුමා විසින් නව මාර්ගෝපදේශ ලබා දී ඇති අතර ඒ අනුව, එය අවසන් කිරීම සඳහා ජාතික ආරක්ෂක උපදේශකවරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වෙනු ඇත.
2. **ජාතික බුද්ධි පනත** - ජාතික බුද්ධි පනතේ කෙටුම්පත සමාලෝචනය සඳහා ජනාධිපතිවරයා වෙත භාරදී ඇත. අධිකරණ අමාත්‍යවරයා සහ ආරක්ෂක අමාත්‍යවරයා විසින් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කර ඇත.
3. ප්‍රතිපත්තිමය මැදිහත්වීම් -

- ශ්‍රී ලංකාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍ය අතර උදර්පන ගිවිසුම සම්බන්ධ ප්‍රතිපත්තිමය කටයුතු ඉටු කිරීම.
- හිටපු ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා වන කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- අධි ආරක්ෂිත කලාප පිහිටුවීමට අදාල මූලික කටයුතු සම්බන්ධ පියවර ගැනීම.

4. **ඉඩම් නිදහස් කිරීම** - ජනකොටස් අතර සංහිඳියාව සහ නැවත පදිංචි කිරීමේ කටයුතුවලට සහාය දැක්වීමේ රජයේ වැඩ පිළිවෙලට සහාය දැක්වීමක් වශයෙන් ත්‍රිවිධ හමුදාව සමඟ එක්ව ත්‍රිවිධ හමුදාව භුක්ති විඳින ඉඩම් වලින් නිදහස් කළ හැකි ඉඩම් හඳුනාගෙන ඒවා නිදහස් කර භාරදීමත්, අවශ්‍ය අවස්ථාවලදී හමුදා කඳවුරු ප්‍රතිස්ථානගත කිරීමට කටයුතු සම්පාදනය කිරීමත් සිදු කර ඇත.

5. **රජයේ ඉඩම් පවරා ගැනීම සහ පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම** - ආරක්ෂක අමාත්‍යාංශය සඳහා සහ අමාත්‍යාංශය යටතේ වන ත්‍රිවිධ හමුදාව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන සඳහා ඉල්ලුම් කර ඇති රජයේ ඉඩම් පවරා ගැනීමටත්, පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ ආයතන සමඟ කටයුතු කර ඇත. ඉඩම් රාජකාරී ඉටු කිරීමේ දී පහත කාර්යයන් සඳහා ප්‍රමුඛතාව ලබා දී කටයුතු කර ඇත.

2022.01.01-2022.12.31 දක්වා ඉඩම් රාජකාරි සම්බන්ධ ප්‍රගතිය

ආයතනය	2022 වර්ෂයේදී ලද නව ඉල්ලීම්	ප්‍රා.ලේ. වාර්තා කැඳවීම්	මු.ඉ. අනුමැතිය සඳහා යොමු කිරීම	කක්ෂේරු වාර්තා සඳහා යොමු කිරීම	ඉ.කොං.ප. යොමු කිරීම	නාගරික සංවර්ධන අධිකාරියට ලිපි යොමු කිරීම	ඉඩම් අමාත්‍යාංශයට ලිපි යොමු කිරීම (ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා)	මහවැලි අධිකාරිය	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	පැවරීම් සහතික ලබා ගැනීම	විවිධ අවසර පත්‍ර ලබා ගැනීම	
											ධන ඡීඩ	ධන සංරක්ෂණ
ශ්‍රීලංකා යුද්ධ හමුදාව	51	62	12	31	42	10	32	13	14	13	-	16
ශ්‍රී ලංකා නාවික හමුදාව	25	15	10	15	04	02	06	-	-	05	-	-
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	-	10	01	02	04	01	02	-	-	-	-	-
ජාතික ශිෂ්‍යභට බලකාය	08	04	-	-	01	-	-	-	-	01	02	-

6. **පාර්ලිමේන්තු කටයුතු -** පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා අදාළ ආයතනයන් සම්බන්ධීකරණය කරමින් නියමිත දිනට ත්‍රෛභාෂාවන්ගෙන් අදාළ පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කරන ලදී. ඒ අනුව, ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතන සම්බන්ධව පාර්ලිමේන්තු ප්‍රශ්න 18 කට පිළිතුරු සපයා ඇත.

7. පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවේදී අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයා ඇත.

8. ස්ථාවර නියෝග යටතේ අසන ප්‍රශ්න හා ගරු අමාත්‍යතුමාගෙන් පාර්ලිමේන්තුවේදී අසන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයා ඇත.

9. ආරක්ෂක අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම් 01 ක දී ඉදිරිපත් වූ යෝජනා හා තීරණ 11 ක් සම්බන්ධයෙන් අදාළ ආයතන සම්බන්ධීකරණය හා අවශ්‍ය කටයුතු ඉටු කරන ලදී. එමෙන්ම, මහජන පෙත්සම් කාරක සභාව වෙත පිළිතුරු සැපයීම සහ සහභාගීත්වය ලබා දීමේ දී ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාළව ප්‍රශ්න 22 ක් හා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීම් 03ක් සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත.

10. සැලසුම් හා අධීක්ෂණ කටයුතු -

- රාජ්‍ය ආයෝජන වැඩසටහනට අදාළව ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සම්බන්ධීකරණය සිදු කිරීම සහ වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන කාර්යක්ෂම හා ඵලදායී උපයෝජනය සහතික කිරීම සඳහා අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම අමාත්‍යාංශය යටතේ වන ආයතනයන් හි සහ අංශයන්හි සංවර්ධන ක්‍රියාකාරකම් හි ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කාර්යයන් ඉටු කර ඇත.
- අමාත්‍යාංශය යටතේ වන ආයතනවල ව්‍යාපෘතීන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබා දීම සහ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
- මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 12ක ප්‍රගතිය අධීක්ෂණය, ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම, අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගෙන ඇත.
- අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ වන ආයතනවල කාර්යසාධන වාර්තා සහ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතුකර ඇත.
- පහත සඳහන් ජාතික සැලසුම් ක්‍රියාවලීන් හි ආරක්ෂක අමාත්‍යාංශයේ ක්‍රමෝපායික මැදිහත් වීම සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.
    - තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුරූපීව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වූ ආයතනවල උපායමාර්ග හා දර්ශක සකස් කරන ලදී.
    - ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන ආයතන විසින් ගනු ලැබූ පියවරයන්හි ප්‍රගතිය අධීක්ෂණය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉදිරිපත් කරනු ලබන කාලාන්තර වාර්තා සඳහා අවශ්‍ය තොරතුරු අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.
    - කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ ප්‍රඥප්තියට අදාල මෙම අමාත්‍යාංශයට අදාළ තොරතුරු කාන්තා හා ළමා සංවර්ධන, පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

11. **පනත් සංශෝධනය -**

- වෙඩිපිටි ආඥා පනත සංශෝධනය සඳහා නීති කෙටුම්පත් අංශය වෙත යොමු කර ඇත.
- ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය, රණවිරු සේවා අධිකාරිය, ආරක්ෂක සේවා විද්‍යාලය, ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය, ජාතික ආරක්ෂක විද්‍යායතනය හා රක්නා ආරක්ෂක ලංකා සමාගම යන ආයතනයන්ට අදාළව නව පනත් කෙටුම්පත් කිරීම හා පවතින පනත් වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය සිදුකිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් සිටියි.

12. රටේ පවතින ආර්ථික අර්බුදය සහ දේශපාලන අස්ථාවරත්වය මධ්‍යයේ වුව ද ත්‍රිවිධ හමුදාව සේවයේ යෙදවීම තුළින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය දැක්වීම වෙනුවෙන් පුළුල් ආරක්ෂක උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම හා පුරවැසියන්ගේ මානව හිමිකම් ආරක්ෂා කරමින් දේපළවල ආරක්ෂාව සහතික කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

13. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම මඟින් ජාතික ආරක්ෂාව සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය මඟින් පහත සඳහන් උපාය මාර්ගික පියවර ගෙන ඇත.

- සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම සඳහා පහසුකම් සැලැස්වීම.
- සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයට අදාළ කර්තව්‍යයන් සම්බන්ධයෙන් වූ කාරණා සම්බන්ධීකරණය කිරීම.
- සන්නද්ධ හමුදාවල ඉදිරි ප්‍රතිවාදීන් හා ශක්‍යතාව නිශ්චය කිරීම සඳහා වූ තක්සේරු කිරීම් භාරගැනීම.
- සන්නද්ධ හමුදා මෙහෙයුම්වල සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීම සහ සන්නද්ධ හමුදාවන් අතරේ ඒවා ක්‍රියාත්මක කිරීම.
- සන්නද්ධ හමුදාවලට අදාළ අභ්‍යූ සැලසුම් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම.
- තීරණාත්මක ඌනතා සහ ශක්තීන් පිළිබඳ උපදෙස් දීම සහ ජාතික ආරක්ෂක අරමුණු කරා ළඟා වීමේදී සහ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීමේදී එවැනි ඌනතා සහ ශක්තීන් වල බලපෑම තක්සේරු කිරීම.
- ක්‍රමෝපාය සැලසුම්වලට අදාළව මුදල් වර්ෂයක් සඳහා සන්නද්ධ හමුදාවල වැඩසටහන්, නිර්දේශ හා අයවැය යෝජනා පිළිගත් ප්‍රමුඛ කරුණුවලට කොතෙක් දුරට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව උපදෙස් දීම.
- මිනිස් බලය හා උපකරණවලට අදාළව, සන්නද්ධ හමුදාවල මහා පරිමාණ වැඩසටහන් හා ප්‍රතිපත්ති කොතෙක් දුරට ක්‍රමෝපාය සැලසුම්වලට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව උපදෙස් දීම.
- යෝජිත ආරක්ෂක ප්‍රසම්පාදන සැලසුම්වලට එරෙහිව යුදමය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ ඒ අනුව අමාත්‍යාවරයාට උපදෙස් දීම.
- සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ පුහුණුවීම් සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම.
- සන්නද්ධ හමුදා විසින් සාමසාධක මෙහෙයුම් කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඉහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා නියම කරනු ලබන හෝ අවශ්‍ය කරන වෙනත් සියලු කාර්යයන් ඉටුකිරීම.

14. රාජ්‍ය බුද්ධි සේවාව ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින තර්ජනයන් හඳුනාගෙන ඒ පිළිබඳව පූර්ව බුද්ධි තොරතුරු අදාළ පාර්ශ්වයන් වෙත ලබාදෙමින් එම තත්ත්වයන් වළක්වා ගැනීමේ අරමුණෙන් ස්ථාපිත කර ඇති රජයේ ප්‍රමුඛතම බුද්ධි ආයතනය වන අතර 2022 වර්ෂයේදී ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තීරණ ගනු ලබන පාර්ශවයන් වෙත හා විවිධ ආයතනයන් වෙත යොමු කර ඇති වාර්තා ප්‍රමාණය පහත පරිදි වේ.

වාර්තා වර්ගය	යොමු කළ වාර්තා ප්‍රමාණය
සංවේදී රහසිගත වාර්තා	17,378
ආරක්ෂක නිශ්කාෂණ වාර්තා	874,265
ආරක්ෂක තත්ත්ව වාර්තා	648

15. හමුදා සහ සිවිල් නිලධාරීන් සඳහා ජාතික ආරක්ෂාව පිළිබඳ ක්‍රමෝපායික අධ්‍යයනය සිදුකිරීමට ඇති එකම හා ප්‍රධානතම අධ්‍යයන ආයතනය වන ජාතික ආරක්ෂක විද්‍යායතනය මඟින් හමුදා හා සිවිල් අංශයේ පරිපාලනය උදෙසා අවශ්‍ය බුද්ධිමය දායකත්වය ලබාදීම හා ආරක්ෂක ක්‍රමෝපායික මාර්ගෝපදේශ ලබාදීම සිදුකර ඇත.

ආ. ආරක්ෂක අංශ ශක්තිමත් කිරීම

1. ත්‍රිවිධ හමුදාව සඳහා නවීන තාක්ෂණික මෙවලම් සඳහා ආයෝජනය

ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතනවලට පැවරී ඇති භාරදූර කර්තව්‍යය සලකා අයවැය මඟින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතනද ඇතුළුව ආරක්ෂක අමාත්‍යාංශයට 2022 වසර සඳහා රුපියල් බිලියන 34.8 ක මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා රාජ්‍ය බුද්ධි සේවාවෙහි ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ත්‍රිවිධ හමුදාවේ ආවේක්ෂණ හැකියාව හා මෙහෙයුම් ධාරිතාව වැඩි කිරීම සඳහා වන මිලදී ගැනීම් හා අළුත්වැඩියාවන් සඳහා යෙදවීමට ප්‍රමුඛතාව දෙන ලදී.

මෙම ප්‍රතිපාදන යුද්ධ හමුදා බුද්ධි අංශය අළුතින් ප්‍රතිසංවිධානය කිරීමටත්, බුද්ධි තොරතුරු සන්නිවේදනය වඩා කඩිනම්ව උපරිම රහස්‍යභාවයෙන් සිදු කිරීමට අවශ්‍ය නවීන සන්නිවේදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහාත් උපයෝජනය කරන ලදී. එමඟින්, යුද්ධ හමුදා භට පිරිස්වලට නවීන තාක්ෂණය ලබාදෙමින් යුද්ධ හමුදා සෙබලා නූතන තාක්ෂණ සෙබලෙකු ලෙස නිර්මාණය කිරීමටත් ශක්තිමත් යුද්ධ හමුදාවක් බිහි කිරීමටත් අවශ්‍ය මූලික පියවර ගැනීමට හැකියාව ලැබුණි.

ශ්‍රී ලංකා නාවික හමුදාව සතු නාවික බලය ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ සිදුවන නීති විරෝධී ක්‍රියාවන් නැවැත්වීම, සමුද්‍රීය ආරක්ෂාව සහ නාවික ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය මඟින් හැකියාව ලැබුණි.

එමෙන්ම, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා වෙන් වූ ප්‍රතිපාදන මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නියමුවන් රහිත ලිහිණියා වර්ගයේ ගුවන්යානා දේශීයව නිෂ්පාදනය හා ඊට අදාල පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණි. ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් අරමුදල් සපයන ලද පහත පර්යේෂණ ව්‍යාපෘති ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ව්‍යාපෘති කණ්ඩායම් විසින් සිදු කර ඇත.

- ස්වයංක්‍රීය යැපුම් නිරීක්ෂණ විකාශන (ADS-B) ගුවන් යානා නිරීක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මීරිගම කඳවුරේ ගුවන් ආරක්ෂණ අණ හා පාලන මධ්‍යස්ථානය වෙත ගොඩබිම සිට ගුවන්යානා දක්වා සන්නිවේදන අධීක්ෂක පද්ධතියක් පාදක කරගත් අන්තර්ජාල ප්‍රොටෝකෝලය සංවර්ධනය කිරීම.
- ගුවන් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ (ADOC) ගුවන් ආරක්ෂක රේඩාර් බලඝණවල ගුවන් ආරක්ෂක සිමියුලේටර් පද්ධතිය වැඩිදියුණු කිරීම.
- ත්‍රිවිධ හමුදාවේ කටයුතු ශක්තිමත් කිරීම හා නවීකරණය කිරීමේ අරමුණින් 2022 වසරේ දී ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලද ප්‍රාග්ධන අයිතමයන් පහත දැක්වේ.

ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.	2022 වර්ෂයේ ලද ප්‍රතිපාදන රු.මි	2022.12.31 අවසානය වන විට ප්‍රගතිය	
			මූල්‍ය	භෞතික
ආරක්ෂක අමාත්‍යාංශය				
ආරක්ෂක මූලස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය	60,886.02	7,000.00	45,019.12	82%
උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය	1,192.00	140.00	656.80	71.3%
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව				
මහල් 15කින් සමන්විත වෛද්‍ය පහසුකම් හා සෙසුනිල නේවාසිකාගාර පහසුකම් සහිත රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (නාරාහෙන්පිට)	4,004.04	149.00	1,384.20	15.08%
ත්‍රිවිධ හමුදා මධ්‍යම පතොරම් අවි ගබඩාව සහ වාණිජ පුපුරණ ද්‍රව්‍ය අවි ගබඩා සංකීර්ණය ඉදිකිරීම පුනානි, අගුණවැල්පැලැස්ස හා ගජසිංහපුර	1,568.60	192.38	1,331.44	84.4%
ශ්‍රී ලංකා නාවික හමුදාව				
ත්‍රිකුණාමලයෙහි නෞකා තටාංගනයේ ජැටියේ ඉදි කිරීම්	4,611.40	800.00	2,060.34	39.89%
ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඉතා අධි සංඛ්‍යාත හා අල්ට්‍රා අධි සංඛ්‍යාත (VHF / UHF) සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම.	1,112.00	780.00	704.54	71.3%
ශ්‍රී ලංකා ගුවන් හමුදාව				
අංක PT-06 ගුවන් යානා 06ක් මිලදී ගැනීම	ඇ.ඩො.මි.5.62	83.84	968.16	98%
අංක Y-12 IV සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා 06ක් මිලදී ගැනීම	ඇ.ඩො.මි. 19.997	1,188	1.037.53	65%

ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.	2022 වර්ෂයේ ලද ප්‍රතිපාදන රු.මි	2022.12.31 අවසානය වන විට ප්‍රගතිය	
			මූල්‍ය	භෞතික
භාවිතා කළ පුහුණු හෙලිකොප්ටර් 04ක් මිලදී ගැනීම	700.00	678.16	0.00	60%
උපයෝගිතා වාහන මිලදී ගැනීම (Purchase of Utility Vehicles)	780.00	256.00	418.89	100%
ඉන්දියානු ණය යෝජනා ක්‍රමය	7,141	264.76	276.96	81%
පකිස්ථාන ණය යෝජනා ක්‍රමය	390.00	48.24		10%
කෆීර් ප්‍රහාරක ගුවන් යානා වැඩිදියුණු කිරීම	11,539.01	3,554.70	3,554.70	31.5%
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය/ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය/ආපදා සහන සේවා මධ්‍යස්ථානය/ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව				
ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	15.00	7.50	7.50	43%
මහජන දැනුවත් කිරීම සහ ධාරිතා ගොඩනැගීම	16.00	8.50	5.42	60%
අවදානමට ලක්විය හැකි ප්‍රදේශයේ යෙදවීමට අවශ්‍ය හදිසි ප්‍රතිචාර උපකරණ මිලදී ගැනීමෙන් සෙවීම් සහ මුදාගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම	10.00	6.00	4.11	90%
බහු උපද්‍රව අවදානම් තක්සේරුව- (අධ්‍යාපන අංශයේ ආපදා අවදානම් තක්සේරුව, මුද්‍රණ, වැඩමුළු)	247.00	1.00	41.78	96%
නායයෑමේ අවදානම් පැතිකඩක් සංවර්ධනය කිරීම	246.00	15.00	203.27	90%
නාය යෑමෙන් විපතට පත් ප්‍රදේශවල නිවාස ඉදිකිරීම	2,838.00	-	2,079.03	97%
ආපදා තත්ත්වය හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා දිස්ත්‍රික්කයේ ආරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරීම	300.00	50.00	70.20	26%
ආපදා අවදානම් ප්‍රදේශවල පදිංචිව සිටින ජනතාව සඳහා ආපදා ප්‍රතිරෝධී නිවාස ඉදිකිරීම	1,200.00	100.00	11.30	3.72%
නාය යෑම් ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම්	500.00	3.00	71.29	65%

ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මී.	2022 වර්ෂයේ ලද ප්‍රතිපාදන රු.මී	2022.12.31 අවසානය වන විට ප්‍රගතිය	
			මූල්‍ය	භෞතික
සඳහා ධාරිතාව ඉහළ නැංවීම සඳහා දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීම (රත්නපුර, කළුතර) I අදියර				
නායයෑම් සහ ඒ ආශ්‍රිත උවදුරු ඵලදායී ලෙස අවම කිරීම සඳහා ව්‍යූහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සහ යෙදවීම සහ ඒ ආශ්‍රිත ධාරිතාව ශක්තිමත් කිරීම	70.00	0.75	35.61	100%
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ රසායනික ව්‍යසන අවදානම පිළිබඳ ක්‍රමානුකූල රෝග විනිශ්චය ඇගයීම දීර්ඝ කරන ලද කාර්යය	38.00	5.00	35.20	100%
නාය යෑමේ අවදානම අවම කිරීම සඳහා වර්ෂාවෙන් ඇතිවන පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය	17.00	5.00	15.00	40%
නායයෑම් විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන	100.00	100.00	100.00	100%
ස්වයංක්‍රීය වැසි මාපක ජාලය පුළුල් කිරීමෙන් තත්‍ය කාලීන නායයෑම් පූරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ හැකියාව වැඩි දියුණු කිරීම.	15.00	10.00	10.00	100%

2. ත්‍රිවිධ හමුදාව විසින් සිදු කරන හදිසි මෙහෙයුම්, සංවර්ධන කාර්යයන් හා වැඩි දියුණු කිරීම්

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2022 මාර්තු මස සිට මහජනතාව තම ඉල්ලීම් පිළිබඳ පැවති රජයට විරුද්ධව ක්‍රියාත්මක කරන ලද අරගලය මැඩපැවැත්වීම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවල සිට බස්නාහිර පළාත කේන්ද්‍ර කරගනිමින් කොළඹ මහනගර සභාව ආශ්‍රිතව බළඇණි 29ක් කැදවන ලදී. ඒ අනුව, 1 බළකාය සහ ඒ යටතේ ඇති 53 වන සේනාංකය, 532 බලසේනාව සහ ගුවන් සංක්‍රමික බලසේනාවට අයත් හට පිරිස් මූලිකවම සම්බන්ධවී පොලිසිය සඳහා ක්‍රියාන්විත සහය ලබාදී ඇත.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් රට තුළ පැවති අරගලකාරී තත්ත්වය පහව ගොස් සාමකාමී වාතාවරණයක් ඇති වූ අවධියක පැමිණි සේනාංක, බලසේනා සහ ඒකක නැවත එම ප්‍රදේශවලට පිටත්කර හරින ලදි. තවද, එම හටපිරිස් අතුරින් පාබල ඒකක 5 ක් සහ ගුවන් සංක්‍රමික බළඇණි 2 ක් ශ්‍රී ලංකා පොලීසිය විසින් විවිධ අවස්ථාවන් වලදී සිදුකරන ලද ඉල්ලීම්වලට සහය වීම සහ

විශේෂ මර්මස්ථාන (ජනාධිපති මැදුර, ජනාධිපති කාර්යාලය සහ පාර්ලිමේන්තු සංකීර්ණය වැනි) ආරක්ෂාව සඳහා කොළඹ නගරය කේන්ද්‍ර කොටගෙන ස්ථානගත කර ඇත.

- දිවයින පුරා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකටම එක් බලසේනාවක් සහ ඒකක 2 ක් වශයෙන් යුද්ධ හමුදා කඳවුරු ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව, සේනාංක මූලස්ථාන 2 ක් බලසේනා මූලස්ථාන 5 ක් සහ ඒකක 12 ක් වශයෙන් දිවයිනේ උතුරු ප්‍රදේශයේ සිට දකුණු ප්‍රදේශය දක්වා ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් දියත්කර/ක්‍රියාත්මක කර ඇත.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ධීවර වරායන් 24 ක් ආවරණය වන පරිදි ධීවර කටයුතුවල නියැලෙන ධීවර යාත්‍රා පිළිබඳ විස්තර ලබා ගැනීම සඳහා ඒකාබද්ධ සාගරික සීමා පාලන පද්ධතියක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ ස්ථාපිත කර ඇත.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ගොඩබිමේ සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ ආවේක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා වීඩියෝ පහසුකම් සහිත අංග සම්පූර්ණ රථයක් නිර්මාණය කර ආවේක්ෂණ රාජකාරි සඳහා යොදවා ඇත.

- මුහුදේදී සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රෙජිමේන්තු කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ අරමුණින් හා සටන් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා 2021 වර්ෂයේදී ලබා ගන්නා ලද ඩ්‍රෝන එක් එක් ගුවන් හමුදා කඳවුරු ප්‍රදේශයන්හි මෙහෙයුම් අවශ්‍යතාව මත පහත පරිදි 2022 වර්ෂය තුළදී ප්‍රතිස්ථාපනය කර ඇත.

ඩ්‍රෝන වර්ගය	ප්‍රමාණය	ස්ථානය	කාර්යසාධනය
1. DJI M300 RTK	03	ගුවන්හමුදා කඳවුර කටුකුරුන්ද (111 UAV Sqn)	දිවා රාත්‍රී ක්‍රියාත්මක කළ හැකි කැමරාව, සිරස්ව ගොඩබැස්සවිය හැකි අධෝරක්ත කැමරා හා විෂුවල් කැමරා සහිත වේ. වැඩිකාලයක් (පැය -01) පියාසර කළ හැකි වීම, කිලෝමීටර් 12කට වැඩි දුරක් පියාසර කළ හැකි වීම, උපරිම කිලෝග්‍රෑම් 06 රැගෙන යා හැකි වීම
2. DJI Mavic 2 Enterprise Dual	01	මූලික කඳවුර කටුනායක (CBRNE Unit)	දිවා රාත්‍රී ක්‍රියාත්මක කළ හැකි කැමරාව, සිරස්ව ගොඩබැස්සවිය හැකි අධෝරක්ත කැමරා හා විෂුවල් කැමරා සහිත වේ. අඩුකාලයක් (විනාඩි -31) පියාසර කළහැකි වීම, කිලෝමීටර් 06කට ආසන්න දුරක් පියාසර කළ හැකි වීම, උපරිම කිලෝග්‍රෑම් 2.2 රැගෙන යා හැකි වීම.
3. DJI Mavic 2 Enterprise Dual	01	ශ්‍රී ලංකා ගුවන්හමුදා කඳවුර පහිනාංකය දිගන	

3. ආරක්ෂක යටිතල පහසුකම් සංවර්ධනය

(අ) ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

1979 කොළඹ ප්‍රධාන සැලසුමට අනුව, වාණිජ සංවර්ධනය උදෙසා සඳහා ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් ඉඩම් විශාල සංඛ්‍යාවක් මුදාහැරීමට හැකි වන අයුරින් රජයේ කාර්යාල කොළඹ සිට නව පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත රැගෙන යාමට සැලසුම් කරන ලදී. සියලු ආරක්ෂක අංශ එක් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයක් යටතට ගෙනයාම තුළින් මූලිකවම බලාපොරොත්තු වනුයේ මේ වන විට ආයතන කිහිපයක් අතර බෙදී පවතින සම්පත් ඵලදායී අන්දමින් ප්‍රයෝජනයට ගැනීම, යටිතල පහසුකම් ද්විකරණය වීම අවම කිරීම, ඔවුන්ගේ මෙහෙයුම් /පරිපාලන/ප්‍රවර්ධන යන කාර්යයන්හි කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය වන පරිදි ආරක්ෂක අංශ සාමාජිකයන් වෙත නවීන පහසුකම් වලින් සමන්විත කාර්යාල සංකීර්ණයක් ලබාදීම සහ සංකේන්ද්‍රගත සංවර්ධන කලාපය තුළ පිහිටි අධිආරක්ෂිත කලාප සංඛ්‍යාව අවම කිරීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් සහ මහජනතාවට ඇතිවන අපහසුතාවන් අවම කිරීම යනාදිය දැක්විය හැකිවේ.

ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීමේ පහසුව සහ මූල්‍යමය ශක්‍යතාව පවත්වා ගැනීම සඳහා පහත සඳහන් ආකාරයට 2012 වසරේදී ඉදිකිරීමේ කටයුතු අදියර 02 කට වෙන් කර ඇත.

ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය (බිම් කැබලි 09ක්), සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, ජලාපවාහන පද්ධතිය සහ ජල පොම්පාගාරයක් සහ සෙසු නිලයන් සඳහා තාවකාලික නවාතැන් පහසුකම් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වේ. ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙන කාලය තුළ පැන නැගුනු මුල්‍යමය සීමාකිරීමේ හා ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘති බිමෙහි යුද්ධ හමුදා මූලස්ථානය ස්ථාපනය කිරීමේ පවතින දැඩි අවශ්‍යතාවය මත මෙම පළමු අදියර තවදුරටත් අදියරවලට බෙදා ඇත. **අදියර 01** යටතේ ගොඩනැගිලි අංක 06, 07, සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල , ජල පොම්පාගාරය ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සිදු කෙරේ. **අදියර 02** යටතේ පළමු අදියරේ අවසන් නොවූ ඉතිරි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කෙරේ. ත්‍රිවිධ හමුදා නිලධාරීන් 1,278 දෙනෙකු සහ ත්‍රිවිධ හමුදා නේවාසික සෙසු නිලයන් 11,377 දෙනෙකු සඳහා භෝජනාගාර සහ අනෙකුත් බාහිර අංගයන් ඇතුළු පහසුකම් සහිතව ස්ථිර වාසස්ථාන සැපයීම මෙම ව්‍යාපෘතියේ **දෙවන අදියර** යටතේ සිදු කෙරේ.

ව්‍යාපෘති ප්‍රගතිය (පළමු අදියර)	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු.මී.)
සමස්ත ප්‍රගතිය	82 %	45,019.12
2022.01.01 සිට 2022 12.31 දක්වා ප්‍රගතිය	7.65%	6,890.96

ගොඩනැගිලි අංක 6 හා 7 සහ ඊට අදාළ යටිතල පහසුකම් සඳහා වූ ඉදිකිරීම්, එනම් අදියර 01, 2019 නොවැම්බර් මස වන විට අවසන් කර යුද්ධ හමුදා මූලස්ථානය ස්ථාපනය කර ඇත. තවද, අදියර 02 යටතේ පැවති ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ගොඩනැගිල්ල වන අංක 8 ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් 2021 මැයි මස අවසන් කර එහි ආරක්ෂක අමාත්‍යාංශය තාවකාලිකව ස්ථාපනය කර ඇත.

2022 වර්ෂය අවසාන වනවිට මෙම ව්‍යාපෘතියට අදාළ රු.මිලියන 100කට වැඩි නොගෙවූ බිල්පත් පැවති අතර ඒ හේතුවෙන් ඉදිකිරීම් කටයුතු මන්දගාමී විය.කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුවන් වෙත නොගෙවූ බිල්පත් හි වටිනාකමට සමාන භාණ්ඩාගාර බැදුම්කර (Treasury Bond) නිකුත් කිරීමට කටයුතු සිදු කිරීම නිසා මේ වන විට කොන්ත්‍රාත් කටයුතු ඉදිරියට කර ගෙන යාමට හැකි වී ඇත.

(ආ) උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය

දිවයින පුරා පිහිටි ත්‍රිවිධ හමුදාවේ , පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ කලින් තෝරාගත් ස්ථාන හා සම්බන්ධ වියහැකි ක්ෂුද්‍ර තරංග සබඳතා 37ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත සුරක්ෂිත පොදු සන්නිවේදන මූලාධාරකයක් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.

2020 ජූලි 15 වන දින වන විට ස්වයං ආධාරක සන්නිවේදන කුලුණු 11 ක් විවිධ ස්ථාන 11 ක නිමැවීමේ කටයුතු අවසන් කර ඇත.



එමෙන්ම, 2020 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන 21ක ධ්වනි රෝධක විදුලි උත්පාදන යන්ත්‍ර 22 ක් ස්ථාපනය කිරීමේ කටයුතු ද නිමවා ඇත. මෙම ව්‍යාපෘතියේ මූලිකම අංගය, මයික්‍රෝවේව් ක්ෂුද්‍ර තරංග පද්ධතිය මිල දී ගැනීම හා ස්ථාපනය වන බැවින් අකුරේගොඩ දක්වා ප්‍රකාශ තන්තු ඇදීමට මයික්‍රෝ තරංග පද්ධතිය ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එසේ වුව ද, මයික්‍රෝ තරංග පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු කෙටිකාලයකට නතර කිරීම හේතුවෙන් උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය 2023 වසර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීමට මේ වන විට කටයුතු කෙරෙමින් පවතී. එමෙන්ම, මෙම ව්‍යාපෘතියේ බුස්ස සන්නිවේදන කුලුණ මේ වන විට ඩයලොග් ආසියාටා ආයතනයට අවශ්‍ය ඇන්ටනා සවි කර ගැනීම සඳහා හුවමාරු කර ඇති අතර එමඟින් රු.272,300ක මාසික ආදායමක් අමාත්‍යාංශය වෙත ලැබේ. තව ද, මෙම සන්නිවේදන කුලුණු රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන ආයතන සමඟ හුවමාරු කර ගැනීමෙන් ආදායමක් උපයා ගැනීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ක්‍රියාපටිපාටි සකස් කරමින් පවතී.

මෙම ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 71.4% ක් වන අතර සමුච්චිත මූල්‍යමය ප්‍රගතිය රු.මිලියන 656.8 කි.

(ඇ) ත්‍රිවිධ හමුදා පතොරම් ගබඩා හා වාණිජමය පුපුරණ ද්‍රව්‍ය ගබඩා සංකීර්ණය ඉදිකිරීම

2017/18 වසරවල සිට පුනානි, ගජසිංහපුර සහ අගුණුවැල්පැලැස්ස යන ස්ථානයන්හි රු.මි.1,568.6 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකින් ඉදි කෙරෙමින් පවතින යෝජිත අවි ගබඩාව මඟින් යුද්ධ හමුදාව සතු සියලු පතොරොම්/වෙඩි ද්‍රව්‍ය සුරක්ෂිතව ගබඩා කිරීමට හැකියාව ලැබෙනු ඇත. මෙහි ඉදිකිරීම් 2022 වර්ෂයේ නිම කිරීමට අපේක්ෂා කළ නමුත් නිම කිරීමට නොහැකි විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෘත්තීය සෙනින් යොදවා වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස, මේ වන විටත් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදුකරගෙන යන අතර, සීමිත ඉඩ ප්‍රමාණය මෙන්ම මහජනතාවගෙන් පැන නැගුණු විරෝධතා හා අවශ්‍යතාව මත පහත පරිදි ගබඩාහල් ඉදිකිරීම අත්හිටුවා ඇත.

ස්ථානය	ඉදිකරනු ලබන 90'X36 ප්‍රමාණයේ ගබඩා සංඛ්‍යාව		ඉදිකරනු ලබන 60 X 27 භූගත ගබඩා ප්‍රමාණය		අත්හිටුවන ලද ගබඩා ප්‍රමාණය
	ඉලක්කය	නිම කළ	ඉලක්කය	නිම කළ	
පුනානි වෙඩිද්‍රව්‍ය ගබඩා සංකීර්ණය	15	15	02	01	01 (භූගත)
ගජසිංහපුර වෙඩිද්‍රව්‍ය ගබඩා සංකීර්ණය	10	5 +2 (භූගත)	02	-	-
අඟුණුවැල්පැලැස්ස වෙඩිද්‍රව්‍ය ගබඩා සංකීර්ණය	15	7	02	8+1 (භූගත)	01 (භූගත)

2022.07.31 දින වන විට ලැබුණු ප්‍රතිපාදන හා දරන ලද වියදම් පහත පරිදි වේ.

වර්ෂය	ලැබුණු ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)
2017	300.00	124.81
2018	500.00	376.33
2019	335.00	311.88
2020	74.58	65.50
2021	400.00	278.28
2022	192.38	107.62
එකතුව	**1,801.96**	**1,264.42**

අංක **අමප/22/1821/603/032** හා **2022 නොවැම්බර් මස 29** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ව්‍යාපෘති කාල සීමාව 2024 වර්ෂය දක්වා දීර්ඝ කිරීමට හා තවදුරටත් අපේක්ෂිත වියදම වන රුපියල් මිලියන 223ක් 2023 වසර සඳහාත් රුපියල් මිලියන 289ක් 2024 වසර සඳහාත් වශයෙන් රුපියල් මිලියන 512ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීමටත් අනුමැතිය ලබා දී ඇත.

(ඇ) බුද්ධි අංශවල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම

1. ජාතික බුද්ධි ප්‍රධානී, රාජ්‍ය බුද්ධි සේවය, ත්‍රිවිධ හමුදාවල බුද්ධි අංශ යන සියල්ලෙහි සමස්ත සංවිධාන ව්‍යුහය යටතේ අනාවරණය කරගනු ලබන නොයෙකුත් තර්ජන හා තොරතුරු මත පදනම්ව ත්‍රස්තවාදය සහ වෙනත් ක්‍රියාකාරකම් වළක්වා ගැනීමෙන් ජාතික ආරක්ෂාව පවත්වා ගැනීමට බුද්ධි අංශවලට අවශ්‍ය මෙවළම් හා යාන්ත්‍රණය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.
පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍ය නිලධාරියා ගරු ජනාධිපතිතුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



සැම්බියානු යුද්ධ හමුදාවේ ශිෂ්‍ය නිලධාරියෙකු ආරක්ෂක ලේකම් වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.

○ **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් කරන ලද පුහුණු කිරීම්**

ත්‍රිවිධ හමුදාවට ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා විකාශනය වූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය (කොආවි) මේ වන විට උපාධි හා පශ්චාත් උපාධි යන දෙඅංශයෙන්ම උපාධි පිරිනමන පීඨ නවයකින් සමන්විත අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පරිණත වී ඇත. 2022 දී ද එහි කැපී පෙනෙන වර්ධනයන් දක්නට ඇත.

2022 වර්ෂයේ Webometrics ශ්‍රේණිගත කිරීම අනුව, කොආවි ශ්‍රී ලංකාවේ 12 වැනි හොඳම විශ්ව විද්‍යාලය ලෙස ශ්‍රේණිගත කර ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව ස්ථාන දෙකක වර්ධනයකි. අසමානතාවය අවම කිරීමේ කාණ්ඩයේ ශ්‍රී ලංකාවේ හොඳම විශ්ව විද්‍යාලය ලෙස, අධ්‍යාපනයේ ගුණාත්මක කාණ්ඩයේ ශ්‍රී ලංකාවේ 2 වන හොඳම විශ්ව විද්‍යාලය ලෙස සහ සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ 4 වන හොඳම විශ්වවිද්‍යාලය ලෙස කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය Time Higher Education Impact ශ්‍රේණිගත කිරීම විසින් ශ්‍රේණිගත කරන ලදී.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නීති පීඨය 2022 වසරේ 'NICA Team Law School' ශ්‍රේණිගත කිරීම යටතේ ශ්‍රී ලංකාවේ 2 වන ස්ථානයටත්, ආසියාවේ 25 වන ස්ථානයටත්, ලෝකයේ 83 වන ස්ථානයටත් පත් වී ඇත. 2022 අගෝස්තු 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත ජනාධිපති වර්ණ සහ විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය කරන ලදී. ඒ දශක හතරකට වැඩි කාලයක් පුරා ජාතික ආරක්ෂාව සහතික කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු කරන ලද සුවිශේෂී දායකත්වය හේතුවෙනි.

තාක්ෂණ පීඨයෙහි සහ අපරාධ යුක්ති පීඨයෙහි අධ්‍යයන කටයුතු නිල වශයෙන් ආරම්භ කරන ලදී. 2020 වර්ෂය සඳහා වූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය මගින් අනුකූලතාව සඳහා වන සහතිකය පිරිනමන ලද අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව

විද්‍යාලයෙහි මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබන ලදී.

- **කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරී හා පෞද්ගලික විදෙස් නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම**

	පෞද්ගලික නිවාඩු	රාජකාරී නිවාඩු	අධ්‍යනය නිවාඩු	**එකතුව**
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	29	30	19	**78**

- **කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වීසා ඉල්ලුම් කිරීම**

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපාධි හදාරනු ලබන විදේශීය සිසුන් 125 සඳහා 2022.01.01 දින සිට 2022.**12.31** දින දක්වා වීසා ඉල්ලුම් කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.

❖ **2022 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම**

2022 වර්ෂයේදී කැඩෙට් නිළධාරීන් 244ක් සහ දිවා විද්‍යාර්ථයින් 1,032ක් දේශීය හා විදේශීය බාණ්ඩයන් යටතේ බඳවාගෙන ඇත.

❖ **විශ්වවිද්‍යාලය මඟින් බිහිකරන ලද උපාධිධාරීන් සංඛ්‍යාව**

2022 නොවැම්බර් 10 හා 11 දින පැවැති උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධිධාරීන් 1,619 දෙනෙකු වෙත උපාධි ප්‍රදානය කර ඇත. 2021 වර්ෂයේදී මෙම සංඛ්‍යාව 1,414කි.

❖ **2022 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින්** ප්‍රකාශනයන් 384ක් ඉදිරිපත් කර ඇත.

○ **මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනය විසින් කරන ලද පුහුණු කිරීම්**

මෙට්‍රොපොලිටන් කැම්පස්, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යටතේ පවතින ශ්‍රී ලංකාවේ පුහුණු ආයතනයක් වන අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සැලසුම් කර ඇත. එය මෙරටේ වෙනත් අධ්‍යයන ආයතනයන්හි පහසුකම් අභිබවා යමින්, ශ්‍රවණාගාර, සම්මන්ත්‍රණ ශාලා, දේශන ශාලා, නවීන පරිගණක විද්‍යාගාර මෙන්ම මාර්ගස්ථ සහ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයකින් ද සමන්විත වේ.

මෙට්‍රොපොලිටන් කැම්පස් මූල්‍ය කළමනාකරණය, වාණිජ නිපුණතා සහ පාලනය, මානව ශාස්ත්‍ර සහ කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් කළමනාකරණය, සෞඛ්‍ය හා ආරක්ෂාව සහ විද්‍යාව හා තාක්ෂණය යනාදී විෂයයන් යටතේ පුහුණු වැඩසටහන් පවත්වාගෙන යනු ලබන අතර පුහුණු වීම් කටයුතු සිදු කර උපයා ගන්නා ආදායමෙන් පමණක් සියලුම වියදම් පියවා ගැනීමට කටයුතු කරයි.

ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

විස්තරය	**වැඩසටහන් ගත වැඩසටහන්**	**පුහුණු උපදේශක වැඩසටහන්**	**එකතුව**
පැවැත්වූ සම්පූර්ණ වැඩසටහන් ගණන	77	60	137
සියලුම ආයතන වලින් පුහුණුව ලැබූ සහභාගි වුවන් ගණන	1,976	5,080	7,056

වියදම් විස්තරය

විස්තරය	මුදල (රු.)
අලුත්වැඩියා සහ නඩත්තු වියදම්	12,058,662
කාර්ය මණ්ඩල වියදම්	14,329,281
උපයෝගිතා වියදම්	10,045,969
පරිපාලන හා ආයතන වියදම්	19,758,078
අලෙවිකරණ ප්‍රවර්ධන වියදම්	37,053
එකතුව	**56,229,043**

- **ජාතික ශිෂ්‍යභට බලකායේ පුහුණු සහ විශේෂ වැඩසටහන්**

දිනය	වැඩසටහන	ස්ථානය
2022.10.14	නිල ලාංඡන පැලඳවීමේ උත්සවය - අවි රහිත වීථි පෙළ	ගම් / සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය (7 ජාශිබ - ගම්පහ)
2022.11.01	කඳවුරු ආරක්ෂක මුරය සහ අවි සහිත වීථිපෙළ පිරිනැමීම	ජාශීබ මූලස්ථානය - පාමංකඩ
2022.11.02	අවි සහිත වීථිපෙළ සෑදීමේ සම්මාන පෙළපාලිය (125 වන සංවත්සරය)	මාර/ සාන්ත සර්වේශස් විද්‍යාලය 16 ජාශිබ - මාතර
2022.11.04	අවි රහිත වීථිපෙල සෑදීමේ සම්මාන පෙළපාලිය (ශිෂ්‍යය පාර්මේන්තුවේ මංගල සභා වාර උත්සවය) 8 ජාශිබ - රත්නපුර	ර/ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලය 8 ජාශිබ - රත්නපුර
2022.11.06	අවි සහිත විථිපෙළ සෑදීමේ සම්මාන පෙළපාලිය	2 ජාශිබ - මහනුවර
2022.11.11	අවි සහිත විථිපෙළ සෑදීමේ සම්මාන පෙළපාලිය (ගුවන් හමුදාධිපති පිළි ගැනීම)	ම/ධර්මරාජ විද්‍යාලය - 2 ජාශිබ මහනුවර
2022.11.11	අවි සහිත විථිපෙළ සෑදීමේ සම්මාන මුරය - බලඇණි පරිශ්‍රය 13 ජාශිබ - මාතලේ	බලඇණි පරිශ්‍රය 13 ජාශිබ - මාතලේ
2022.11.17	අවි සහිත සම්මාන මුර පෙළපාලිය - (ශිෂ්‍යභට කණ්ඩායම හා තූර්ය වාදක කණ්ඩායමට උපහාර පිරිනැමීමේ උත්සවය)	කු/මලියදේව විද්‍යාලය - 4 ජාශිබ - කුරුණෑගල
2022.11.23 සිට 30 දක්වා	ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට උසස් පාඨමාලාව	ජාශීබ පූම රංටැඹේ

2022.11.24	අවි සහිත විථිපෙළ සැදීමේ සම්මාන පෙළපාලිය (විද්‍යාලයේ නිර්මාණය කරන ලද රණවිරු ස්මාරකය විවෘත කිරීම)	ගා/ශාන්ත ඇලුවිසියස් විද්‍යාලය 1 ජාශිබ - ගාල්ල
2022.12.01	අවි සහිත සම්මාන මුර පෙළපාලිය -පනාමුර ශ්‍රී සුමංගල විද්‍යාලය (විශ්‍රාම යාම වෙනුවෙන් පැවැත්වෙන උත්සවය) 8 ජාශිබ - රත්නපුර	පනාමුර ශ්‍රී සුමංගල විද්‍යාල - 8 ජාශිබ - රත්නපුර
2022.12.01	අවි සහිත වීථි පෙළපාලිය (වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවය)	මඩකලපුව මහජන විද්‍යාලය 38 ජාශිබ - මඩකලපුව
2022.12.02	අවි සහිත විථිපෙළ සැදීමේ සම්මාන පෙළපාලිය (වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවය)	නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලය 20 ජාශිබ - යාපනය
2022.12.06	අවි සහිත විථිපෙළ සම්මාන පෙළපාලිය (8 වන බලඇණියට අයත් සියලු පාසල් සඳහා ශිෂ්‍යභට බලපත්‍ර ලබාදීමේ උත්සවය)	සබරගමු පළාත් මූලස්ථානය 8 ජාශිබ-රත්නපුර
2022.12.08 සිට 12 දක්වා	පුහුණුවීම්භාර නිලධාරී / විධායක අධිකාරී සහ නිකාම උපදේශක සංස්කරණ පාඨමාලාව	ජාශිබ පුම රංටැඹේ
2022.12.09	අවි සහිත විථිපෙළ (ශිෂ්‍යනායක නිල ලාංඡන පැළඳවීම)	මප/ග/ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය,13 ජාශිබ - මාතලේ
2022.12.13 සිට 22 දක්වා	නිලධාරී පුහුණු කඳවුර සහ නිල උසස් කිරීමේ පරීක්ෂණය	ජාශිබ පුම රංටැඹේ
2022.12.21	අවි සහිත විථිපෙළ (විදුහල්පති විශ්‍රාම යාම)	කොළඹ අශෝක විද්‍යාලය 3 ජාශිබ - කොළඹ
2022.12.23	ආරක්ෂක ලේකම්ගේ මූල ජාශිබ සංචාරය - කදවුරු ආරක්ෂක මුරයක් සහ අවි සහිත වීථිපෙළ	ජාශිබ මූලස්ථානය
2022.12.27	ප්‍රභූ සම්මාන මුර පෙළපාලිය පැවැත්වීම (ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම නිමිතෙන් පැවති පෙළපාලිය) 7 ජාශිබ - ගම්පහ	7 වන බලඇණි මූලස්ථානය 7 ජාශිබ - ගම්පහ
2022.12.28	අවි සහිත විථිපෙළ - (ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම)	6 වන බලඇණි මූලස්ථානය 6 ජාශිබ - බදුල්ල
2022.12.31	අවිසහිත විථිපෙළ - (ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම නිමිත්තෙන් පැවති පෙළපාලිය)	9 ජාශිබ මූලස්ථානය 9 ජාශිබ - කෑගල්ල

6. ආරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය

- **ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය**

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීමයි. එම කටයුතු අතර සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සඳහා සහය වීම, සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම, සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය සැලසුම් සකස් කරන සඳහා පහසුකම් සැලැසවීම, සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයට අදාළ කර්තව්‍යයන් සම්බන්ධයෙන් වූ කාරණා සම්බන්ධීකරණය කිරීම, සන්නද්ධ හමුදාවල ඉදිරි ප්‍රතිවාදීන්ගේ ශක්‍යතාව නිශ්චය කිරීම සඳහා වූ තක්සේරු කිරීම් භාරගැනීම, සන්නද්ධ හමුදා මෙහෙයුම්වල සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීම සහ සන්නද්ධ හමුදාවන් අතරේ ඒවා ක්‍රියාත්මක කිරීම, සන්නද්ධ හමුදාවලට අදාළ අභ්‍යූ සැලසුම් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම, ක්‍රමෝපාය සැලසුම්වලට අදාළව මුදල් වර්ෂයක් සඳහා සන්නද්ධ හමුදාවල වැඩසටහන්, නිර්දේශ හා අයවැය යෝජනා පිළිගත් ප්‍රමුඛ කරුණුවලට කොතෙක් දුරට අනුකූල වන්නේද යන්න පිළිබඳව උපදෙස් දීම, මිනිස් බලය හා උපකරණ වලට අදාළව, සන්නද්ධ හමුදාවල මහා පරිමාණ වැඩසටහන් හා ප්‍රතිපත්ති කොතෙක්දුරට ක්‍රමෝපාය සැලසුම්වලට අනුකූල වන්නේද යන්න පිළිබඳව උපදෙස් දීම, යෝජිත ආරක්ෂක ප්‍රසම්පාදන සැලසුම්වලට එරෙහිව යුධමය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ ඒ අනුව අමාත්‍යවරයාට උපදෙස් දීම, සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ පුහුණුවීම් සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම, සන්නද්ධ හමුදා විසින් සාමසාධක මෙහෙයුම් කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නියම කරනු ලබන හෝ අවශ්‍ය කරන වෙනත් කටයුතු සිදු කිරීම. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ ප්‍රධාන වගකීම් වේ.

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය මඟින් පහත සඳහන් අවස්ථාවන්හි දී ආරක්ෂාව ලබාදීම සිදු කර ඇත.

- පාර්ලිමේන්තු සැසිවාර 61 ක් සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2022.01.12 දින හංගේරියානු විදේශ සබඳතා අමාත්‍ය HE Peter Szijjarto මහතා සංචාරය නිමාවී දිවයිනෙන් පිටව යාම වෙනුවෙන් සහයක සේවා කණ්ඩායම් යුද්ධ හමුදාව සහ ගුවන් හමුදාව වෙතින් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2022.01.26 දින මොණරාගල දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු කැබිලිත්ත රක්ෂිතයේ සිදුවන අනවසර ක්‍රියාකාරකම් මැඩ පවත්වා රක්ෂිතය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය සහය යුද්ධ හමුදාව වෙතින් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2022.02.04 දිනට යෙදී තිබුණු 74 වන නිදහස් සැමරුම් උත්සවය සඳහා බස්නාහිර පළාතේ සියලුම පොලිස් ස්ථාන මට්ටමින් සිදුකළ විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙල සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2022.02.05 දින ආරම්භ කළ අධ්‍යාපන පොදු සහතික (උ/පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර අඩංගු මලු හා විභාගය අවසානයේ උත්තර පත්‍ර ප්‍රවාහනය කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට අවැසි කටයුතු සම්පාදනය කරන ලදී.
- 2022.02.21 දින වවුනියාව දිස්ත්‍රික්කයේ නයිගමුව රක්ෂිතයේ පිහිටි වඩුන්නාගල පුරාවිද්‍යා ස්මාරකය සහිත භූමියේ අනවසර ක්‍රියාකාරකම් සිදුවන බැවින් එය ආරක්ෂාකර ගැනීම සඳහා යුද්ධ හමුදා ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2022.03.21 දින ශ්‍රී ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව මඟින් සැපයුම් ලබාදෙනු ලබන ඉන්ධන පිරවුම්හල්හි ආරක්ෂාව සඳහා අවි රහිත හට පිරිස් දිවයින පුරා පිහිටා ඇති සෑම Ceypetco පිරවුම්හලක්ම ආවරණය වන පරිදි යොදවන ලෙස ත්‍රිවිධ හමුදා මූලස්ථාන වෙත උපදෙස් ලබා දෙන ලදී.

➢ 2022.03.30 දින මුලතිව් දිස්ත්‍රික්කයේ විමර්ෂණ කටයුතු වලට අදාළව සාක්ෂි සටහන් කර ගැනීම සඳහා ජනාධිපති කොමිෂන් සභාවේ විනිසුරුවරුන් සහ කොමසාරිස්වරුන් 2022.04.09 වන දින කොළඹ සිට මුලතිව් දක්වා පැමිණ 2022.04.09 සහ 10 දිනයන්හි මුලතිව් ඕෂන් පාර්ක් රිසෝට් හෝටලයේ නවාතැන් ගෙන මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සාක්ෂි සටහන් කර ගැනීමෙන් පසු 2022.04.11 දින කොළඹ දක්වා පැමිණි බැවින් ඒ සඳහා යුද්ධ හමුදාව ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.04.09 දින දිවයින තුළ පැවති මහජන ඒකරාශීවීම් හා විරෝධතාවයන් හමුවේ අරලියගහ මන්දිරයේ ආරක්ෂාව සඳහා නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.04.12 දින තංගල්ල කාල්ටන් මන්දිරයේ ආරක්ෂාව සඳහා ගුවන් හමුදා සහ නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.04.17 දින පාස්කු ඉරුදිනට අදාළව දේවස්ථානවල ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.05.09 දින කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශයන්හි ඇතැම් පිරිස් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙමින් උද්ඝෝෂණ සිදු කරමින් දේපළවලට අලාභහානි සිදුකිරීම් හේතුවෙන් එය වළක්වාලීම සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු කරන ලදී.

➢ 2022.05.19 සිට 2022.07.20 යන දිනවල උද්ඝෝෂණ රැල්ලක් ඇතිවිය හැකි බවට තොරතුරු අනාවරණය වූ බැවින්, එම විරෝධතා සංවිධානය කරනු ලබන පුද්ගල පෙළඹවීම මත නොයෙකුත් කඩාකප්පල්කාරී ක්‍රියා ඇතිවිය හැකි බැවින් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා යුද්ධ හමුදා භට පිරිස් යෙදවීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.06.11 දින 5 වන විධායක ජනාධිපති හා හිටපු අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා තංගල්ල ප්‍රදේශයේ සිදුකළ සංචාරයක් හේතුවෙන් යුද්ධ හමුදා අනු බඳ්ධ 03 ක් ස්ථානගත කර තැබීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.07.08 දින 5 වන විධායක ජනාධිපති සහ හිටපු අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදා භට පිරිස් යෙදවීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.07.08 දින රටේ පවතින අර්බුදය හේතුවෙන් ජාතික රූපවාහිණියේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.07.09 දින අරලියගහ මන්දිරය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා පස්වන පටුමග පෞද්ගලික නිවස සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.07.20 දින මහනුවර ඓතිහාසික ඇසළ පෙරහැරෙහි ආරක්ෂක රාජකාරී වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව වෙතින් සහායක සේවා කණ්ඩායම් 2022.08.02 වන දින සිට 2022.08.12 වන දින දක්වා ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.08.04 දින මහනුවර ඓතිහාසික ඇසළ පෙරහැර අවසන් කිරීමේ රාජ්‍ය උත්සවය සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ පැමිණීම වෙනුවෙන් ආරක්ෂක රාජකාරී සඳහා යුද්ධ හමුදා භට පිරිස් යෙදවීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.08.19 දින රාගම පොලිස් වසමේ තේවත්ත ජාතික බැසිලිකා දේවස්ථානයේ පැවැත්වෙන වාර්ෂික රෝගීන් සුවපත් කිරීමේ මංගල්‍ය වෙනුවෙන් නාවික හා ගුවන් හමුදාව වෙතින් සහාය කණ්ඩායම් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.08.23 දින බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන ඇසළ මහා පෙරහැර වෙනුවෙන් නාවික සහ ගුවන් හමුදාව වෙතින් සහාය සේවා කණ්ඩායම් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.09.05 දින සිට 2022.09.14 දින දක්වා Race Course Stadium හි පැවැත්වූ දකුණු ආසියාතික තරඟාවලියේ ආසියාතික රටවලින් සහභාගීවන අයවලුන් සඳහා ආරක්ෂාව ලබා දෙන ලෙස යුද්ධ හමුදාධිපති දැනුවත් කරන ලදී.

➢ 2022.09.14 දින ජාතික ආරක්ෂක විද්‍යායතනයේ පාඨමාලාව හදාරන ලද විද්‍යාර්ථීන්ගේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වූ බැවින් ඒ සඳහා ගුවන් හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.09.19 දින චීන තානාපති කාර්යාලයේ ආරක්ෂක නියෝජිත පිරිසක් දිවයිනේ ප්‍රදේශ කිහිපයක සංචාරය කළ බැවින් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.10.20 ගල්කිස්ස කොටියාසයේ මොරටුමුල්ල පොලිස් වසම වෙත ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පැමිණීම වෙනුවෙන් නාවික හා ගුවන් හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබූ International Water Conference 2022 සම්මන්ත්‍රණය 2022.12.14 සිට 16 දක්වා පැවැති බැවින් 2022.10.27 වන දින එහි කේෂ්ත්‍ර පරික්ෂාව සහභාගී වූ විදේශීය තානාතිපතිවරුන් 40 කු වෙනුවෙන් ආරක්ෂක රාජකාරි සඳහා යුද්ධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.11.09 වන දින මීගමුව පොලිස් වසමේ ජෙට්වින් බිලූ හෝටලයේ පැවැත්වෙන උත්සවයක් සඳහා අග්‍රාමාත්‍යතුමන් පැමිණීම වෙනුවෙන් එහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.11.14 දින සිට 2022.11.25 දින දක්වා පාර්ලිමේන්තු අයවැය විවාදය පැවැති බැවින් එම සැසිවාරයන් පැවැත්වෙන කාලය තුළ ආරක්ෂාව තහවුරු කිරීමට ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2022.11.19 වන දින වවුනියාව පොලිස් කොටියාසයේ සංචාරය කළ බැවින් එම ස්ථාන හා ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීමට ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022 දෙසැම්බර් මස 18 වන දින පැවැති 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ආරක්ෂක කටයුතු සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ ශ්‍රී ලංකා සංචාරයක් සඳහා එක්සත් රාජධානියේ හිටපු අග්‍රාමාත්‍ය ඩේවිඩ් කැමරෝන් සහ පවුලේ සාමාජිකයින් 2022.12.19 දින සිට 2023.01.02 වන දින දක්වා මෙරට සංචාරය කළ බැවින් එහි ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ 2022.12.24 දින නත්තල් උත්සවය හා කතෝලික දේවස්ථානයන්හි දේව මෙහෙයන්හි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

➢ මාලදිවයින් ජනාධිපති ගරු ඉබ්‍රාහිම් මොහොමඩ් ස්ලොනි මහතා 2022.12.29 වන දින දිවයිනට පැමිණීම සහ 2023.01.02 දින පිටව යෑම හේතුවෙන් ඒ මහතාගේ හා පැමිණෙන සෙසු ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නාවික හා ගුවන් හමුදාවේ සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

- **හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය**

හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය විසින් ආරක්ෂක අමාත්‍යතුමා හා ආරක්ෂක ලේකම්තුමා විසින් ගනු ලබන තීන්දු තීරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම, සම්බන්ධීකරණය කිරීම සහ රාජ්‍ය හා අනෙකුත් ආයතන සමගින් සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

එම කටයුතු අතර ත්‍රිවිධ හමුදාව සම්බන්ධ පරිපාලන ගැටළු නිරාකරණය කිරීම, ආරක්ෂක අමාත්‍යාංශයෙහි ආරක්ෂාව සම්බන්ධ කටයුතු කිරීම, රටෙහි ඇතිවන විවිධ තත්ත්වයන් යටතේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරුන් සහ පොලිස්පති වෙත ආරක්ෂක ලේකම්තුමා විසින් ලබාදෙන උපදෙස් ලබා දීම, විදේශීය තානාපති කාර්යාලවල සේවයේ නියුතු ආරක්ෂක උපදේශකයින් හට වගකීම් පැවරීම, ශ්‍රී ලංකා හමුදාවන්ගේ දියුණුව සඳහා අවැසි තොරතුරු යාවත්කාලීන කිරීමට විස්තර ලබා ගැනීමට හා අවශ්‍ය අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු සඳහා සහය ලබා ගැනීම, විවිධ අවස්ථා සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම, රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ශ්‍රමදාන වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සහභාගි කරවීම, විදේශීය දූත පිරිස්/ විදේශීය හමුදා දූත පිරිස් වල සංචාර සම්බන්ධීකරණය කිරීම සහ පිළියෙල කරදීම, අතිගරු ජනාධිපතිතුමා සහභාගිවන රාජ්‍ය උත්සව සඳහා අධිසභායකයින් ලබාදීම, මෙරටට ආනයනය කරනු ලබන ගුවන් යානා සඳහා ආරක්ෂක නිෂ්කාශනයන් ලබාදීම, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් ගුවන් යානා/ අමතර කොටස් අළුත්වැඩියා කටයුතු සඳහා මෙරටින් ගෙනයාමට සහ නැවත ගෙන්වීම සඳහා රේගු නිෂ්කාශනයන් ලබාගැනීමට අවැසි ආරක්ෂක නිෂ්කාශනයන් ලබාදීම, ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන සහ ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධතාවයෙන් ආපදා කළමණාකරණය සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම හා ආරක්ෂක ලේකම්තුමා විසින් පවරනු ලබන අමතර රාජකාරීන් ඉටුකිරීම යනාදිය වේ.

- **රාජතාන්ත්‍රික විදේශීය ප්‍රභූවරුන් ශ්‍රී ලංකා සංචාරයන් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහාය ලබාදීම**





- විදේශීය ප්‍රභූවරුන්ගේ සංචාර
  - ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ක්ලෙයාර් ඔ'නීල් මැතිනියගේ ශ්‍රී ලංකා සංචාරය - 2022.06.19 සිට 22 දක්වා
- විදේශීය ත්‍රිවිධ හමුදා උසස් නිලධාරීන්ගේ සංචාර
  - විදේශ ආරක්ෂක උපදේශකවරුන්ගේ මෙතෙර සංචාරය - 2022.03.15 - 19 දක්වා
  - ඇමෙරිකානු නාවික අපරාධ පරීක්ෂණ සේවයේ (NCIS) නිලධාරීන්ගේ ශ්‍රී ලංකා සංචාරය - 2022.03.05 - 15 දක්වා
- විදේශ අධ්‍යන චාරිකා
  - බංගලාදේශ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2022.01.06
  - නේපාල හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2022.01.19 - 25 දක්වා
  - 51 වෙනි පාකිස්තානු නාවික මාණ්ඩලික පාඨමාලාවේ එතෙර අධ්‍යයන චාරිකාව - 2022.03.05 - 10 දක්වා
  - අබුජා - නයිජීරියා ජාතික ආරක්ෂක විද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2022.05.29 - 2022.06.04 දින දක්වා
  - පාකිස්තානු ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2022.06.06 - 11 දක්වා
  - බංගලාදේශ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2022.10.02 - 06 දක්වා

2.1.4 මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම

❖ **ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**

- සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ඒකක හා බුද්ධි ඛණ්ඩ වෙතින් නීති විරෝධී හා මත්ද්‍රව්‍ය හා මත්පැන් සම්බන්ධයෙන් වැටලීම් සිදුකිරීම.
- අනෙකුත් ආරක්ෂක අංශයන් සමඟ වැටලීම් සිදුකරමින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු වල නියැලීම.
- මත්ද්‍රව්‍ය හුවමාරු වන ස්ථාන හා පුද්ගලයින් ආවේක්ෂණයට ලක් කිරීම හා අත්අඩංගුවට ගැනීම.
- යුද්ධ හමුදා රෝහල (කොළඹ) වෙතින් මත්ද්‍රව්‍ය උවදුරෙන් යුද්ධ හමුදා සාමාජිකයන් ආරක්ෂා කරගැනීම සඳහා දේශන වර්ෂය තුළ පවත්වා ඇත.

❖ **ශ්‍රී ලංකා නාවික හමුදාව**

- ශ්‍රී ලංකා නාවික හමුදා බුද්ධි අංශය මගින් මුහුදු මාර්ගය හරහා මෙරටට නීති විරෝධීව ඇතුළු වන මත්ද්‍රව්‍ය ජාවාරම් වැළැක්වීම සඳහා බුද්ධි ආවේක්ෂණ කටයුතු පුළුල් කිරීමට සහ බුද්ධි අංශ මෙහෙයුම් කාර්යක්ෂමව සිදු කිරීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාව වටා ඇති ධීවර වරායන්හි පිහිටුවා ඇති ධීවර යාත්‍රා නිරීක්ෂණ ස්ථානවලින් ලබා ගන්නා තොරතුරු සහ නාවික හමුදා මූලස්ථානයේ ඇති ධීවර යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) මගින් බහුදින ධීවර යාත්‍රා අධීක්ෂණය කරනු ලබන අතර, ධීවර දෙපාර්තමේන්තුවේ දත්ත විශ්ලේෂණය සහ නාවික හමුදා බුද්ධි අංශයේ බුද්ධි තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව සැක කටයුතු යාත්‍රා සුදුසු පරිදි පරීක්ෂාවට ලක් කර නීති විරෝධී ක්‍රියාවල නියැලී ඇති යාත්‍රා අත්අඩංගුවට ගැනීම සිදු කිරීම.
- නෞකා මුර සංචාරයන් ප්‍රමාණයන් වැඩි කිරීම හා ශ්‍රී ලංකාවට ඇත මුහුදේදී පවා මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන දේශීය/ විදේශීය යාත්‍රා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමට සහ 2022 වසර තුළදී පහත සඳහන් පරිදි මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමට පියවර ගෙන ඇත.

මත්ද්‍රව්‍ය වර්ගය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය
කේරල ගංජා	කි.ග්‍රෑ 5,731.155
ගංජා	කි.ග්‍රෑ 25.285
ගංජා පැල	ගංජා පැල 41658
අයිස්	කි.ග්‍රෑ 148.147
අශීෂ්	කි.ග්‍රෑ 1.105
හෙරොයින්	කි.ග්‍රෑ 1,363.503
කුෂ්	කි.ග්‍රෑ 0.0003
මෝදක	1,725
මත්පෙති	665,033
ගෝඩා	ලීටර් 210
කසිප්පු	ලීටර් 162.501

- 2022 වර්ෂය තුළ නාවික පුද්ගලයින් 8,286 දැනුවත් කරමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 130ක ප්‍රමාණයක් පැවැත්වීමට කටයුතු සිදු කර ඇත.

❖ **ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

- ශ්‍රී ලංකා ගුවන් හමුදා වෛද්‍ය අංශය මඟින් කඳවුරු තුළ මාසිකව අහඹු ලෙස හඳුනාගන්නා ගුවන් හමුදා සාමාජිකයින් ගෙන් අන්තරාදායක මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව පරීක්ෂණ සිදු කරනු ලැබේ. තවද, ගුවන් හමුදාවට නවක සාමාජිකයින් බඳවා ගැනීමේදී සහභාගී වන සියලුම පුද්ගලයින්ගේද අන්තරාදායක මත්ද්‍රව්‍ය සම්බන්ධව පරීක්ෂණ සිදු කර බඳවාගැනීම් සිදු කිරීම මඟින් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට කටයුතු සළසා ඇත.

- වෛද්‍ය අංශය මඟින් සාමාන්‍ය ජනතාව වෙනුවෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අනුමැතිය යටතේ කඳවුරු ආශ්‍රිතව සිදුකරනු ලබන ප්‍රජා සත්කාරක වැඩසටහන් වලදී ගුවන් හමුදා වෛද්‍ය අංශයන් මඟින් වෛද්‍ය සායන පවත්වා සාමාන්‍ය ජනතාවට ප්‍රතිකාර සඳහා අවශ්‍ය කටයුතු සලසා දීම සිදුකරන අතර එම අවස්ථාවන් වලදී සහභාගි වන සාමාන්‍ය ජනතාව මත්ද්‍රව්‍ය උවදුරෙන් වැළකීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ගුවන් හමුදා මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් හරහා සිදුකරනු ලබයි.

- 2022 වර්ෂයේ ගුවන් බුද්ධි අධ්‍යක්ෂකයේ තොරතුරු මත මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පහත පරිදි වේ.

මත්ද්‍රව්‍ය වර්ගය	මත්ද්‍රව්‍ය ප්‍රමාණයන්	අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව
හෙරොයින්	131.977 g	76
අයිස්	583.57 g	32
මත්පෙති	62,335	12
විදේශිය හා දේශිය මත්පැන්	1,105.75 Ltrs	11
නීති විරෝධී මත්පැන් (කසිප්පු/ස්ප්‍රිතු/ගෝඩා)	5,753.155 Ltrs	38
නීති විරෝධී දුම් වැටි (සිගරට්)	9,565	08
නීති විරෝධී මත්ගුලි	1,831	07
මාවා	2.24 kg	02
ගංජා පැළ	5,005	05
අත්අඩංගුවට ගත් මුළු පුද්ගලයින් ගණන		**248**

❖ **ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**

2022 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා සිදු කළ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පහත පරිදිවේ.

මත්ද්‍රව්‍ය වර්ගය	මත්ද්‍රව්‍ය ප්‍රමාණයන්
හෙරෝයින්	173g 403mg
මත්පෙති	1300 NOS
අයිස්	14.110 g
කේරළ ගංජා	104g 660mg

2.1.5 ආපදා කළමනාකරණයට සහය දැක්වීම

❖ **නායයෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයතනික වගකීම් හා කාර්යභාරයන් සහ ජනතාවගේ අයිතීන් පිළිබඳ අත්පොත සැකසීම.

  මෙහිදී ආයතන 52කට අදාළ අණපනත් සහ නීත්‍යානුකූල ලියවිලි පරිශීලනයෙන් කෙටුම්පත් කරන ලද අත්පොත සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ලබා ගැනීම පිණිස ආයතන 72ක සහභාගිත්වයෙන් වැඩමුළුවක් පවත්වන ලදී. සංශෝධිත කෙටුම්පත අදාළ ආයතන වලට යොමු කොට එකඟතාවය ලබා ගැනීම සිදු කරමින් පවතී.
- පාසල් විෂය මාලාවේ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළට ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අනුගත කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සිදු කිරීම.
- Desinventar දත්ත ගබඩාව

  මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.
- riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web portal)

  භූ අවකාශීය දත්ත (Geospatial Data) මෙම වෙබ්අඩවියට ඇතුළත් කිරීම සහ පවත්වාගෙන යාම.
- ආපදා තත්ත්වයන් විශ්ලේෂණය කිරීමේ සමාලෝචන වැඩසටහන පැවැත්වීම.
- ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 පිළියෙල කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය.

ii. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

- **නායයෑම් විශේෂ විමර්ශන සිදු කිරීම**

  නායයෑමක් හෝ බෑවුම් අස්ථාවර වීමක දී විශේෂ අධ්‍යනයක් සිදු කර වාසස්ථාන, යටිතල පහසුකම්, වගා බිම්, ජීවිත හා දේපළවලට තවදුරටත් සිදුවන හානිය වැළැක්වීම සඳහා කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා රාජ්‍ය ආයතන වෙත වාර්තා කරනු ලැබේ. 2022 වර්ෂයේ දී රු. මිලියන 70ක් වැය කරමින් එවැනි වාර්තා හා නිර්දේශ 4,600ක් පමණ නිකුත් කර ඇත.

- **පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීම**

  වාර්ෂික පර්යේෂණ ප්‍රදානය ලෙස 2022 දී මිලියන 10ක් වෙන් කරන ලදී. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පාර්ශවකාර ආයතනවල හා ඉදිකිරීම් හා වෙනත් කර්මාන්තවල පර්යේෂණ අවශ්‍යතා අධ්‍යයනය කර පර්යේෂණ වැඩසටහන සැලසුම් කිරීම සිදු කරයි. 2022 වර්ෂය තුළ පර්යේෂණ ව්‍යාපෘති 15ක් සිදු කළ අතර ඉන් පර්යේෂණ ව්‍යාපෘති 06ක් පසුගිය වසරේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

- **නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා ධාරිතාව වැඩි කිරීම**

  ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය නායයෑමේ පූර්ව අනතුරු ඇඟවීම් ඵලදායී ලෙස නිකුත් කිරීම සඳහා නායයෑමේ අවදානම් සහිත ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය වැසි මාපක 330කින් සමන්විත ජාලයක් පවත්වාගෙන යයි. 2022 දී පූර්ව අනතුරු ඇඟවීම් 99ක් නිකුත් කර ඇති අතර පද්ධතියේ අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 10ක් වැයකර ඇත.

❖ **අදාළ විෂයන් සහ විෂය ක්ෂේත්‍රවල ආපදා අවදානම් තක්සේරුවේ තාක්ෂණික විශිෂ්ටත්වය ළඟා කර ගැනීම**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම
- දැනුම වැඩිදියුණු කිරීම තුළින් ආපදාවලට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීමේ UNDP ව්‍යාපෘතිය - වාරි අංශය (මෙම ව්‍යාපෘතිය වාරි අංශය සඳහා ක්‍රියාත්මක කෙරෙන අතර අදාළ ආයතන දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.)

ii. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

- **අවධානම් තක්සේරු කිරීම සහ සංවර්ධන සැලසුම්**

බැවුම් සහිත ඉඩම් අනිසි ලෙස භාවිත කිරීම සහ අක්‍රමවත් මානව ක්‍රියා හේතුවෙන් ඇති වන නායයෑම්වල බලපෑම් අවම කිරීම පෙරදැරිව, දිවයිනේ හඳුනාගත් නායයෑම් අවදානම් දිස්ත්‍රික්ක 13ක කවර හෝ ඉදිකිරීම්/ සංවර්ධන කටයුත්තකට ප්‍රථම නායයෑම් අවදානම් තක්සේරු වාර්තාව (LRAR) අනිවාර්ය කිරීම 2011 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මේ වන විට සංවර්ධන කටයුතු සඳහා නිර්දේශ සහිත එවැනි වාර්තා 100,000කට අධික ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර ඉන් වාර්තා 4,200ක් 2022 වර්ෂයේ දී නිකුත් කර ඇත.

ව්‍යාපෘති විස්තරය	**2022** වාර්ෂික ප්‍රතිපාදන	ප්‍රගතිය/ ඉලක්කය	මූල්‍ය	භෞතික
නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) නිකුත් කිරීම	35.0	ඉලක්කය	35.0	100%
		ප්‍රගතිය	35.0	100%

❖ **ආපදා අවදානම අවමකරණය (Disaster Risk Reducation) සහ ආපදා ප්‍රතිවිරෝධී සංවර්ධන තාක්ෂණය සහ නවෝත්පාදනය තුළ පර්යේෂණ හා සංවර්ධනයේ විශිෂ්ටත්වය ගොඩනැගීම**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙමඟින් සිදුකරනු ලබයි. (මේ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන 75) වලින් රු. මිලියන 60ක ප්‍රමාණයක් 2021 වර්ෂයට අදාළ අතැති බිල්පත් ගෙවීම සඳහා සහ අවිච්ඡේද වූ ව්‍යාපෘති දෙකක් සඳහා ගෙවන ලදී.)

- ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) සහය ඇතිව, කැළණි ගංගා ද්‍රෝණිය තුළ ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය යාන්ත්‍රණය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- ආපදා පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා පොත් කට්ටල මුද්‍රණය කිරීම. (පාසල් සිසුන්ගේ දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා අකුණු, නායයෑම් සහ සුළි සුළං යන පොත් 3 කින් සමන්විත පොත් කට්ටල 600ක් (පොත් 1800) ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය ආධාර යටතේ මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.)
- ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශන හරහා ආපදා කළමනාකරණය පිළිබඳ පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීම.
- ආපදා අවදානම් සහිත ප්‍රදේශවල ආපදා පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- සෙවීම් සහ මුදවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම.
- "ආපදා අවදානම් කිරීම" සඳහා වූ ජාත්‍යන්තර දිනය සැමරීම.

❖ **Climate Smart (දේශගුණික විපර්යාසවලට අනුගත වීම) පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය හරහා ආපදා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- දුරස්ථ සංවේදය මත පදනම් වූ කැලෑගිණි හානි ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- දෛනික කැලෑ ගිනි පසුවිපරම් කිරීමේ Online GIS පද්ධතිය නිර්මාණය කිරීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල හරහා මහජනතාවට තොරතුරු දැනුවත් කිරීම.
- ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ සාමාන්‍ය ජනතාව හා අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීම.

ii. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය ජනතාවට, ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර දෙපාර්තමේන්තුවට නිසි කලට නිකුත් කල පූර්ව අනතුරු ඇඟවීම මඟින් ජීවිත හානි අවම කිරීම මෙන්ම පෙර සුදානම නිසි ලෙස සිදුකිරීමට හැකි වීම මඟින් ආපදා හානිය අවම කිරීමට හැකි වී ඇත.

❖ **ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්ත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය කර ගැනීම**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම. "ඉන්ටනැෂනල් චාටර්" (International Charter) සහ "සෙන්ටිනල් ඒෂියා" (Sentinel Asia) යන ආයතන මඟින් හදිසි ආපදා අවස්ථාවන්හිදී ලබාගනු ලබන චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණයෙන් ආපදා ප්‍රදේශ හඳුනාගැනීම සිදු කරයි.
- දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.

- ජාතික සුරක්ෂිත දින වැඩසටහන පැවැත්වීම.
- ත්‍රිවිධ හමුදා, පොලිස් නිලධාරීන් හා අනෙකුත් පාර්ශවකාර ආයතන නිලධාරීන් දැනුවත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය සැමරීම.
- ආපදා අවස්ථාවලදී කාන්තාවන්ට හා ළමයින්ට ඇතිවිය හැකි හිංසනය හා කළමනාකරණය පිළිබඳ අත්පොත් නිර්මාණය කිරීම, සංවේදීකරණය සහ පුහුණුව ලබා දීම.
- සුනාමි අවදානමට පාත්‍රවන පාසල් සඳහා සුනාමි ආපදා පෙර සූදානම් සැලසුම් කිරීම.
- ජාතික විභාගය සඳහා හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

  2021-2022 සාමාන්‍ය පෙළ විභාගය 2022 මැයි මස 23 සිට ජුනි මස 1 වන දින දක්වා පැවැත්වුණි. මෙම විභාගය පැවැත්වෙන කාලසීමාව නිරිතදිග මෝසම් සක්‍රීයව පැවති කාලසීමාව බැවින් සාමාන්‍ය පෙළ සිසු සිසුවියන්හට විභාගය සඳහා බාධාවකින් තොරව සහභාගී වීමට අවශ්‍ය පරිසරය සකසන ලදී.
- ශිෂ්‍යත්ව විභාගය ආපදාවකින් තොරව පවත්වා ගැනීමට සැලසුම් කිරීම.

ii. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

- ව(ර්)ල්ඩ් විෂන් ආයතනය මඟින් අපදා අවම කිරීමේ ව්‍යාපෘතියක් හරහා මන්නාරම් දිස්ත්‍රික්කයේ ස්වයංක්‍රීය වර්ෂාමාන 2ක් සවි කරන ලදී.
- සුනාමි අනතුරු ඇඟවීමේ විකල්ප මධ්‍යස්ථානයක් ලෙස කටුනායක ගුවන් තොටුපොල කාලගුණ විද්‍යා කාර්යාලයෙහි සුනාමි නිරීක්ෂණ සහ අනතුරු ඇඟවීමේ පද්ධතිය යාවත්කාලීන කිරීම.

❖ **ස්වාභාවික ව්‍යවසනවලට ඔරොත්තු දෙන (ප්‍රත්‍යාස්ථික) ඉදිකිරීම් ප්‍රවර්ධනය හා මාර්ගෝපදේශ සැපයීම**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක සංවර්ධන සැලසුම් අංශයන්හි නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම.

  (ක්ෂේත්‍ර 10ක් සඳහා ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කරන ලදී.)
- හදිසි ආපදා අවස්ථාවලදී ආබාධිත පුද්ගලයන්ගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම සම්බන්ධ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය සකස් කිරීම.

❖ **ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්ත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය කර ගැනීම**

ii. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

ආපදාවක් සිදුවී අවම කාලයක් තුළ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. ආපදා හේතුවෙන් විපතට පත් ජනතාව සුරක්ෂිත

මධ්‍යස්ථාන හා ආරක්ෂිත ස්ථානවලට යොමු කරනු ලබන අතර ඔවුන් නැවත තම පදිංචි ස්ථාන වෙත යොමු කරන තෙක් පිසූ ආහාර ලබාදීම, ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම, මරණ හා අබාධිත පුද්ගලයන් වෙත වන්දි ලබා දීම මෙන්ම තම දෛනික ජන ජීවිතය යථා තත්ත්වයට පත්වන තෙක් වියළි සලාක සැපයීම සිදු කරනු ලබයි. ඒ සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙනු ලබයි.

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිවයිනට බලපාන ලද ස්වාභාවික ආපදා හේතුවෙන් පවුල් 73,722ක පුද්ගලයින් 283,473 පීඩාවට පත්ව ඇත. එම ජනතාව අතුරින් පවුල් 3,800ක පුද්ගලයින් 14,311 සුරක්ෂිත මධ්‍යස්ථාන 162ක රඳවා තිබූ අතර පුද්ගල මරණ 93ක් වාර්තා වී ඇත. එම විපතට පත් පිරිස් වෙත මූලික පහසුකම් සැලසීම සඳහා රු. 67,789,004.39 වියදම් දරා ඇත.



❖ **නිවාස සහ ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු**

i. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය

රජය සතු පොදු ගොඩනැගිලි සහ සාමාන්‍ය ජනතාව බහුලව භාවිත කරන අනෙකුත් ගොඩනැඟිලිවල සැලසුම් කළ කාලයට වඩා පැරණි හා පිරිහීම පිළිබඳ සාක්ෂි පෙන්වන, ව්‍යුහාත්මක අඛණ්ඩතාව අඩු වීම, ව්‍යසන මඟින් භෞතික හානිවලට ලක්වීම, දුර්වල නඩත්තුව නිසා හෝ අවට ඉදිකිරීම් කටයුතුවල බලපෑම හේතුවෙන් ඇතිවන තත්ත්වයන් තක්සේරු කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් එවැනි ගොඩනැඟිලි සඳහා තාක්ෂණික/ව්‍යුහාත්මක තක්සේරු වාර්තාවන් නිකුත් කර නිර්දේශ ඉදිරිපත් කරයි. 2022 වර්ෂයේ දී ගොඩනැගිලි 156ක ව්‍යුහාත්මක තක්සේරු කිරීම් සහ විමර්ශන සිදු කරන ලදී. ඒ සඳහා රු. මිලියන 25.0ක් වැය කර ඇත.

ii. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

- **ආපදා හේතුවෙන් හානියට පත්වූ නිවාස, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි ප්‍රතිපූර්ණය කිරීම.**

ස්වාභාවික ආපදාවන්ගෙන් නිවාස, ගෘහ උපකරණ සහ වෙනත් රක්ෂණාවරණයකින් ප්‍රතිලාභ නොලබන වාර්ෂික ආදායම රු.මි.10 නොඉක්මවන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනැගිලි, උපකරණ හා තොග වලට සිදුවන හානි සඳහා තක්සේරු කමිටුවක් මඟින් සිදුකරනු ලබන හානි තක්සේරු ඇස්තමේන්තුව පදනම් කරගනිමින් රුපියල් මිලියන 2.5ක උපරිමයකට යටත්ව වන්දි ලබා දීම සිදු කරනු ලබයි.

එමෙන්ම, ස්වාභාවික ආපදා හේතුවෙන් හානියට පත් නිවාස වෙනුවෙන් වන්දි මුදල් ලබාදීම සඳහා හානි තක්සේරු කටයුතු සිදු කර අයදුම්පත් ඉදිරිපත් කරන තෙක් එම නිවාස කඩිනමින් පිළිසකර කරගැනීම සඳහා හානියට පත්වූවන් වෙත රුපියල් 10,000ක අත්තිකාරම් මුදලක් ද ලබා

දීම සිදු කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් තක්සේරු කමිටුව මඟින් තහවුරු කිරීමෙන් පසු ඉතිරි වන්දි මුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

2022 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා දිවයිනට බලපාන ලද ස්වාභාවික ආපදා හේතුවෙන් පූර්ණ නිවාස හානි 186ක් හා අර්ධ නිවාස හානි 24,506ක් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි 124ක් වාර්තා වී ඇත. එම නිවාස හා දේපළ හානි වන්දි මෙන්ම 2021 වර්ෂයේ වන්දි ලබා නොදුන් ප්‍රතිලාභීන් වෙත පහත පරිදි වන්දි ලබා දී ඇත.

වර්ෂය	රු. 10,000 දක්වා අත්තිකාරම් ලබා දීම				රු. 25,000 දක්වා දේපළ හානි		රු. 25,000 ට වැඩි දේපළ හානි		මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)
	පූර්ණ හානි සංඛ්‍යාව	අර්ධ හානි සංඛ්‍යාව	එකතුව	ප්‍රතිපාදනි ප්‍රමාණය (රු.මි)	සංඛ්‍යාව	ප්‍රතිපාදනි ප්‍රමාණය (රු.මි)	සංඛ්‍යාව	ප්‍රතිපාදනි ප්‍රමාණය (රු.මි)	
2021	360	26,041	26,401	233.44	4,683	46.85	1,812	97.07	377.36
2022	186	24,506	24,692	151.38	2,243	24.23	974	83.11	258.73

ආපදා හේතුවෙන් හානියට පත්වන නිවාස සඳහා කාර්යක්ෂමව හා වඩාත් ඵලදායී ලෙස ප්‍රතිලාභියා වෙත අත්තිකාරම් ගෙවීමේ අරමුණින් 2018 වර්ෂයේ සිට නිවාස හානි වන්දි ලබාදීමේ දී ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඇතුළත් කිරීම සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් (Online System) නිර්මාණය කොට ඇත. http://housing.ndrsc.lk/authentication



2.1.6 ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව, සුබසාධනය, ජීවනෝපාය ඉහළ නැංවීම හා රැකියා උත්පාදනය

❖ **ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය**

- **ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**

පරමාර්ථය	සංවර්ධන වැඩසටහන	ව්‍යාපෘති හැඳින්වීම	ව්‍යාපෘතින්හි ප්‍රගතිය			
			අවසන් කර ඇත	දැනට ඉදි කරමින් පවතී	කාවකාලිකව නවතා ඇත	ආරම්භ කර නොමැත
රජයේ ජාතිය ගොඩනැඟීමේ සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය ලබාදීම	ජනාධිපතිතුමන්ගේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ පවරන ලද ව්‍යාපෘතීන්	ගම සමඟ පිළිසඳරක් ව්‍යාපෘතිය	12	03	01	-

පරමාර්ථය	සංවර්ධන වැඩසටහන	ව්‍යාපෘති හැඳින්වීම	ව්‍යාපෘතින්හි ප්‍රගතිය			
			අවසන් කර ඇත	දැනට ඉදිකිරීම් පවතී	කාවකාලිකව නවතා ඇත	ආරම්භ කර නොමැත
	කඩිනමින් අවසන් කිරීම.					
	ක්‍රීඩා පාසල්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම	ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන	04	04	-	-
	සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ක්‍රියාත්මක කි:මී 100000 ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කළුතර, මාතර, ගාල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි මාර්ග 12 ක් ප්‍රතිසංස්කරණය කිරීම	කි.මී. 100,000 දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	04	-	04	04
	උතුරු පළාත් වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන	උතුරු පළාත් වාරි පද්ධතීන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම	02	01	-	-
	ජනාධිපතිතුමන් සහ යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් හා අනුමැතිය මත	අතිගරු ජනාධිපතිතුමන්ගේ හා යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් මත සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘති	03	-	01	-
	-	වෙනත් විශේෂ සංවර්ධන ව්‍යාපෘති	-	04	-	-
ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය සහ ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහාය දැක්වීම	සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනයට සහාය වීම	ආගමික ස්ථාන සංවර්ධනය කිරීම	04	-	-	-

ජාතිය ගොඩනැගීමේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා රජයේ උත්සාහය සාක්ෂාත් කරනු වස් යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය නගා සිටුවන ලදී. එමඟින් පහත සඳහන් ව්‍යාපෘතින් 2022 වර්ෂය තුළදී සාර්ථක කර ගන්නා ලදී.

- **කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය**

විස්තරය	ප්‍රමාණය (මෙ.ටො)
ආරක්ෂක සේවා මූලස්ථාන (ආසේමු) බල ප්‍රදේශයන්හි නිෂ්පාදනය කර අවසන් කර ඇති ප්‍රමාණය	15.2
ලංකා පොහොර සමාගම වෙත අලෙවි කර ඇති ප්‍රමාණය	4.2
යුද්ධ හමුදා (යුහ) ගොවිපලයන්හි නිපදවා ඇති ප්‍රමාණය	805.5

- **බ්‍රොයිලර් කුකුල් මස් නිෂ්පාදනය**

විස්තරය	සතුන් ප්‍රමාණය
2022.08.03 වන දින පළමු ඛණ්ඩය	6,000
2022.10.22 වන දින දෙවන ඛණ්ඩය	8,000
2022.11.23 වන දින තුන්වන ඛණ්ඩය	8,000

- කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ආහාර ආනයනය සීමාවීම හේතුවෙන් ජනතාවට ඇතිවිය හැකි අපහසුතා මගහරවා ගැනීමේ අරමුණින් වැවිලි කර්මාන්ත සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මිලියන 79.0ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාවට නංවා ඇති අක්කර 150 කින් යුත් මිරිස් වගා ව්‍යාපෘතිය යුද්ධ හමුදා ගොවිපල ආඩියාපුලියන්කුලම් හි අක්කර 50ක් සහ යුද්ධ හමුදා ගොවිපල කන්දකාඩු හි අක්කර 50ක වගාවක් සිදුකරමින් අක්කර 150කින් යුත් මිරිස් වගා ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.

- 2022 වර්ෂය අවසන් වන විට සතුන් 30,000 දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත. 2022 වර්ෂය තුළ යුද හමුදා බිත්තර අවශ්‍යතාවයෙන් 30%ක ප්‍රමාණයක් සැපයීම සිදුකරන ලදී. එමෙන්ම 2023 වර්ෂය අවසන් වනවිට සතුන් ප්‍රමාණය 50,000ක් දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

- යුද්ධ හමුදාවේ පොල් අවශ්‍යතාවය සපුරා ගැනීම අරමුණු කර ගනිමින් අක්කර 1,000කින් යුත් පොල් වගා කිරීමේ ව්‍යාපෘතිය. මේ වනවිට යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩු, මැණික්ෆාම්, වෙල්ලම්කුලම්, ආඩියාපුලියන්කුලම්, යාල පලටුපාන සහ බළල්ල හි අක්කර 292ක් ආවරණය වන පරිදි පැළ 16,247ක් සිටුවා අවසන් කර ඇත.

- අපනයනය ඉලක්ක කරගනිමින් අක්කර 500කින් යුත් (TEJC) අඹ පැළ 80,000ක වගා ව්‍යාපෘතියේ මේ වන විට යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩු, මැණික්ෆාම්, යාල පලටුපාන, ආඩියාපුලියන්කුලම්, ආරක්ෂක සේවා මූලස්ථාන (ආසේමු) ගොවිපල, රෙජිමේන්තු මධ්‍යස්ථානය (රෙම) ගජබා රෙජිමේන්තුව (ගරෙ) ගොවිපල, ඉංජිනේරු බලකාය (ඉබ), බල සේනා මූලස්ථානය (බසේමු) බූඔය සහ ගුවන් සංග්‍රාමික පුහුණු පාසල කැබිතිගොල්ලෑව යන කඳවුරු ආවරණය වන පරිදි අක්කර 520.05ක භූමි ප්‍රමාණයක පැල 62,700ක් වගා කර අවසන්ව ඇත.

- 2022 වර්ෂය සඳහා යුද්ධ හමුදා සම්පූර්ණ අවශ්‍යතාවය සැපයීමට කටයුතු සිදුකර ඇති අතර, පැය 24 සලාක මල්ලක් සඳහා වන අතිරේක සලාක වශයෙන් නිකුත් කිරීම සඳහා ලුණු ග්‍රෑම් 10, සීනි ග්‍රෑම් 10 සහ කිරි පිටි ග්‍රෑම් 13 ප්‍රමාණයෙන් ඇසුරුම් නිෂ්පාදනය කර සැපයීම සඳහා සැලසුම් කර මේ වනවිට ඒ සඳහා කාර්මික තාක්ෂණික ආයතන වෙතින් තත්ත්ව සහතිකය ලබාගැනීමට කටයුතු කර ඇත.

- යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩු වෙතින් සත්ත්ව පාලනය යටතේ සිදුකරනු ලබන එළ ගව පාලන ව්‍යාපෘතිය මගින් ලබාගන්නා දියර කිරි භාවිතා කරමින් අගය එකතු කළ නිෂ්පාදනය යටතේ ආරම්භ කරන ලද ජීවානුහරණය කරන ලද ග්‍රෑම් 200 සහ 300 ප්‍රමාණයේ චොක්ලට් සහ වැනිලා කල් කිරි බෝතල් වශයෙන් යුද්ධ හමුදාවේ සියලුම ආරක්ෂක සේවා මූලස්ථාන යටතේ පාලනය වන පුහුණු පාසල් හා කඳවුරු ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන නිලධාරී නිවස්න, සුභසාධක වෙළඳසැල් සහ ජන අවන්හල් වෙත සුභසාධන මිල ගණන් යටතේ ලබාදීමට කටයුතු කර ඇත.

- එස්.එල්.එස් ප්‍රමිති සහතිකය යටතේ නිෂ්පාදනය කරන ලද මේස ලුණු 2021/2022 වර්ෂයන් සඳහා යුද්ධ හමුදා අවශ්‍යතාවයෙන් 40ක් ලබාදීමට කටයුතු සිදුකර ඇත. එමෙන්ම, යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාව වෙතින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් සඳහා සහ යුද්ධ හමුදා සුබසාධක අළෙවි සැල් සඳහා නිකුත් කිරීම සිදුකරනු ලබයි. 2023 වර්ෂය සඳහා යුද්ධ හමුදා සම්පූර්ණ ලුණු අවශ්‍යතාවය අඛණ්ඩව සැපයීම වෙනුවෙන් හම්බන්තොට මහ ලුණු ලේවාය සමගින් ලුණු ලබාගැනීම සඳහා ගිවිසුම් ගත විමට කටයුතු සිදුකරමින් පවතී.

- ආනයනික ආහාර ද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය කිරීම තුළින් ආනයනය සීමා කිරීම සහ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය හා එක්ව දේශීය කහ බීජ අවශ්‍යතාවය සපුරාලීම සඳහා යුද්ධ හමුදා ගොවිපළ ආඩියාපුලියන්කුලම්, කොහිලවගුරවත්ත, නිරාවිය, සටන් පුහුණු පාසල අම්පාර, රෙම ශ්‍රීලයුයුබ සහ යුහ පුපා මාදුරුඔය හි කහ අක්කර 08ක ප්‍රමාණයක් වගා කිරීමට කටයුතු සිදුකර ඇති අතර, තවත් අක්කර 10ක ප්‍රමාණයක් මෙම වර්ෂයේ මහකන්නයේ යුහ ගොවිපළ නිරාවියෙහි වගා කිරීම සඳහා මූලික බිම් සැකසීමේ කටයුතු අවසන් කර ඇත.

- 2022 වර්ෂය සඳහා පොල් පැළ 100,000ක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, ඒ සඳහා තෝරාගත් යුද්ධ හමුදා ගොවිපළ වල සහ ඒකකයන් තුළ පොල් පැළ 70,000ක ප්‍රමාණයක් තවාන් කර රෝපණය කර එම පොල් පැළ ආරක්ෂක අංශයන්/රාජ්‍ය ආයතනයන් වෙත නොමිලයේ රෝපණය කිරීම සඳහා මේ වනවිට 36,500 ක ප්‍රමාණයක් ලබාදී ඇති අතර, ඉදිරියේදී ද මෙම ආයතනයන් සඳහා ලබාදීමට නියමිතව ඇත.

- 2022/2023 මහකන්නයේදී එනම්, 2023 ජනවාරි මස තුළ අක්කර 25 ක භූමි ප්‍රමාණයක් පොල් පැළ ස්ථාපනය කිරීමට නියමිත අතර, එහි පළමු අදියර ලෙස මේ වනවිට අදාල භූමියේ පාංශු පරීක්ෂණ කටයුතු සහ වලවල් ලකුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත.

- 2022/2023 මහකන්නය සඳහා යුද්ධ හමුදා ගොවිපළ මැණික්ෆාම් හි අක්කර 50ක ද, යුද්ධ හමුදා ගොවිපල කන්දකාඩුහි අක්කර 40ක ද බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය සඳහා වැඩ කටයුතු ආරම්භ කරමින් පැවතියද, මෙම මහකන්නය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් අදාල මව්පිය පරම්පරා වලට අයත් බීජ නොලැබී යාම නිසා ව්‍යාපෘතිය කල් දැමීමට සිදුවිය.

- **ශ්‍රී ලංකා නාවික හමුදාව**

විස්තරය	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු.මි.)	2022 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන	2022 වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන	2022 වර්ෂය තුළ සිදු කරන ලද මුළු ව්‍යාපෘති ගණන
ආගමික ස්ථාන	1,771.47	39	77	116
ආගමික නොවන ස්ථාන	8,456.93	30	49	79

- **නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය (ප්‍රති ආශ්‍රැතිකරණ යන්ත්‍ර) විසින් සිදු කරන ලද ව්‍යාපෘති**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		නාවික සමාජයීය මෙහෙවර අරමුදලේ ප්‍රතිපාදන භාවිතා කරමින් සිදු කරන ලද ව්‍යාපෘති		එකතුව	
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති
15	1	38	5	6	-	59	6

- සොරොව් අළුත්වැඩියා කිරීම්, පාලම් පිරිසිදු කිරීම්, ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු, ජීවිතාරක්ෂක රාජකාරි, අපරාධ පරීක්ෂණ රාජකාරි, සම්පිඩන කුසීර ප්‍රතිකාර ලබා දීම සහ මෘත දේහ සෙවීම් ආදී විශේෂ කිමිදුම් රාජකාරි ගණනින් අවස්ථාවන් 182ක් සඳහා දායකත්වය ලබා දී ඇත.
- 2022 වසර තුළ දී කඩොලාන පැළ 16,087ක් සිටුවීමට කටයුතු කර ඇත.
- රජයේ ආයතන මඟින් ප්‍රතිපාදන සැපයීමෙන් අනතුරුව සඳහිරු සෑය, ගාලු මුවදොර පිටිය, ජාතික කලා භවන යන ස්ථානයන්හි උද්‍යාන අලංකරණ කටයුතු සිදු කිරීම නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කරනු ලබයි.
- **නාවික හමුදා කෘෂි ව්‍යාපෘති අරමුදල මඟින් සිදු කර ඇති කාර්යයන්**
    - අක්කර 26ක භූමි ප්‍රමාණයක දේශීය සහ දෙමුහුම් වී වගාව සිදු කර වී කි.ග්‍රෑ 53,704.00ක අස්වැන්නක් ලබා ගැනීමෙන් අනතුරුව එය නාවික පුද්ගලයින් අතර සහන මිලට අලෙවිකරන ලදී.
    - අක්කර 32ක භූමි ප්‍රමාණයක එළවලු සහ පළතුරු වගා කර කි.ග්‍රෑ 33,504.64ක අස්වැන්නක් ලබා ගැනීමෙන් අනතුරුව එය නාවික පුද්ගලයින් අතර සහන මිලට අලෙවිකරන ලදී.
    - අක්කර 107ක භූමි ප්‍රමාණයක පොල් වගාව සිදු කර ඇති අතර දැනට පවතින වගාවෙන් ගෙඩි 2,052ක අස්වැන්නක් ලබා ගෙන ඇත.
    - අක්කර 16ක භූමි ප්‍රමාණයක කජු වගා කටයුතු ආරම්භ කර ඇති අතර, එය වර්ධනය වෙමින් පවතී.
    - මාවතගම කෘෂි ව්‍යාපෘතිය සඳහා 2022 අගෝස්තු මස 01 වන දින අක්කර 88ක භූමි ප්‍රමාණයක් සහිත ඩෙනවර්වත්ත නාවික හමුදාවට බදු පදනම යටතේ පවරා ගෙන කිරි ගවයන් දෙදෙනකුගෙන් කිරිගව පාලනය ආරම්භ කර ඇති අතර, දැනට පවතින පොල් වගාවෙන් ගෙඩි 20,000 පමණ අස්වැන්නක් ලබා ගෙන ඇත.

- **ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

- ගුවන් තාක්ෂණය පිළිබඳ පාසල් දරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා කෞතුකාගාරයේ පවත්වන ලද අධ්‍යාපන වැඩසටහන සහ ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ නව තාක්ෂණික දැනුම ගවේෂණය කිරීම සහ අත්හදා බැලීම සඳහා අනාගත පරම්පරාවේ ප්‍රායෝගික නිවාරණයක් ඔවුන්ට ලබා දෙන ලදී.

- කොවිඩ් (COVID – 19) සහ ශ්වසන අපහසුතා ඇති රෝගීන් සඳහා නිෂ්පාදනය කළ ශ්වසන උපකාරක ඒකක 18ක් නිර්මාණය කර රෝහල් සඳහා ලබා දෙන ලදී.
- ඉහළ කාර්යක්ෂමතාවයෙන් යුතු සුළං බලාගාර ව්‍යාපෘතියක් සැලසුම් කර නිෂ්පාදනය කරන ලදී.
- APC වර්ගයේ සන්නාහ සන්නද්ධ රථ සැලසුම් කර නිෂ්පාදනය කරන ලදී.
- අසාධ්‍ය රෝගීන් ගුවන් මඟින් ප්‍රවාහනය සඳහා වන විශේෂිත ප්‍රථමාධාර සහ රෝගීන් රැගෙන යන උපකරණ කට්ටල අලුත්වැඩියාව සිදු කරන ලදී.
- ස්ථාන 09ක රජයේ පාසල් සංවර්ධනය හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සපයන ලදී.
- ස්ථාන 02ක සෞඛ්‍ය සේවා ස්ථාන සංවර්ධනය හා අලුත් වැඩියා සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සපයන ලදී.
- කුඩා කර්මාන්ත සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සපයන ලදී.
- යුද්ධයේදී මියගිය රණවිරු පවුල් 341 ක් සඳහා තෑගි පාර්සල් රැගෙන නිවස්න වෙත ගොස් සුවදුක් විමසන ලදී.
- විරුසර කාඩ්පත් 53 ක ප්‍රමාණයක් ලබා දෙන ලදී.
- පෙර පාසල් ගුරුවරුන් සඳහා වැඩමුළු පවත්වන ලදී.
- විශ්‍රාමික සේවා පුද්ගලයින් සඳහා රැකියා අවස්ථාවන් ලබා දෙන ලදී.
- පෙර පාසල් ගුරුවරුවරියන් 59දෙනෙකු වෙත පෙරපාසල් සාරි 02 බැගින් ලබා දෙන ලදී.
- පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම සහ යහපත් ශාරීරික යෝග්‍යතාවයකින් යුත් තරුණ ප්‍රජාවක් සමාජයට යොමුකිරීම සඳහා පාසල් තුළ ක්‍රීඩා පිටි සකස් කිරීම, අලුත් වැඩියා කිරීම සිදු කරන ලදී.
    - ආනමඩුව මහා විද්‍යාලය
    - ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලය
    - ආරක්ෂක සේවා විද්‍යාලය, කුරුණෑගල
    - ආනන්ද විද්‍යාලය, කොළඹ
    - ශාන්ත ඇන්තනි විද්‍යාලය, කුරුණෑගල
    - හැව්ලොක් ක්‍රීඩා සමාජය
    - පාපන්දු ක්‍රීඩා පිටිය, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය
- පාසල් මට්ටමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞරුෂත්ව වර්ධනය සඳහා නායකත්ව පුහුණු වැඩමුළු පැවත්වීම සහ පුහුණු කටයුතු සඳහා ශාරීරික අභ්‍යාස උපදේශකයින්ගේ සෘජු දායකත්වයක් ලබා දෙන ලදී.
    - ශාන්ත ඇන්තනි විද්‍යාලය, කුරුණෑගල
    - ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ
    - ආරක්ෂක සේවා විද්‍යාලය, කොළඹ
- ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් අපේක්ෂා කරනු ලබන සහයෝගීතාවය ක්‍රමවත්ව ලබාදීම සහ ජාතික ක්‍රීඩා තරග සංවිධානය කිරීම සඳහා උපදේශකත්ව සහ සහයෝගීත්වය ලබාදීම.
- 2022 වසරේදී විවිධ ස්ථානයන්හීදී ගුවන් හමුදා දන්ත වෛද්‍ය අංශයන් මඟින් ජංගම දන්ත වෛද්‍ය සායන පැවැත්වීම හා මුඛ රෝග නිවාරණ වැඩසටහන් පැවැත්වීම තුළින් ග්‍රාමීය ප්‍රජාවන්ගේ දන්ත සෞඛ්‍ය වර්ධනය කිරීමට දායකත්වය ලබාදෙන ලදී.

- **ගුවන් හමුදා කෘෂි ව්‍යාපෘති**

ස්ථානය	අක්කර ප්‍රමාණය	වගා වර්ග
අනුරාධපුර කඳවුර	අක්කර 05	වී, කෙසෙල්, එළවලු
පලාලි කඳවුර	අක්කර 10	අඹ, මිදි,කෙසෙල්, එළවලු කෝමාරිකා
දියතලාව කඳවුර	අක්කර 04	එළවලු
මොරවැව කඳවුර	අක්කර 148	වී වගාව
පාලවී කඳවුර	අක්කර 07	අන්නාසි, එළවලු, කෝමාරිකා
අම්පාර කඳවුර	අක්කර 06	වී, එළවලු
සීගිරිය කඳවුර	අක්කර 08	වී, කෙසෙල්, එළවලු

❖ **සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනට සහාය වීම**

○ **සඳහිරුසෑය ව්‍යාපෘතිය**

සඳහිරුසෑය ස්තූපය උසින් අඩි 282.6ක් හා විශ්කම්භය අඩි 255ක් වන අතර, ස්තූපයේ ඉදිකිරීම් 2021.11.18 දින අවසන් කර මහජනතාවගේ වන්දනාමන කටයුතු සඳහා අවස්ථාව සලසා ඇත. තවද, ස්තූපය වටා ඇති අනෙකුත් ඉදිකිරීම් කටයුතු ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භට පිරිස් යොදා ගනිමින් සිදුකරනු ලබයි.



○ 2022.01.01 දින සිට 2022.09.30 දින දක්වා කාලය තුළ දිවයිනේ වෙහෙර විහාරස්ථාන සහ විවිධ ආයතන 62ක සංවර්ධන කටයුතු වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු භට පිරිස්හි ශ්‍රම දායකත්වය ලබාදීමට කටයුතු සිදුකර ඇත.

○ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනයට සහය වීම.

- ශ්‍රී ජයසුමනාරාමය පරණ හල්මිල්ලෑව විහාරස්ථානයේ නවීකරණ කටයුතු කිරීම.
- අරන්තලාව යාය 07 අභිනවාරාමය විහාරස්ථානයේ විද්‍යුත් පද්ධතිය අළුත්වැඩියාව.
- සඳහිරු සෑයෙහි ගල් කැටයම් නිර්මාණය කිරීමට අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීම.
- ආගමික ස්ථාන 14ක නව ඉදිකිරීම්, අළුත්වැඩියාවන්, වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කාර්යන් සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.
- ස්ථාන 02ක පෞරාණික ආගමික ස්ථාන හා වෙහෙර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

- **බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යාපෘතීන්**

○ **රුක්රෝපණය සහ පරිසරය ආරක්ෂා කිරීම**

2022 වසරට යෙදී තිබූ 74 වන ජාතික නිදහස් සැමරුවට සමගාමීව මෙම දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාලවල මුලිකත්වයෙන් රුක් රෝපණ සහ පරිසර ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක

කරන ලදි. මේ යටතේ ඌව පළාත් කාර්යාලයේ මෙහෙයවීමෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස කේන්ද්‍ර කරගනිමින් මී පැළ 1,000ක් රෝපණය කිරීම, උතුරු පළාත් කාර්යාලය හා යාපනය දිස්ත්‍රික් කාර්යාලයේ සංවිධානයෙන් දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රුක්රෝපණ වැඩසටහනක් පැවැත්වීම වැනි කටයුතු සඳහා බහුකාර්ය සහයකයින් තම ශ්‍රම දායකත්වය සළසන ලදි.

එමෙන්ම, අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් බහුකාර්ය සහයකයින් විසින් කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමටත් වන අලි බහුලව ගැවසෙන මං මාවත් එළි පෙහෙළි කර පිරිසිදු කිරීම් කටයුතු සඳහා දැඩි පරිශ්‍රමයක් දරන ලදි.

- **සබරගමුව පළාතෙහි ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් කරදරයට පත් ජනතාවට සහායවීම**

රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඇති වූ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් අ.පො.ස සා/පෙළ විභාග ශාලා වෙත ගමන් කිරීමට අපොහොසත් වූ දරුවන් ගංවතුරින් එතෙර කිරීමට බහුකාර්ය සහයකයින් මහත් කැපවීමෙන් කටයුතු කරන ලදි. එමෙන්ම, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කයන්හි ගංවතුර ආපදාවන්ට ලක් වූ පවුල් වෙත ආධාර බෙදා දීමට ද මෙම සහයකයින් දැඩි කැපවීමෙන් කටයුතු කරන ලදි.

- **කෘෂිර්මික කටයුතු නගා සිටුවීම සඳහා දායකත්වය සැපයීම**

සබරගමුව පළාතෙහි බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් විසින් එම පළාතෙහි වගාවන් සිදු නොකරන මුඩු බිම් වගා කිරීමේ කටයුතු සාර්ථකව ආරම්භ කර ඇත. මෙහිදී, රත්නපුර දිස්ත්‍රික්කයේ කිරිඇල්ල සහ කොළොන්න කොට්ඨාසයන්හි ඉතා සාර්ථකව මෙම කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම, ගිං ගඟ රක්ෂිතයන්හි රුක් රෝපණ කටයුතු බහුකාර්ය සහයකයින් මඟින් සිදු කරනු ලැබේ.

- **ලේ දන්දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

යාපනය දිස්ත්‍රික්කයේ කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෙම දෙපාර්තමේන්තුවට අයත්ව සේවයේ යෙදෙන සංවර්ධන නිලධාරීන් හා බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් සිවිල් සංවිධාන සම්බන්ධ කරගනිමින් ‘ලේ දන්දීමේ ව්‍යාපාරය’ එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී ඉතා සාර්ථක ලෙස පවත්වන ලදී.

- **ඩෙංගු රෝගය බෝවීම වැළැක්වීම සඳහා සහය වීම**

ඩෙංගු රෝග වාහක මදුරු කීටයන් බෝවන මධ්‍යස්ථාන පරික්ෂා කිරීම සහ පිරිසිදු කිරීම් කාර්යයන් බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයන් විසින් සිදු කරන ලදි. මෙහි දී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ අනෙකුත් ක්ෂේත්‍ර සේවා නිලධාරීන්ට සහය වීම ප්‍රධාන වේ.

- **නිවාස ඉදිකිරීමේ කටයුතු සඳහා දායකත්වය සැපයීම**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධව සේවය කරන බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ කාර්යය සාර්ථකව අවසන් කරන ලදි.

- **බහුකාර්ය සංවර්ධන ගොවිපළ**

මාතර දිස්ත්‍රික්කයේ රැකියාගත කර ඇති බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් විසින් අතුරලිය ශ්‍රී නිවාසාරාම විහාරස්ථානයේ අක්කර 3.5 ආසන්න ඉඩමෙහි කාබනික පොහොර භාවිතා කරමින් සිදුකළ බෝග වගාවෙහි අස්වනු නෙලීම සාර්ථකව සිදුකළ අතර එම ඵලදාව සාධාරණ මිලකට අලෙවි කිරීමද සිදුකරන ලදී.

- **වී ගබඩා කිරීම සහ වී ගබඩා ආරක්ෂා කිරීම**

වී අලෙවි මණ්ඩලයේ ඉල්ලීම පරිදි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රැකියාගත කර ඇති බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් විසින් එම දිස්ත්‍රික්කයේ වී ගබඩා කිරීමේ කටයුතු සහ එම ගබඩා ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා ඉමහත් සහයෝගයක් ලබා දෙන ලදි.

- **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යාපෘතීන්**

- නිෂ්පාදන ව්‍යාපෘති

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු මානව සම්පත විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හී යොදවා එකී නිෂ්පාදන වෙළඳපල වෙත යොමු කිරීමෙන් උපයාගනු ලැබූ ආදායම් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත පහත පරිදි ප්‍රේෂණය කර ඇත. එමඟින්, එකී නිෂ්පාදනයන්හි වෙළඳපල මිල පාලනයට මෙන්ම රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා පහත පරිදි දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත.

ව්‍යාපෘති ආදායම් (රුපියල් මිලියන)									
ආදායම් බාණ්ඩය/වර්ෂය	**2014**	**2015**	**2016**	**2017**	**2018**	**2019**	**2020**	**2021**	**2022**
කෘෂි/පශු/ගඩොල්	27.0	295.0	631.0	541.0	375.0	382.0	482.5	379.2	655.27
ආරක්ෂක සේවා	38.0	25.0	204.0	312.0	491.0	606.0	375.7	320.49	741.69
නර්තන හා සංගීත	-	-	27.0	11.0	6.0	17.0	3.0	1.6	4.65
නඩත්තු සේවා	-	-	23.0	19.0	22.0	24.0	17.5	25.58	67.28
ඉදිකිරීම් සේවා	-	-	30.0	58.0	87.0	102.0	90.5	1.57	6.45
විවිධ ආදායම්	4.0	3.0	141.0	202.0	16.0	25.0	9.0	41.06	89.72
එකතුව	**69.0**	**323.0**	**1,056.0**	**1,143.0**	**997.0**	**1,156.0**	**978.2**	**769.5**	**1,565.06**

- **කෘෂි සහ වෙනත් ව්‍යාපෘති**

කෘෂි ව්‍යාපෘති		
ව්‍යාපෘතියේ නම	**ව්‍යාපෘති ගණන**	**අක්කර ගණන**
වී	-	1,371
අඳ වී	2,789	2,789
ස්ථිර බෝග	50	2,767
බඩ ඉරිහු	30	721
කව්පි	13	36
කුරක්කන්	26	232
උඳු	23	270
රට කජු	16	135
තල	30	221
මිරිස්	11	22
වෙනත්	8	409
එකතුව	**2,996**	**8,974**

වෙනත් ව්‍යාපෘති	
ව්‍යාපෘතියේ නම	**ව්‍යාපෘති ගණන**
බ්ලොක් ගල්	11
ගඩොල්	65
ඉදල්	22
අත්කම්	10
මැහුම්	16
පේෂකර්ම	01
අභ්‍යාස පොත්	01
කරණවැම්	05
පශු	14
මත්ස්‍ය	06
කම්මල්	03
වාහන අලුත්වැඩියා	04
ඉරටු	18
කාබනික පොහොර	140
වෙනත්	83
එකතුව	**296**

<u>දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පළතුරු, පශු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මගින් රටේ ආහාර ඇතුළු ජාතික නිෂ්පාදනය ශක්තිමත් කිරීම.</u>

2021/22 මහ කන්නයේ සහ 2022 යල කන්නයේ ලද කෘෂි ව්‍යාපෘති අස්වනු ප්‍රමාණයන් පහත පරිදි වේ. 2022/23 මහ කන්නයේ අස්වනු ඉදිරියේ දී ලැබීමට නියමිතය.

අ/අ	බලකාය	වී	බඩඉරිඟු		උඳු	රටකජු		මුංඇට	කව්පි	තල	කුරක්කන්
			කිලෝ	කරල්		අමු	වියළි				
1	පුත්තලම	17,500	-	-	31,567	-	-	-	-	26,445	-
2	විල්පත්තුව	48,000	-	-	2,623	-	-	-	-	3,840	-
3	අනුරාධපුර	20,143	-	-	5,052	-	523	-	-	516	-
4	වව්නියාව	121,208	-	-	-	-	8,890	254	2,468	1,512	1,427
5	කිලිනොච්චිය	63,165	-	-	467	9,490	937	-	51	-	699
6	මුලතිව්	18,130	-	-	900	18,419	-	900	-	-	-
7	වැලිඔය	360,830	-	-	-	98,980	-	-	-	-	-
8	හොරොව්පොතාන	238,234	-	-	-	-	-	-	-	-	3,078
9	කැබිතිගොල්ලෑව	169,789	-	-	-	-	772	132	1,115	-	4,360
10	ගෝමරන්කඩවල	240,355	-	-	840	-	1,540	-	-	-	-
11	සේරුවිල	83,011	-	-	-	1,608	-	1,343	-	-	-
12	ත්‍රිකුණාමලය	411,972	-	-	-	-	2,053	401	-	-	-
13	මැදිරිගිරිය	87,383	260	4,482	351	-	1,813	425	-	-	-
14	පොළොන්නරුව	460,255	-	-	-	2,211	-	-	68	-	-
15	මහඔය	42,973	15,828	-	-	-	-	-	2,798	-	1,466
16	අම්පාර	497,000	-	-	-	-	-	-	-	-	-
17	උහන	570,000	-	-	-	-	-	-	1,797	-	-
18	මොණරාගල	62,272	114,618	-	-	-	-	-	-	246	30,599
19	කතරගම	3,545	-	-	-	-	-	-	-	-	-
20	මහනුවර	1,410	-	2,775	-	-	-	-	-	-	-
21	විශ්වමඩු	149,347	-	-	-	-	-	74	-	-	-
22	ගල්කිරියාගම	6,000	-	-	-	-	-	-	-	-	-
23	වෙන්නවත්ත	3,679	-	-	-	-	-	-	-	-	-
24	කොණ්ඩච්චිය	-	-	-	-	-	-	-	1,526	-	-
එකතුව		**3,676,200**	**130,706**	**7,257**	**41,800**	**130,708**	**16,528**	**3,529**	**9,823**	**32,559**	**41,629**

- **නඩත්තු ව්‍යාපෘති**

ඉදිකිරීම් ව්‍යාපෘතියේ නම	යොදවා ඇති භටයින් ගණන
පල්ලන්සේන බන්ධනාගාරයේ දෙමහල් ගොඩනැගිලි 04ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබාදීම	20
රාජ්‍ය ඔසුසල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම	09
අපේ ගම පරිශ්‍රය පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම	05

- **සුබසාධන හා සේවාවනිතා ඒකක මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**
  - ස්ථිර නිවාස නොමැති සිවිල් ආරක්ෂක සාමාජිකයන් හට නව නිවාස 51ක් සාදා දී පදිංචි කරවීම.
  - අර්ධ නිවාස ව්‍යාපෘතිය යටතේ සිවිල් ආරක්ෂක භටයන්ගේ අඩක් නිම කරන ලද නිවාස 10ක වැඩ අවසන් කිරීම සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම.
  - සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් 39,747 කට නව වසරට අවශ්‍ය පාසල් පොත් 309,599ක් බෙදි දීම. අ.පො.ස (උසස් පෙළ) සමත්ව විශ්වවිද්‍යාල වරම් ලැබූ දරුවන් 06 දෙනෙකු සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීම.
  - අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.
  - ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබාදීම.
  - උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරන යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.

❖ **අලි මිනිස් ගැටලු හේතුවෙන් සිදුවන හානි අවම කිරීම**

- **ශ්‍රී ලංකා ගුවන් හමුදාව**
  - කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය බල ප්‍රදේශයේ හල්මිල්ලවැටිය ගම්මානය, කණුගහවැව ගම්මානය සහ තල්ගහ වැව ගම්මානය ආවරණය වන පරිදි කිලෝමීටර් 13ක් සහ මීටර් 740ක විදුලි වැටක් ඉදි කිරීම.
  - කණුගහවැව, කැබිතිගොල්ලෑව ග්‍රාමයේ නව අලිවැට ස්ථාපනය සඳහා ශ්‍රම දායකත්වය සැපයීම.
- **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**
  - අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිස් හා අලි ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කලමනාකරණ හා පලවා හැරීම්, අලිවැට ඉදිකිරීම් හා නඩත්තු කිරීම වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.
  - මේ යටතේ විදුලිවැට ඉදිකිරීම හා නඩත්තු කටයුතු සඳහා භටයන් 3,278ක් ද, වන අලි කලමනාකරණය හා වන අලි පලවා හැරීම සඳහා භටයන් 1,243ක් ද යොදවා දිග කි.මී. 4,645ක් වන විදුලි වැටවල් 316ක් නඩ ත්තු කර පවත්වාගෙන යනු ලබයි.

❖ **රට තුළ ඇති වන විවිධ ආපදා අවස්ථාවන්හිදී ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම**

- **ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**
  - ආපදා කළමනාකරණය යටතේ ශ්‍රී ලංකාව ගංවතුර, නායයෑම්, සුනාමි, නියඟ, සුළි කුණාටු ඇතුළු බොහෝ ස්වාභාවික විපත් සහ කාලගුණික හා දේශගුණික බලපෑම් මඟින් ඇතිවන වසංගත රෝග තත්ත්වයන් ද ශීඝ්‍ර ලෙස ඉහළ යනු ලබන බැවින් එම ආපදාවලින් ජනතාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කර ගැනීම හා රටේ පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා සන්නද්ධ හමුදාවන්ගේ සහය සෙවීම සහ ගලවා ගැනීම, ඉවත් කිරීම වැනි විශේෂිත රාජකාරීන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඉටු කර ඇත.
  - ආපදාවන්ට මුහුණ දීම සඳහා සෙවීමේ හා මුදවා ගැනීමේ කණ්ඩායම් 79ක් දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි අවශ්‍ය නවීන උපකරණ සහ බෝට්ටු ඇතුළු අනෙකුත් මෙවලම් වැනි අත්‍යවශ්‍ය උපකරණ වලින් සන්නද්ධව මේ දක්වා එම රාජකාරීන් ඉටු කරනු ලබයි.

- **ශ්‍රී ලංකා නාවික හමුදාව**
- සෙසු හමුදාවන් සහ සිවිල් පුද්ගලයින් සඳහා ආපදා කළමනාකරණ පුහුණු පාඨමාලාවන් සහ පුහුණු කටයුතු සිදු කර ඇත.
  - ආපදා කළමනාකරණ පළමු ප්‍රතිචාර දැක්වීමේ මූලික පාඨමාලාව - පුහුණු වූ සාමාජිකයන් ගණන 125
  - බිඳවැටුන ව්‍යුහයන් තුළින් සෙවීම් සහ මුදවා ගැනීමේ පාඨමාලාව - පුහුණු වූ සාමාජිකයන් ගණන 36
  - අන්තර් ජාතික සෙවීම් සහ මුදවා ගැනීම් උපදේශක කණ්ඩායම් පුහුණු කිරීමේ පාඨමාලාව - පුහුණු වූ සාමාජිකයන් ගණන 84
  - ආපදා කළමනාකරණ උසස් පුහුණු පාඨමාලාව - පුහුණුවූ සාමාජිකයන් ගණන 25
- රත්නපුර ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් හේතුවෙන් ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණ පසු මූලය කළුතර මඟින් නාවිකයින් 05 දෙනෙකු සහ ඩිං ගි යාත්‍රාවක් (සහන කණ්ඩායමක්) 2022 මැයි මස 20 වන දින අනුයුක්ත කරන ලදී.
- ගාල්ල තවලම ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් හේතුවෙන් ශ්‍රී ලංකා නාවික නෞකා දක්ෂිණ ආයතනයට අනුයුක්ත ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණයේ නාවිකයින් 03 දෙනෙකු සහ ඩිංගියාත්‍රාවක් (සහන කණ්ඩායමක්) 2022 මැයි මස 31 වන දින අනුයුක්ත කරන ලදී.
- බුලත්සිංහල ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් හේතුවෙන් ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණ පසු මූලය කළුතර මඟින් නාවිකයින් 06 දෙනෙකු සහ ඩිංගියාත්‍රාවක් (සහන කණ්ඩායමක්) 2022 මැයි මස 31 වන දින අනුයුක්ත කරන ලදී.
- ගාල්ල තවලම ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් හේතුවෙන් ශ්‍රී ලංකා නාවික නෞකා (ශ්‍රීලංනානෞ) දක්ෂිණ ආයතනයට අනුයුක්ත ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණයේ නාවිකයින් 06 දෙනෙකු සහ ඩිංගියාත්‍රාවක් (සහන කණ්ඩායමක්) 2022 අගෝස්තු මස 31 වන දින අනුයුක්ත කරවන ලදි.

❖ **දිළිඳු බව තුරන් කිරීම**

- **ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කළ ව්‍යාපෘති**
  - යුද්ධයේදී මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ ලහම ඥාතීන් 08 දෙනෙකු වෙත පොලී රහිත ණය පහසුකම් සැලසීම.
  - යුද්ධයේදී ආබාධිත රණවිරුවන් 06 දෙනෙකු වෙත ආපදා ණය මුදල් පොලී රහිතව ලබාදීම.
  - ගුවන්හමුදා පෙරපාසල්හි සේවයේ නියුතු සිවිල් සේවා පුද්ගලයින්ගේ වැටුප් වැඩි කිරීම.
  - ගුවන්හමුදාව සතු ඉඩම් වලින් බිම් කොටස් 26ක් සේවා පුද්ගලයින් වෙත බෙදා දෙන ලදි.

ස්වයං මූල්‍යනය මඟින් ක්‍රියාත්මක වන ආයතන

- **සිමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම**

  - **සිමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ කාර්ය භාරය**

රක්නා ආරක්ෂක ලංකා සමාගම (RALL) විසින් දිවයින පුරා ඉතා වැදගත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන 150 කට අධික ප්‍රමාණයකට ඉහළ සුදුසුකම්ලත් සහ මනා පුහුණුව ලත් ආරක්ෂක නිලධාරීන් 2000 කට අධික සංඛ්‍යාවක් සමඟින් ඉහළම මට්ටමේ වාණිජ ආරක්ෂක සේවාවක් සපයන අතරම, පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම් (PMSC) සහ ලියාපදිංචි සී මාර්ෂල්වරුන් 858ක් පමණ සිටින නැවගත කිරීමේ යාත්‍රා සඳහා ඉහළම ශ්‍රේණිගත හමුදා පසුබිම් සී මාෂල්වරු ලබා දීමට ද කැප වී සිටී.

රක්නා ආරක්ෂක ලංකා සමාගම පිරිසිදු කිරීමේ සේවා, ජලනල සේවා සහ සිවිල් විදුලි නඩත්තු සේවා සැපයීමට සැලසුම් කර ඇත. දැනට, මෙම අංශයේ සේවකයින් 345, ස්ථාන 25ක මුරකරුවන් සේවයෙහි යොදවා ඇත.



- වියදම් කළමනාකරණ මූලපිරීම් හේතුවෙන් 2022 වර්ෂයේ ආදායම පහත වැටී ඇතත්, රක්නා ආරක්ෂක ලංකා සමාගම වසරින් වසර 87% ක ශුද්ධ ලාභ වර්ධනයක් අත්කර ගෙන ඇත.

2.2
ඉදිරි දැක්ම

2.2 ඉදිරි දැක්ම

2022 මැයි මස 27 දිනැති අංක 2281/41 දරන සහ 2022 ජූලි මස 27 දිනැති අංක 2289/43 දරන ගැසට් පත්‍ර මඟින් ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා වන උපායමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, රාජ්‍යතාන්ත්‍රික ආරක්ෂාව තහවුරු කිරීම, සයිබර් ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාවය ශක්තිමත් කිරීම, අපරාධ, මත්ද්‍රව්‍ය, මුදල් විශුද්ධිකරණය සහ දූෂණයෙන් රට මුදවා ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන් ඉටු කිරීම මෙන්ම ස්වාභාවික ව්‍යසනයන්ගෙන් ජනතාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කර ගැනීම යනාදී සුවිශේෂී කාර්යයන් හා කර්තව්‍යයන් ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා ඇති අතර ඒ අනුව භෞමික අඛණ්ඩතාවය මෙන්ම ස්වෛරීත්වය ආරක්ෂා කිරීම ස්වකීය වගකීම කොට සලකා රජයේ ප්‍රතිපත්තීන්ට අනුගතව එකී කාර්යයන් හා කර්තව්‍යයන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරමින් සිටියි.

❖ **ජාතික ආරක්ෂාව තහවුරු කිරීම - ආරක්ෂක අංශ ශක්තිමත් කිරීම**

එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සාමය හා සහජීවනය සුරක්ෂිත කිරීම උදෙසා සන්නද්ධ හමුදා මෙහෙයවීමේ ජාතික වගකීම අඛණ්ඩව දරමින් නිදහස් සාමකාමී ජන ජීවිතයට තර්ජනයක් වන අභියෝග, බලවේග පරාජය කරමින් ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීමටත් සතුරු ආක්‍රමණයකදී, අන්තවාදී කණ්ඩායම්හි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවකදී, හදිසි අරගලකාරී තත්ත්වයකදී ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ විශේෂිත හැකියාවලින් යුත් ත්‍රිවිධ හමුදා දූරදර්ශීව මෙහෙයවමින් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යාංශය නිරන්තරව කැපවී සිටියි.

ජාතික ආරක්ෂාව ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ එහි සන්නද්ධ හමුදාවන් කෙරෙහි දක්වන අවධාරණය සහ ඕනෑම සතුරු හෝ පිළිගත නොහැකි තත්ත්වයකට ඔවුන්ගේ සූදානම සහ අනුගත වීමේ හැකියාව මතය. මෙය ජනතාවගේ ආරක්ෂාව හෝ අත්‍යවශ්‍ය සේවා හෝ ජාතික වත්කම් ආරක්ෂා කිරීම විය හැකිය. ඒ අනුව, ජාතික ආරක්ෂාව අරභයා වන බහුවිධ මානයන් සැළකිල්ලට ගෙන රජය විසින් මාධ්‍ය කාලීන රාමුව තුළ ක්‍රියාත්මක කරන ප්‍රධාන ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් ක්‍රමෝපායයන් පහත දැක්වේ.

➢ **ශක්තිමත් ප්‍රතිපත්තිමය රාමුවක් හා නෛතික විධි විධාන**

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක යාන්ත්‍රණයක අවශ්‍යතාව අවබෝධ කරගත් රජය ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන ලද අතර එය සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියේ විෂය පථය විස්තර කිරීම සඳහා ජනාධිපතිතුමා විසින් නව මාර්ගෝපදේශ ලබා දී ඇති අතර ඒ අනුව කෙටුම්පත සංශෝධනය කරනු ඇත. සංශෝධිත ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය ශ්‍රී ලංකාවට බලපාන පුළුල් ආරක්ෂක ගැටළු ආමන්ත්‍රණය කරමින් අදාළ සියලු පාර්ශවවල සහභාගීත්වය සහිතව, අනාගතවාදී සහ විස්තීරණ ආකාරයෙන් ජාතික ආරක්ෂක යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට නව ජවයක් ලබාදෙන ආකාරයෙන් සකස් කෙරෙනු ඇත.

එමෙන්ම, ජාතික බුද්ධි පනතේ කෙටුම්පත සමාලෝචනය සඳහා ජනාධිපතිවරයා වෙත භාරදී ඇති අතර අධිකරණ අමාත්‍යවරයා සහ ආරක්ෂක අමාත්‍යවරයා විසින් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික බුද්ධි පනත හඳුන්වාදීමේ අරමුණ වන්නේ බුද්ධි ආයතනවල ක්‍රියාකාරකම් නියාමනය කිරීමට සහ ඒවායේ මෙහෙයුම් වලට සහාය වීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් සිදුවිය හැකි අඩුපාඩු වැළැක්වීමයි. ඒ අනුව, ජාතික බුද්ධි පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව අනුව ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

➢ **ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලෝපායික සැලැස්ම - 2020-2025**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලෝපායික සැලැස්ම යනු අනාගත ආරක්ෂක තර්ජනයන්ට මුහුණ දීම සඳහා සහ ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රතිඵලදායි ලෙස ක්‍රියා කිරීම උදෙසා සංග්‍රාමික මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උපාය මාර්ගික වශයෙන් නැඹුරු වූ පස් අවුරුදු නවීකරණ සැලැස්මයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංග්‍රාමික මෙහෙයුම් කාර්යක්ෂමතාව, උපකරණ පරිමාණයන් නවීකරණය සහ නඩත්තු කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් වසර ගණනාවක් පුරා පසුබෑමකට ලක්ව ඇත. ජාතික ආපදා වලදී රජයේ ඉල්ලීම්වලට ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමට හමුදාවේ හැකියාවන් සහ ධාරිතාව සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම කෙරෙහි මෙම තත්ත්වය අහිතකර ලෙස බලපා ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සකසන ලද දස අවුරුදු අයවැය සැලැස්ම මඟින් 2020-2025 ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලෝපායික සැලැස්ම අනුව 2023 වර්ෂය සඳහා ආයුධ සහ සංග්‍රාමික හැකියාවන් වැඩිදියුණු කිරීම, සයිබර් ආරක්ෂාව, යාන්ත්‍රික සහ ප්‍රවාහන හැකියාව, ආපදා කළමනාකරණ හැකියාව, ඉංජිනේරු (යාන්ත්‍රික, ක්ෂේත්‍ර සහ රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ඉහළ ඵලදායී බවක් සහිත පුපුරණ ද්‍රව්‍ය (CBRNE)) හැකියාවන්, සංඥා සහ තොරතුරු තාක්ෂණ හැකියාවන්, පුහුණුවීම් ආශ්‍රිත සංවර්ධනය මෙන්ම සංග්‍රාමික උපකරණ (Combat Gears) සහ පර්යේෂණ සහ සංවර්ධන හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා වන රුපියල් බිලියන 27.24ක මුළු පිරිවැයකින් යුත් ව්‍යාපෘති 17ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

වර්තමානයේ රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හේතුවෙන් පෙර වසර සඳහා සැලසුම් කරන ලද ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වුව ද සටන් කාර්යක්ෂමතාව, හැකියාව සහ ධාරිතා සංවර්ධනය ක්‍රමානුකූලව ගොඩනැගීමට මෙම ව්‍යාපෘති ඉවහල් වන හෙයින් 2023 වර්ෂය තුළ එම ව්‍යාපෘති ද ඇතුළුව අත්‍යවශ්‍ය අනෙකුත් ව්‍යාපෘති 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. නවීකරණය, උපකරණ සහ යටිතල පහසුකම් සංවර්ධනයේ මෙම මන්දගාමී ප්‍රගතිය හමුදාවේ සංකල්පීය, භෞතික හා සදාචාරාත්මක සංවර්ධනයට ඉදුරාම බලපාන බැවින්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංග්‍රාමික මෙහෙයුම් සූදානම ප්‍රශස්ත කිරීම ජාතික ආරක්ෂාව සහතික කිරීමේදී මූලික අවශ්‍යතාවයක්ව පවති.

එබැවින්, සංග්‍රාමික මෙහෙයුම්, ආපදා කළමනාකරණයේ සිට ජාතිය ගොඩනැගීමේ කඩිනම් බලපෑම් ව්‍යාපෘති දක්වා ජාතික ආරක්ෂාව පිළිබඳ සියලු කාරණාවලට ප්‍රතිචාර දැක්වීමේදී සහ ආර්ථිකය සංවර්ධනය කිරීම හා ස්ථාවර කිරීමේදී සාමකාමී වාතාවරණයක් පවත්වාගැනීම උදෙසා ගොඩබිම් බලකාය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වැඩි දියුණු කොට පවත්වාගෙන යාම තිරණාත්මක සාධකයක් බැවින් ඒ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. එමෙන්ම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දස අවුරුදු අයවැය සැලැස්මේ අයවැය පුරෝකථනය මූල්‍ය අර්බුදයේ ආදීනව සැළකිල්ලට ගනිමින් සමාලෝචනය කිරීමට අපේක්ෂිතය.

➢ **සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම**

දිවයින වටා පවතින කි.මී 1,340ක පමණ වෙරළ තීරය, ගොඩබිම සිට මූලික රේඛාවේ 12 NM දක්වා පවතින දේශීය ජල තීරය (ගොඩබිමේ විශාලත්වයෙන් 1/3 ක පමණ), යාබද මුහුදු කලාපය, (මූලික රේඛාවේ 24NM දක්වා) අනන්‍ය ආර්ථික කලාපය (මූලික රේඛාවේ සිට 200NM දක්වා) ඇතුළු වර්ග කි.මී 1,712,452 පමණ වන සුවිසල් මුහුදු තීරය යන කලාපයන්හි ආරක්ෂාව, සෙවුම් කටයුතු සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සිදු කිරීම සහ එහි වගකීම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් දරනු ලබයි. තවද, ඉන්දියන් සාගරයේ ප්‍රධාන මුහුදු මාර්ගයේ කෙන්ද්‍රගතව අප මාතෘ භූමිය පිහිටා ඇති අතර, ලෝකයේ තෙල් වලින් 66%ක්, තොග භාණ්ඩ වලින් 40%ක් සහ බහාලුම් නැව්ගත කිරීම් වලින් 60%ක් හුවමාරු වන්නේ එම මාර්ගය හරහාය. තවද, සාගර කලාපවල පවත්නා ආරවුල්, අර්බුද සහ ගැටුම් හරහා ඇති වී තිබෙන අන්තර්ජාතික ආරක්ෂක තත්ත්වය හා භූ දේශපාලනික වතාවරණය සෘජුවම ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට විශේෂ වැදගත්කමක් ඇති කරනු

ලබන අතර ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම නාවික හමුදාවට දැරීමට සිදුවේ.

එපමණක් නොව වර්තමාන සතුරු ක්‍රියාකාරකම් සලකා බැලීමේ දී ඒවා සූක්ෂම, ජාලගත සහ සාම්ප්‍රදායික නොවන බව හඳුනාගෙන ඇත. එබැවින්, ත්‍රස්තවාදී තර්ජන, ජාත්‍යන්තර අපරාධ, මුහුදු මංකොල්ලකෑම් හා තහනම් ධීවර කටයුතු යනාදිය තුලින් ඉන්දියන් සාගරය දැඩි අවදානමකට ලක්විය හැකිය. එම අවදානමට මුහුණ දීමට නාවික හමුදාව ශක්තිමත් විය යුතු අතර මෙලෙස අභියෝග බවට පත්ව ඇති ඉන්දියන් සාගර කලාපය තුළ සිදුවන නීතිමය නොවන, වාර්තා නොවන හා විධිමත් නොවන ධීවර කටයුතු (IUU) පිළිබඳව කටයුතු කිරීම ප්‍රධාන අභියෝගයක් වන අතර, එය ශ්‍රී ලංකාව මෙන්ම අනෙකුත් කලාපීය රටවල ආරක්ෂාවට තර්ජනයක් විය හැකිය.

ඉහත කරුණු සලකා බැලීමේදී, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉන්දියන් සාගර කලාපය තුළ බුද්ධි තොරතුරු ලබාගැනීම, ආවේක්ෂණ හා නිරීක්ෂණ කටයුතු වැඩි දියුණු කරගැනීම සහ ඔත්තු බැලීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම මඟින් කලාපය තුළ ශ්‍රී ලංකා රාජ්‍යයේ සමුද්‍රීය ස්වෛරීභාවය ඇතිකර ගැනීමට හා අනාගතයේ ඇතිවිය හැකි අභියෝග පිළිබඳව දැනුවත් වී සිටීමට උපකාරී වේ. මේ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍රීය ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම රජයේ ප්‍රධානතම උපායමාර්ගය වී ඇත. ඒ සඳහා පහත කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා බලඝණය ශක්තිමත් කිරීමෙන් අප මුහුදු සීමාවේ ආරක්ෂාව සහතික කර එම මුහුදු සීමාව සියලු ජාතීන්ගේ නිදහස් නෞකා ගමනාගමනයන් නිසි ආරක්ෂාවකින් සිදු කිරීමට සහ සියලු නාවික කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට මහ සැලසීමේ වගකීම නිසි අයුරින් ඉටු කිරීම සඳහා මිත්‍ර රටවල සහයෝගයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට නෞකාවන් ලබා ගැනීමට කටයුතු කිරීම.
- නෞකා තුළ යල්පැනගිය පද්ධති හා උපකරණ ප්‍රතිස්ථාපනය කිරීම, විශේෂයෙන් ම සන්නිවේදන උපකරණ, ක්ෂුද්‍ර තරංග සම්බන්ධතා සඳහා අවශ්‍ය පද්ධති ප්‍රතිස්ථාපණය කිරීම තුළින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික මෙහෙයුම් ශක්තිය වැඩි දියුණු කර ගැනීම සහ ඉන්දීය සාගරික කලාපය තුළ සිදුවිය හැකි සිදුවීම් සම්බන්ධව කල් වේලා ඇතිව දැන ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීම.
- එක්සත් ජනපද රජයෙන් විදේශ හමුදා ආධාර යටතේ සංවේදක ස්ථාපනය කිරීමෙන්, ශ්‍රී ලංකාව තුළ මිනිස් ජාවරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අනෙකුත් සංවිධානාත්මක අපරාධ වැනි විවිධ අභියෝගවලට එලදායි ලෙස මුහුණ දීම.
- ඉන්දියානු රජයේ ආධාර යටතේ සමුද්‍රීය ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය පිහිටුවීම තුළින් ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවාගැනීමේ කලාපයේ (වර්ග කිලෝමීටර් 1,712,452 ක ප්‍රමාණයක් එනම් රටෙහි භූමි ප්‍රමාණය මෙන් 27 ගුණයක්) ආපදාවකදී (SAR) අත්‍යවශ්‍ය වන මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම සඳහා සහ ගුවන් හා මුහුදු ගලවාගැනීමේ සම්බන්ධීකරණ කටයුතු ශක්තිමත් කර ගැනීම.
- ශ්‍රී ලංකාව තුළ පවතින මූල්‍ය අස්ථාවරත්වය හමුවේ අප බලාපොරොත්තු වන විදේශ ආදායම උපයාගැනීමට උපයෝගි වන ලෙබනන් රාජ්‍යයේ යොදවා ඇති එක්සත් ජාතීන්ගේ සමුද්‍රීය කාර්යසාධක බලකාය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකාවන් සහ පුද්ගලයින් යෙදවීමට සුදුසු කටයුතු සොයා බැලීම.
- ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ පුහුණු කටයුතු යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය දැනුම ඉන්දියාව, ඔස්ට්‍රේලියාව, චීනය, බංගලාදේශය සහ පාකිස්තානය වැනි මිත්‍ර නාවික හමුදාවලින් උපකාර ලබාගැනීමෙන් නාවික පුද්ගලයන්ගේ තාක්ෂණික, පරිපාලන හා කළමනාකරණ බුද්ධිය වර්ධනය කිරීම.

- මිත්‍ර නාවික හමුදාවන් සමඟ එක්ව නාවික ක්‍රියාකාරකම් හා අභ්‍යාසයන් වැඩි වශයෙන් සිදු කිරීම තුළින් ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ ප්‍රායෝගික හැකියාවන් වර්ධනය කර ගැනීම.
- දූපත් රාජ්‍යයක් වශයෙන්, තිරසාර සාගර පරිසර පද්ධතියක් පවත්වා ගැනීම සඳහා මුහුදු සහ ඒ ආශ්‍රිත පාරිසරික පද්ධතිය ආරක්ෂා කිරීමට නාවික සමාජ වගකීම් ව්‍යාපෘති ලෙස සමුද්‍ර සංරක්ෂණය, පවතින සමුද්‍ර සංචාරක ව්‍යාපාරය සහ වෙරළබඩ ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව පියවර ගැනීම.
- ශ්‍රී ලංකා මුහුදු ජලතීරය සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ ඒකාබද්ධව දිග දුර සමුද්‍රීය ගුවන් ගලවාගැනීම් සහ නිරීක්ෂණ කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ ඒකාබද්ධව ගුවන් - මුහුදු ගලවා ගැනීමේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.

➢ **ගුවන් නිරීක්ෂණ වැඩි කිරීම**

වර්තමාන ශක්තීන් ආරක්ෂා කර ගනිමින් හා තවදුරටත් වැඩිදියුණු කරමින් සිය මෙහෙයුම් සූදානම උපරිම කිරීම සඳහා අවශ්‍ය ඉදිරි සැලසුම් සකස් කරමින් ජාතික ආරක්ෂක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව ගුවන් වත්කම් භාවිතා කරනු ලබයි. ඒ අනුව, ගුවන් මෙහෙයුම් ශක්තීන් වැඩි දියුණු කිරීම සඳහා පහත කාර්යයන් නිම කිරීමට කටයුතු කරනු ඇත.

1. අධි ප්‍රහාරක හැකියාවෙන් යුත් කෆීර් යානා (Kfir Aircraft) 05ක් විදේශ විශේෂඥ මග පෙන්වීම යටතේ දේශීයව අලුත් වැඩියා කටයුතු සිදු කරමින් පැවතීම සහ එම්අයි-17 (MI-17) හෙලිකොප්ටර් යානා 16ක පිරිවැඩියා කටයුතු කිරීමට මූලික පියවරයන් ගැනීම.
2. Dornier වර්ගයේ ගුවන් යානාවක් ඉන්දීය ආණ්ඩුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ප්‍රවිශ්ට කිරීම.
3. ගෝලීය අභියෝගතා ජයගැනීම උදෙසා සයිබර් තාක්ෂණය භාවිතා කිරීම.
4. අභ්‍යවකාශ මෙහෙයුම් වලට අදාළ මූලික අඩිතාලම දැමීම.
5. මිනිසුන් රහිත ගුවන් යානා (UAV) තත්ත්වයෙන් උසස් කිරීම සහ වැඩි වශයෙන් යොදා ගැනීම මෙන්ම ශ්‍රී ලංකාව තුළ නිපදවීම සඳහා නව තාක්ෂණය ලබා ගැනීමට පියවර ගැනීම.
6. Y-12IV සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා දෙකක් සහ පුහුණු හෙලිකොප්ටර් යානා දෙකක් අත්පත් කර ගැනීමට සහ නිරීක්ෂණ හා සටන් ගුවන් යානා කිහිපයක් නවීකරණය කිරීම සඳහා පහසුකම් සැළසීම.
7. ස්වයංක්‍රීය යැපුම් නිරීක්ෂණ විකාශන (ADS-B) ගුවන් යානා නිරීක්ෂණ පද්ධතිය සංවර්ධන කිරීම.
8. ගුවන් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ (ADOC) ගුවන් ආරක්ෂක රේඩාර් බලඝණවල ගුවන් ආරක්ෂක සිමියුලේටර් පද්ධතිය වැඩි දියුණු කිරීම.
9. ශ්‍රී ලංකා ගුවන් හමුදා මීරිගම කඳවුරේ ගුවන් ආරක්ෂක අණ හා පාලන මධ්‍යස්ථානය වෙත ගොඩබිම සිට ගුවන්යානා දක්වා සන්නිවේදන අධීක්ෂණ පද්ධතියක් පාදක කරගත් අන්තර්ජාල ප්‍රොටෝකෝලය සංවර්ධන කිරීම.
10. මත්තල රාජපක්ෂ ගුවන් තොටුපලෙහි ශ්‍රී ලංකා ගුවන් හමුදා (ශ්‍රීලංගුහ) ඒකකයක් පිහිටුවීම.

- **ත්‍රස්තවාදය / අරගල හා අන්තවාදී කණ්ඩායම්වල නැඟී සිටීම වැළැක්වීම**

රටේ ආර්ථික, සාමාජීය හා දේශපාලන අස්ථාවරත්වය ඇතිවන අයුරින් හා සාමකාමී පරිසරයට බාධාවන අයුරින් රට අරාජික කිරීමේ අරමුණින් පෙළ ගැසෙන විවිධ සමාජ කණ්ඩායම්, බහුවිධ ආගමික/ සංස්කෘතිමය / සමාජමය වශයෙන් අන්තවාදී අදහස් වලින් පෝෂණය වූ පිරිස් හා දේශීය සහ අන්තර්ජාතික වශයෙන් ත්‍රස්තවාදය වපුරන කණ්ඩායම් හා සාධක ඉවත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය ත්‍රිවිධ හමුදාවන් සමඟ සම්බන්ධීකරණයෙන් හා අනුබද්ධ ආයතනවල සහයෝගයෙන් පැය 24 පුරා දිවයිනම ආවරණය වන පරිදි බුද්ධි සේවා ක්‍රියාත්මක කිරීම, ධීවර වරායන් 24ක් ආවරණය වන පරිදි ධීවර කටයුතුවල නියැලෙන ධීවර යාත්‍රා නිරීක්ෂණ කිරීම, ගොඩබිමේ සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ ආවේක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා වීඩියෝ පහසුකම් සහිත අංග සම්පූර්ණ රථයක් නිර්මාණය කර අවේක්ෂණ රාජකාරී සඳහා යෙදවීම, සියලුම ආකාරයේ ත්‍රස්තවාදී හා අන්තවාදී කණ්ඩායම් හඳුනා ගැනීම සහ එම සාමාජිකයන් අත්අඩංගුවට ගැනීම, පුනරුත්ථාපනය කිරීම මඟින් ත්‍රස්තවාදී හා අන්තවාදී ක්‍රියා මැඩපැවැත්වීම, මිනිස් ජාවාරම හා නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම නැවැත්වීම, සමුද්‍රීය ආරක්ෂාව තර කිරීමට සාගර ආවේක්ෂණ කටයුතු පුළුල් කිරීම, අන්තර්ජාතික ත්‍රස්තවාදී කණ්ඩායම්වල තර්ජන හඳුනාගෙන ඒ පිළිබඳව අදාළ බුද්ධි අංශ සමඟ ක්‍රමානුකූලව කටයුතු කිරීම සිදු කරමින් පවතින අතර එම කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- **නීති විරෝධී මත්ද්‍රව්‍ය / තහනම් භාණ්ඩ හා සේවා රට තුළට ආවේෂණය වීම වැළැක්වීම**

ගුවනින් හෝ ගොඩබිම් හෝ සාගරික මාර්ග ඔස්සේ රට තුළට ප්‍රවාහනය කෙරෙන නීති විරෝධී මත්ද්‍රව්‍ය / තහනම් භාණ්ඩ හා සේවා රට තුළට ආවේෂණය වීම වැළැක්වීම උදෙසා ආරක්ෂක අංශ ක්‍රියා කරයි. ඒ සඳහා ත්‍රිවිධ හමුදා හා බුද්ධි අංශවලින් සැදුම්ලත් කණ්ඩායම් විසින් දෛනික වැටලීම් සිදුකරන අතර එම කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- **ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ ජාතික වැඩපිළිවෙළ ශක්තිමත් කිරීම**

ශ්‍රී ලංකාව තුළ ගංවතුර, නායයෑම්, සුනාමි, නියඟ, සුළි කුණාටු ඇතුළු බොහෝ ස්වාභාවික විපත් සහ කාලගුණික හා දේශගුණික බලපෑම් මඟින් ඇතිවන වසංගත රෝග තත්ත්වයන් ද සීඝ්‍ර ලෙස ඉහළ යන පසුබිමක ආපදාවලින් ජනතාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කර ගැනීමත්, රටේ පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහාත් සන්නද්ධ හමුදාවන්ගේ සහය ලබා දෙයි.

ආරක්ෂක අමාත්‍යාංශය ආපදා අවදානම් අවම කිරීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා දායක වන අතරම පුද්ගලයන්ගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම සම්බන්ධ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. 2023 වසරට අදාළ ව්‍යාපෘති 95ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීමේ අරමුණින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ආපදාවලට ඔරොත්තු දෙන නිවාස සහ ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරයි. එමෙන්ම, ඉදිරියේ දී ඇතිවිය හැකි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආපදා සහන සේවා සඳහා වූ පෙර සූදානම් සඳහා සැලසුම් කිරීම වෙනුවෙන් “ආපදා සහන සේවා පෙර සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සැලැස්ම” ක්‍රියාත්මක කිරීම, නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය වඩාත් කාර්යක්ෂම කර කඩිනමින් අධි අවදානම් ප්‍රදේශවල සිටින ජනතාව නැවත පදිංචි කිරීම, සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම, වඩාත් කාර්යක්ෂමව නිවැරදිව තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාල දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීම, නිවාස හානි වන්දි ගෙවීම කඩිනම් කිරීම 2023 වසරෙහි ඉලක්ක අතර ප්‍රමුඛ කාර්යයන් වේ.

➢ **රණවිරුවන්ගේ සහ රණවිරු දෑ දරුවන්ගේ අධ්‍යාපනය/ විනය හා නායකත්වය ප්‍රවර්ධනය**

ත්‍රස්තවාදය පිටුදැකීම උදෙසා රටේ ආරක්ෂාව වෙනුවෙන් ස්වකීය ජීවිතය කැප කළ, අතුරුදහන් වූ සහ සටන්බිම රණක්ෂිතයට පත් රණවිරුවන්ටත් දැනට සක්‍රීය සේවයේ සිටින රණවිරුවාට සහ රණවිරු පවුල්වලටත් සුබසාධනය සලසන ආරක්ෂක අමාත්‍යාංශය රණවිරුවන්ගේ සහ රණවිරු දෑ දරුවන්ගේ අධ්‍යාපනය ප්‍රමුඛතම සාධකයක් කොට සළකයි.

ජාතික ආරක්ෂක විද්‍යායතනය, කොත්මලේ ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය, ජාතික ආරක්ෂක විද්‍යායතනය, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වැනි ආයතන සන්නද්ධ හමුදාවන්හි දැනුම, කුසලතා වර්ධනය කරන අතර, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ජාතික ආරක්ෂාවට සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම තුළින් නව නිපැයුම් දැයට තවදුරටත් දායාද කරනු ඇත.

එමෙන්ම, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳගනිමින් ආරක්ෂක සේවා විද්‍යාලය (කොළඹ/කුරුණෑගල) රණවිරුවන්ගේ දෑ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතාවය සපුරාලන අතර ජාතික ශිෂ්‍යභට බලකාය මෙරට ශිෂ්‍ය ප්‍රජාව තුළ දැනුම/ කුසලතා/ විනය / නායකත්වය තුළින් යහපත් දරු පරපුරක් රටට දායාද කිරීමට පෙරමුණ ගනියි. අධ්‍යාපනයෙන් ඔබ්බට ගොස් සමස්ත රටෙහිම දරුවන්ගේ විනය, ශික්ෂණය, නායකත්වය වැනි ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ජාතික ශිෂ්‍යභට බලකාය නිහඬ මෙහෙවරක නියැළෙන අතර එය අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත. ජාතික ශිෂ්‍යභට බලකායේ මෞලි මංගල්‍යය ලෙසින් සැළකෙන "හර්මන්ලෝස් කඳවුර" විදෙස් රටවල ශිෂ්‍ය භටයින්ගේද සහභාගීත්වයෙන් පවත්වමින් සාක් කලාපීය රටවල සහයෝගීතාවය වැඩිදියුණු කිරීමට ද අපේක්ෂා කෙරේ.

තවද, ආරක්ෂක සේවා විදුහල් වල (කොළඹ/කුරුණෑගල) අධ්‍යාපනය ලබන රණවිරු දෑ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් වෙමින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සිසුන්භට නවීන යටිතල පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් සිසු අයිතියට පත් කිරීමට නියමිත අතර, කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයේ පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ද සිසු අයිතියට පැවරීමට නියමිතය.

➢ **වෙරළ තීරය ආරක්ෂා කිරීම**

ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව නාවික හමුදාව සමඟ සම්බන්ධීකරණයෙන් ශක්තිමත් වැඩපිළිවෙළක් දියත් කර ඇත. ඒ අනුව රටවටා මුහුදු තීරය ආරක්ෂක කිරීමට මුර සංචාර වැඩි කිරීම, නවීන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම, වෙරළ පරිසරය සංරක්ෂණය, නැව් තටාකාංගණ හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි අංශ කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත.

ඒකීය රටක් තුළ සාමය සහ සහජීවනය ප්‍රවර්ධනය කරමින් මහජනතාවට සුරක්ෂිතව ජීවත් වීමට හැකි යහපත් රටක් නිර්මාණය කිරීම උදෙසා රජය ගෙනයන වැඩපිළිවෙළට සහයෝගය ලබාදීම ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රමුඛතම ඉලක්කයයි.

පරිච්ඡේදය
3
වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

ආරක්ෂක අමාත්‍යාංශය

3.1.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

2022.12.31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තත්‍ය 2022	තත්‍ය 2021	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		**2,489,570,878**	**6,333,769,327**	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	42,416,904	24,085,657	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	2,447,153,974	6,309,683,670	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		**2,489,570,878**	**6,333,769,327**	
-	**ආදායම් නොවන ලැබීම්**		**12,277,310,618**	**11,911,589,166**	
-	භාණ්ඩාගාර අග්‍රිම		11,578,631,743	11,533,738,000	ඒසිඒ-3
-	තැන්පතු		599,770,908	298,623,644	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		98,907,967	79,227,522	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**12,277,310,618**	**11,911,589,166**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**14,766,881,496**	**18,245,358,493**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**10,371,888**	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**14,756,509,608**	**18,245,358,493**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
3,190,073,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	2,931,454,986	1,931,248,282	
1,158,513,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,163,951,943	829,691,658	ඒසිඒ-2(ii)
10,602,840,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	10,426,765,508	9,436,949,784	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	968,932	
14,951,426,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**14,522,172,437**	**12,198,858,656**	
	මූලධන වියදම්				
51,195,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	27,336,290	46,614,175	
343,465,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	209,136,048	8,288,156,006	
700,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	541,366,757	96,184,000	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
8,500,000	හැකියා වර්ධනය	14	8,058,657	5,663,679	
9,435,830,000	වෙනත් මූලධන වියදම්	15	11,952,457,734	57,331,857	
10,538,990,000	**මුළු මූලධන වියදම් (උ)**		**12,738,355,487**	**8,493,949,717**	
	තැන්පතු ගෙවීම්		173,252,157	336,352,029	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		114,090,189	59,180,932	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**287,342,346**	**395,532,961**	
25,490,416,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		27,547,870,270	21,088,341,333	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(12,791,360,661)**	**(2,842,982,839)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(12,791,360,661)	(2,842,982,839)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(12,791,360,661)	**(2,842,982,839)**	

3.1.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

ඒඑස්-6

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑස්-6	42,815,874,169	36,714,333,377
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් හිඟුම්	ඒඑස්-5/5(ඒ)	228,696,196	213,513,974
මුලද් හා මූලද් සමාන දෑ	ඒඑස්-5	-	-
මුළු වත්කම්		43,044,570,365	36,927,847,351
ශුද්ධ වත්කම් / ස්ථානිකය			
ආයෝජකාරය වෙත ශුද්ධ වත්කම්		(713,199,603)	(301,863,073)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		42,815,874,169	36,714,333,377
කුලී හා වැඩි අත්තිකාරම් සංචිතය	ඒඑස්-5(බී)		
ජංගම වගකීම්			
නැන්පත හිඟුම්	ඒඑස්-4	941,895,795	515,377,047
අනුමිම ගෙවීම්	ඒඑස්-3	-	-
මුළු වගකීම්		43,044,570,365	36,927,847,351

මිටු අංක 07 සිට 85 දක්වා ඒඑස් 1 සිට ඒඑස් 7 දක්වා වූ ආකාති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන හිඟුම් නොරතුරු සහ ඇතුළුම් මිටු අංක 86 සිට 104, දක්වා ඇතුලත් හිඟුම් සටහන් විස්තර ද මෙම මූල්‍ය ප්‍රකාශන හිඟුම්මෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සිදිහැලෙල කිරීම සොදුවේ සිදුවන් හිඟුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් පලදෙදිරට කර දැනි පරිදි විධාන් සූදුනූ හිඟුම්කරණ ප්‍රතිපත්ති සවිත කර ඇත. ඉහත අවසන් හිඟුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට පදාළ හිඟුම් සටහන් හා අනෙකුත් හිඟුම් තොරතුරු ගණන්ධාරක හිඟුම් පනත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම පංචාය සමග එකහ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ධාරිතාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ පවත්නාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචනය කිරීමත් බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකාරී නිලධාරී	ගණකාධිකාරී නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මූල්‍ය) කොමඩෝර්
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023.02	දිනය : 2023.02	දිනය

දීප්තා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූල්‍යාරක්ෂක සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

2

3.1.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	21,524,711	10,942,692
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,090,426,468	1,180,569,596
අග්‍රිම ලැබීම්	12,066,410,675	12,037,199,495
අත්තිකාරම් අයකර ගැනීම්	141,285,587	68,827,085
තැන්පතු ලැබීම්	571,627,250	298,623,644
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**13,891,274,690**	**13,596,162,512**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	3,716,613,046	2,584,016,693
සහනාධාර සහ මාරුකිරීම්	375,836,009	358,276,542
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,510,039,876	1,683,415,508
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	498,150,820	503,461,495
අත්තිකාරම් ගෙවීම්	121,988,898	58,234,264
තැන්පතු ලැබීම්	168,694,868	336,352,029
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**6,391,323,516**	**5,523,756,530**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**7,499,951,174**	**8,072,405,981**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-

භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	7,499,951,174	8,072,405,981
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**7,499,951,174**	**8,072,405,981**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(7,499,951,174)**	**(8,072,405,981)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.1.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - ආරක්ෂක අමාත්‍යාංශය

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය
   2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිණුම්කරණ පදනම
   මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

   මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම
   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම
   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

   දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපල, පිරියත හා උපකරණ සංචිතය
   මෙම සංචිත ගිණුම් දේපල, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

   2022 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට අමාත්‍යාංශයේ දේපල, පිරියත හා උපකරණවල වටිනාකම අන්තර්ගත ඒසීඒ 06 ආකෘතියේ 2022.01.01 දිනට ආරම්භක ශේෂය හා 2022.12.31 දිනට එම අගයෙහි රුපියල් 834,346,886.00 වෙනසක් පවතින අතර එම වෙනස පිළිබඳව පැහැදිලි කිරීමක්/ සැසඳීමක් පිටු අංක 83 හා 84 හි ඉදිරිපත් කර ඇත.

6. මුදල් හා මුදල් සමාන දෑ
   2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

   යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනු දෙනු ඇති අවස්ථාවලදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත්කර ගත හැක. එසේම “ වාර්තාකරණ පදනම” යටතේ එම විශේෂිත ගනු දෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

   තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතුය.

3.1.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

ආදායම් සංකේතය	විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	අවසන් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1003.07.05	ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු	20.05	20.00	37.57	171%
2003.06.00	එ.ජා.සා.මෙහෙයුම් තුළින් ලද ආදායම	1,416.26	4,053	2,447.15	60%

3.1.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම(රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු)	අවසාන ප්‍රතිපාදනය (රු)		
පුනරාවර්තන	633,250,000.00	738,719,000.00	686,461,958.85	71%
ප්‍රාග්ධන	246,480,000.00	247,880,000.00	107,737,223.80	13%

3.1.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - ආරක්ෂක අමාත්‍යාංශය

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
01	පොලිස් දෙපාර්තමේන්තුව	රාජ්‍ය බුද්ධි සේවයේ වැටුප්	840,100,000	-	840,100,000	**100%**
02	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සුභුරුපාය ගොඩනැඟිල්ලෙහි ණය වාරික හා පොළී ගෙවීමට	568,920,000	-	568,920,000	**100%**

3.1.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

- **ආරක්ෂක අමාත්‍යාංශය**

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	135,259,230.47	135,259,230.47		100%
9152	යන්ත්‍රෝපකරණ	4,523,689,355.70	4,523,689,355.70		100%
9153	ඉඩම්	1,861,500,000.00	1,861,500,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්		-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	35,900,000.00	35,900,000.00		100%

- **සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශයේ 2022.01.01 සිට 2022.12.31 දක්වා මූල්‍ය කාර්යය සාධනය**

අනු අංකය	විස්තරය	2022.01.01.සිට 2022.12.31දක්වා මුළු ආදායම (රු.)
		මුදලින්
01	ගිනි අවි	6,584,130.00
02	පතරොම්	131,450.00
03	අන්තරායකර බහාලුම් සහිත නැව් මෙහෙයුම්	6,156,000.00
04	සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු	4,045,000.00
05	පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන	4,971,300.00
එකතුව		**21,887,880.00**
දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදල් ලැබීම්		
05	ගිනි අවි බලපත්‍ර ගාස්තු	5,954,426.00
06	පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර ගාස්තු	8,689,400.00
මුළු එකතුව		**36,531,706.00**

- **රාජ්‍ය බුද්ධි අංශයේ 2022.01.01 සිට 2022.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

ප්‍රතිපාදන වර්ගය	වෙන් වූ ප්‍රතිපාදනය (රුපියල්)	වියදම් වූ ප්‍රමාණය (රුපියල්)
පුනරාවර්තන	2,729,060,000.00	2,602,221,256.33
ප්‍රාග්ධන	127,200,000.00	89,586,801.40

- **ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2022.01.01 සිට 2022.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

විස්තරය	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රුපියල්)	2022.12.31 දිනට වියදම (රුපියල්)
පුනරාවර්තන	181,000,000.00	165,131,294.56
ප්‍රාග්ධන	40,000,000.00	31,850,105.90
එකතුව	**221,000,000.00**	**196,981,400.46**

- **ආරක්ෂක සේවා විද්‍යාලයේ 2022.01.01 සිට 2022.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

අනු අංකය	සංවර්ධන ව්‍යාපෘති	2022 වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු. මිලියන)	2022.12.31 වන දිනට වියදම (රු. මිලියන)
1	ආරක්ෂක සේවා විදුහල (කොළඹ) සිසු නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය	**50.00**	20,562,850.14 (ED/5/78/2/1/3 හා 2022.11.29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලිපියට අනුව 2022.10.31 දිනට වියදම)
2	ආරක්ෂක සේවා විදුහල (කුරුණෑගල) පොදු පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය	**70.00**	61,647,121.43 (ඩීජීසිඉ/ඩීඅයිආර්/ඩබ්ලිව්ඊස්ටී/28/2017 හා 2022.12.31 දිනැති නාවික හමුදා මූලස්ථාන ලිපියට අනුව 2022.12.31 දිනට වියදම)

*** ඉහත ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත වෙන්කර දෙනු ලැබේ.**

- **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2022.01.01 සිට 2022.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

අයිතම විස්තරය	ප්‍රති සංශෝධිත ඇස්තමේන්තුව (රු.මි.)	මුළු වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
පුනරාවර්තන වියදම් - රාජ්‍ය ආයතන (පුද්ගල පඩිනඩි)	233.00	204.85	88%
පුනරාවර්තන වියදම් - රාජ්‍ය ආයතන (වෙනත් - මෙහෙයුම් වියදම්)	85.00	76.2	90%
මූලධන වියදම්	121.00	94.86	78%
එකතුව	**439.00**	**375.91**	**86%**

- **ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ 2022.01.01 සිට 2022.01.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

විස්තරය	ප්‍රතිපාදන වෙන් කිරීම (රු)	වියදම (රු)	ඉතිරිය (රු)
පුනරාවර්තන වියදම්	82,400,000.00	81,379,071.81	1,020,928.19
ප්‍රාග්ධන වියදම්	3,100,000.00	423,350.78	2,676,649.22
එකතුව	**85,500,000.00**	**81,802,422.59**	**3,697,574.41**

3.1.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව - ආරක්ෂක අමාත්‍යාංශය



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. } ඩීඊඑන්/සී/එම්ඕඩී/02/22/එන්ඒ/11 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව සහ සහතික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } ඩී්එන්/සි/එම්ඕඩී/02/22/එන්ඒ/11 මඹේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 103- ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේදයට යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.1.3 (අ)	අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (05) ඡේදය හා මුදල් රෙගුලාසි 128(2)(ඒ) හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හි ආර්ථික තත්වයේ වෙනස්කම් සැළකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපිව සංශෝධනය කළ යුතු වුවත් 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කිරීම සමාලෝචිත වර්ෂය තුළදීද සිදු කර නොතිබුණි.	1/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ii කොටසේ (05) ඡේදය ප්‍රකාරව අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර වසර 3 කට වරක් සංශෝධනය කළ යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ආදායම් සංකේතාංක 20.03.06.00 එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් ලද ආදායම් ලෙස ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාව පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 8,211,373.98 හා 10,965,751.85ක් ලෙස එකතුව එක්සත් ජනපද ඩොලර් 19,177,125.83 ක් රැස්කර ඇතත්, ඒසීඒ -1 ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස එක්සත් ජනපද ඩොලර් 7,506,868.47 ක් හෙවත් රු.2,447,153,974ක් පමණක් දක්වා තිබුණි. තවද මෙම ආදායමින් එක්සත් ජනපද ඩොලර් 8,057,402.58 ක් 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව රාජ්‍ය ආදායමට බැරකර තිබුණු අතර එක්සත් ජනපද ඩොලර් 3,612,804.78 ක් ණයවර ලිපි විවෘත කිරීමේ පහසුව සඳහා භාණ්ඩාගාර එකහතාව මත යුධ හමුදා විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක රඳවා ගෙන තිබුණි. ඒ අනුව

සමාලෝචිත වර්ෂයේ ආදායම එක්සත් ජනපද ඩොලර් 11,670,207.36 ක ආදායමක් ගිණුම් තුලින් නිරූපනය නොවුණි. 2022 දෙසැම්බර් 31 දිනට පැවති විනිමය අනුපාත අනුව එම අගය රු. 4,205,942,732.54 ක් විය. තවද මෙම රදවාගත් ආදායම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කර නොතිබුණි.

එසේම යුධ හා ගුවන් හමුදාවන් විසින් සමාලෝචිත වර්ෂය තුල දී පූර්ව වර්ෂයට අදාලව නිහඟිටි ආදායම රැස්කර ඇතත් ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි වර්ගීකරණයන් යටතේ පූර්ව වර්ෂයට අදාල ආදායම් ලැබීම් දක්වා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 1/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදයම් ප්‍රකාශයෙහි සහ ACA – 1(i) ආකෘතියෙහි හිඟ හිටි ආදායම අතර රු. 626,500 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම ACA – 1(i) ආකෘතියෙහි දක්වා නොතිබීම මෙම වෙනසට හේතු වී තිබුණි.

(ඇ) 2019 වර්ෂය තුළ රැස්කල ශුද්ධ ආදායම රු.21,372,185,188 ක් වුවත්, ACA – 1(i) ආකෘතියෙහි පසුගිය වර්ෂ 03හිදී රැස්කල ශුද්ධ ආදායම දැක්වීමේදී 2019 වර්ෂය තුළ රැස්කල ශුද්ධ ආදායම රු.2,802,302,525 ක් ලෙස දක්වා තිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා භාණ්ඩාගාර පොත් (SA-52) සමඟ සැසඳීමේදී අත්තිකාරම් ලැබීම් (0-0-103-0-11-0) සම්බන්ධයෙන් රු. 6,750 ක වෙනසක් හා අත්තිකාරම් ගෙවීම් (0-0-103-0-11-0) සම්බන්ධයෙන් රු.231,174 ක වෙනසක් පැවති බව නිරීක්ෂණය විය.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවත් 2012 පෙබරවාරි 15 දින ආරක්ෂක අමාත්‍යාංශයට වෙත පවරා තිබුණු ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිහිටි හෙක්ටයාර් 21.0437 ක ඉඩම් කොටස හා සුහුරුපාය ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර් 1.4164 ක ඉඩම් කොටස් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA-82) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් අගය රු.46,683,895 ක් ලෙසද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම රු.209,136,048 ලෙස දක්වා තිබුණු බැවින් රු. 162,452,153 ක වෙනසක් නිරීක්ෂණය විය. ඔයාමඩුව ගබඩා සංකීර්ණය වෙනුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් වියදම් දරන ලදුව මූල්‍ය නොවන වත්කම් (SA-82) ආකෘතිය අනුව කෙරීගෙන යන වැඩ වත්කම් පැවරීම් ලෙස සටහන් වන රු.154,811,387 ක් සහ වැය ශීර්ෂ 103-1-4-0-2104-0/11 වෙනුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් දරා ඇති රු.727,761 ක පැවරීම සහ කලින් පැවති රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය විසින් පවරන ලද වත්කම් වටිනාකම වූ රු. 6,913,005 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වත්කම් අත්පත්කරගැනීම් ලෙස සටහන් කිරීම උක්ත වෙනස සඳහා හේතු වී තිබුණි.

1.6.4 අග්‍රිම ශේෂය

(අ) අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය රු. 11,578,631,743 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අග්‍රිම ලැබීම් ලෙස රු. 12,066,410,675 ක් දක්වා තිබුණු අතර ඒ අනුව අග්‍රිම ලැබීම් රු. 487,778,932 ක් වැඩියෙන් දැක්වුණි. තවද එම ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම වටිනාකම රු. 10,371,888 වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 498,150,820 ක් ලෙස රු. 487,778,932 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව නිවැරදි අගයන් පදනම්කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
හානි පිලිබඳ ලේඛණය	මු.රෙ.103(1)(ඉ) හා මු.රෙ.110	අලාභහානි සිදුවූ වත්කමේ මුල් වටිනාකම, හානිය සිදුවන අවස්ථාවේ ආසන්නතම අගය, නැවත සැපයීමට හෝ අළුත්වැඩියා කිරීමට යන මුදල අයකරගතහැකි හා අයකර ගැනීමට තීරණය කළ මුදල හා පොතෙන් අස්කිරීමේ අධිකාර බලය ආදිය දක්වමින් පූර්වෝක්ත ලේඛණය පවත්වාගත යුතු වුවත් , 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සිදුව ඇති

අනතුරු අලාභහානි හා පාඩු සම්බන්දයෙන් එකී නිශ්චිත තොරතුරු ලේඛණගතව නොතිබුණු අවස්ථා පැවතුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2.1.1 මු.රෙ.128(2)(ඇ) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතුකර ගැනීම සම්බන්ධයෙන් තමා වගකීමට බැඳි ඇති ආදායමින් යම්කිසි කොටසක් වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මගින් එකතු කරනු ලැබේ නම් ඒ දෙපාර්තමේන්තුවලින් සහ කාර්යාලවලින් වාර්තා ලබාගෙන ඒවායේ සඳහන් කරුණු රාජ්‍ය ඇස්තමේන්තුවලට අන්තර්ගත කළ යුතු වේ. ඒ අනුව අමාත්‍යාංශය විසින් ගණන්දියයුතු 10.03.07.05 ආදායම් ශීර්ෂය (බලපත්‍ර ගාස්තු ආදායම) සඳහා 2022 ආදායම් ඇස්තමේන්තුව සහ 2022 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් රැස්කිරීමට යෝජිත ආදායම පිළිබඳව එම ආයතන මගින් ඇස්තමේන්තු කැඳවා නොතිබුණි. ඒ අනුව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම රෙගුලාසි ප්‍රකාරව සිදුකර නොතිබුණි.

2.1.2 2022 මූලික ආදායම් ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතාංක 10.03.07.05 යටතේ බලපත්‍ර ගාස්තු ආදායම රු. 22,050,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර 2022 ජූලි 29 දින අමාත්‍යාංශය විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මගින් රු. 28,890,000 ලෙස සංශෝධනය කර තිබුණි. එසේම 2022 සංශෝධිත අතුරු අයවැය අනුව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.22,000,000 ක් ලෙස තවදුරටත් සංශෝධනයකර තිබුණි. කෙසේ වෙතත් ඒසිඒ 1(iii) ආකෘතියෙහි දැක්වෙන පරිදි වර්ෂයේ තථ්‍ය ආදායම රු.42,416,904 ක් වූයෙන් ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම අතර වෙනස රු.20,416, 904 ක් විය. එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මෙන් සියයට 93ක අගයක් වූ බැවින් බලපත්‍ර ගාස්තු ආදායම නිවැරදිව ඇස්තමේන්තුකර නොමැති බව නිරීක්ෂණය විය.

2.1.3 එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් කටයුතු රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එ.ජ.ඩොලර් 344,559 ක් වසරකට වැඩි කාලයක සිට හිඟහිට පැවතුණි.

2.1.4 පුපුරණ ද්‍රව්‍ය හා තුවක්කු බලපත්‍ර ගාස්තු ,ආරක්ෂක නියෝජිත ආයතන විධිමත් කිරීමේ ගාස්තු වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ආදායම රු. 2,582,270 ක් විය. එයින් රු. 1,326,890 ක් වසරකට වැඩි කාලයක සිට සහ රු.942,690 ක් වසර 02 කට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු බව දක්වා ඇති අතර, එම ඇස්තමේන්තු පදනම්කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමකට අනුව නිසි වැඩපිළිවෙලක් යටතේ වියදම් කළ යුතුවේ. පහත දැක්වෙන නිරීක්ෂණ හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වැය විෂයයන් හතකට සලසා තිබුණු රු. 85,063,000 ක ප්‍රතිපාදන මෙන් පස්ගුණයකට ආසන්න අතිරේක ප්‍රතිපාදන හෙවත් රු. 409,510,000 ක්, පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ. 66 මාරු කිරීම් යටතේ ලබාගෙන තිබීම.

(ආ) වැය විෂයන් පහක් සඳහා සලසා තිබුණු රු. 1,700,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිව පැවති අතර එම සම්පූර්ණ ප්‍රතිපාදනයම මු රෙ. 66 මගින් වෙනත් වැය විෂයයන් පහක් වෙත මාරු කරගෙන තිබීම.

2.2.2 වියදම් වැඩසටහන්ගත කිරීමේදී, අනුමත කරනු ලබන අරමුදල් මුදල් වර්ෂය තුල සාක්ෂාත් කරගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතිකවීම ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වුවත් වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදනය කළ අරමුදල් සම්පූර්ණයෙන්ම උපයෝජනය නොකළ අවස්ථා මෙන්ම ඌණ ලෙස උපයෝජනය කළ අවස්ථාද පැවති බව නිරීක්ෂණය විය. එය මුදල් රෙගුලාසි අංක 04 හි සඳහන් නියමයන්ට පටහැනි බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) 103-01-01 වන ව්‍යාපෘතිය- අමාත්‍ය කාර්යාලයේ පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 21 ක් වෙනුවෙන් රු. 18,015,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර අමාත්‍ය කාර්යාලය සඳහා කාර්ය මණ්ඩලයක් පත්කර නොමැතිවීම හේතුවෙන් පුනරාවර්තන හා මූලධන වියදම් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී ඇති බව ගිණුම් මගින් දක්වා තිබුණි. එහෙත් මෙම ප්‍රතිපාදනයෙන් සියයට 93 හෙවත් රු. 16,805,000 ක්, මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් 17කට මාරු කර වැයකර ඇති බව නිරීක්ෂණය විය. එහෙත් මුදල් රෙගුලාසි 66

යටතේ මාරුකිරීමෙන් අනතුරුව තවදුරටත් ඉතිරිව පැවති රු.1,210,000 ක ප්‍රතිපාදනය පමණක් සියයට 100 ක් ඉතිරියක් ලෙස වියදම් ප්‍රකාශය මගින් දක්වා තිබුණි.

(ආ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු 103-2-17-7-2509-0-13 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 15,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන ඇතත් එම ප්‍රතිපාදනයෙන් රු. 10,371,888 ක් හෙවත් සියයට 69 ක් ඉතිරිව පැවතුණි.

(ඇ) 103-2-19-6-2509-0-17 දරන මූලධන වැය විෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් රු. 78,080,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර , පරිපූරක ප්‍රතිපාදන මගින් රු. 260,000,000 ක්ද, මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් රු. 125,000,000 ක්ද ලබාගෙන තිබුණි. එහෙත් සලසා තිබුණු රු. 463,080,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් දරා ඇති නත්‍ය වියදම රු. 261,500,000 ක් වූයෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 43 ක් හෙවත් රු. 201,580,000 ක ඉතිරිවීම් පැවතුණි.

(ඈ) රු .141,100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 4 කට අදාලව සමාලෝචිත වර්ෂය තුල දරා තිබුණු මුළු වියදම රු. 136,096,605 ක් වුවද, අත්‍යාවශ්‍ය බව හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බව යනාදී කරුණු දක්වමින් මුදල් රෙගුලාසි 66 යටතේ රු. 46,500,000 ක් අතිරේක ප්‍රතිපාදන මාරු කරගෙන ඇතත් එසේ මාරු කරගත් අතිරේක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවති අතර මුල් ප්‍රතිපාදනයෙන්ද රු. 5,003,395 ක් ඉතිරිව පැවතිණි.

2.2.3 2021 දෙසැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 03/2021 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා උපදෙස් ලබා දී තිබුණද 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම සියයට 1,603 දක්වා වැඩිවී තිබුණු අවස්ථා පැවති අතර මුදල් වැය කිරීමේ දී අනාර්ථිකව හා අරපිරිමැසුම් රහිතව කටයුතු කළ අවස්ථාද නිරීක්ෂණය විය.

(අ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය විසින් 2022 ජනවාරි 13 දින පවත්වා තිබූ එක් දින සම්මන්ත්‍රණයකට සහභාගි වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන් 300 ක් ඇතුළු 400ක් වෙනුවෙන් දේශන ශාලාගාස්තු, සංග්‍රහ වියදම් හා අනෙකුත් වියදම් වෙනුවෙන් රු. 5,102,814 ක් වැයකර තිබීම.

(ආ) ජාතික ආරක්ෂක විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවේ දේශකවරු සඳහා පැයකට රු.3,000 ක් බැගින් රු.2,322,261 ක දේශක දීමනා ගෙවා තිබියදී ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් රු.295,920 ක මාසිකව කුලී පදනම මත වාහන දෙකක් සැපයීම වෙනුවෙන් 2022 ජනවාරි සිට

ඔක්තෝබර් දක්වා කාලය තුල රු. 2,756,383 ක් සහ එම වාහන සඳහා ඉන්ධන වියදම්ද දරා තිබීම.

(ඇ) ජාතික ආරක්ෂක විද්‍යායතනය විසින් පවත්වනු ලබන පළමු පාඨමාලාව සඳහා සහභාගි වූ විද්‍යාර්ථීන් 31 ක් සඳහා නවාතැන් පහසුකම් ලබාදීම වෙනුවෙන් 2021 නොවැම්බර් 01 දින සිට ඉදිරි වර්ෂ 2 ක කාලයක් සඳහා රු.72,000,000 ක බදුකුලී ගිවිසුමක් මත ගෘහ ඒකක 24 කින් යුත් නිවාස සංකීර්ණයක් ලබාගෙන මාසිකව රු. 3,000,000 බැගින් කුලී ගෙවා තිබීම හා එම නිවාස සංකීර්ණයේ සිට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් 2022 ජනවාරි 01 දින සිට වසරක කාලයක් සඳහා මාසිකව රු.199,500 ක කුලී පදනම මත බස් රථයක්ද ලබාගෙන තිබීම.

(ඈ) එක් පාඨමාලාවක් අවසානයේදී ඊළඟ පාඨමාලාව කඩිනමින් ආරම්භ කිරීමට හැකිවන පරිදි පාඨමාලා සංවිධානය කර නොතිබීම හේතුවෙන් මාස 03 ආසන්න කාලයක් නිශ්කාර්යව පැවති නිවාස සංකීර්ණයේ බදුකුලී ගෙවීම වෙනුවෙන් රු. 10,500,000 අනාවර්තික වියදමක් දරා තිබීම.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2.3.1 2022 මුල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන සටහන් අංක (iii) හා (iv) අනුව 2022 දෙසැම්බර් 31 දිනට පැවති බැඳීම් හා බැරකම්වල එකතු වටිනාකම රු.449,815,619 ක් වුවත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැරකම් ප්‍රමාණය රු.452,564,354 ක් විය. ඒ අනුව මුල්‍ය ප්‍රකාශන මගින් නිරූපනය වන බැඳීම් හා බැරකම් ප්‍රමාණය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැඳීම් හා බැරකම් ප්‍රමාණය අතර රු. 2,748,735 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3.2 2023 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂණයේදී 2022 වර්ෂයට අදාළ අවස්ථා 04 කදී එකතුව රු. 28,642,188 ක් වූ වියදම් 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2022 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මුල්‍ය ප්‍රකාශනවල රු. 28,642,188ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/8/පොදු(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01.	අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරීන්, විශ්‍රාමික, මියගිය, වැඩ තහනම් කර ඇති නිලධාරීන් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 4,244,535ක් වූ අතර එම ණය ශේෂය තුල වසර 1 සිට වර්ෂ 5 දක්වා හිඟහිටි රු. 1,473,276 ක ශේෂයක්ද, වසර 05ට වැඩි කාලයක් හිඟහිටි රු. 1,336,746 ක ශේෂයක්ද පැවතුණි. මෙම කල්ගතවූ ණය ශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 571 හා 571(2)	ඉකුත් වූ සියළුම තැන්පතු නියාදනය කිරීම සඳහා සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම මු.රෙ.570 හි දක්වා ඇති පරිදි ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කල යුතු වුවද එවැනි ලැයිස්තුවක් පිලියෙල කර නොතිබුණු අතර තැන්පතු ගිණුම් දෙකකට අදාලව පැවති රු. 9,025,947 ක් වූ ටෙන්ඩර් තැන්පතු වර්ෂ දෙක ඉක්මවා ඇතත් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 371 (2) (ආ)	මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්ය නිම කල විගසම පියවිය යුතු වුවත්, සමාලෝචිත

වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අවස්ථා 23 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු. 1,768,330 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේදී දින 26 සිට දින 144 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

iii. මුදල් රෙගුලාසි 128 (I) (ඉ)

රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදනු ලබන බව හා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවට ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු වුවද ආපදා කළමනාකරන අංශය සතු වාහන 25ක් පිළිබඳව වාර්ෂික සමීක්ෂණ සිදු කර නොතිබුණි.

2.5 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

ජාතික ශිෂ්‍යාබට බලකාය විසින් 2022 ජූනි 23 දින දක්වා කාලයට අදාලව තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛනයක් පවත්වා නොතිබුණු බැවින් 2022 මුල් අර්ධ වර්ෂය තුළ මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකු වෙත නිකුත් කර තිබූ රු. 200,000 ක මුදල, තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛනයෙහි සඳහන් වී නොතිබුණි. තවද 2022 ජූනි 23 දිනට පූර්වයෙන් සිදුකළ අතුරු අග්‍රිම ගෙවීම් හා පියවීම් පිළිබඳව අනාවරණය නොවුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

සමාලෝචිත වර්ෂය තුල අංක 0007040119 දරන බැංකු ගිණුම වෙත සෘජු තැන්පතු ලෙස ලැබී තිබුණු රු.1,233,439 ක හඳුනානොගත් තැන්පතු පැවති බැවින් එම වටිනාකම අදාල ගිණුම්වලට ගැලපුම් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතිය

(අ) ආරක්ෂක මුලස්ථානය සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ප්‍රමුඛතා අධියර 08 යටතේ කොන්ත්‍රාත් කාර්යන් 252 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගැනීමට සැලැසුම්කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම කොන්ත්‍රාත් කාර්යන්ගේ භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තා ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳව කාර්යයසාධනය ඇගයිය නොහැකි විය.

(ආ) ආරක්ෂක හමුදා මුලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඇතැම් ඉදිකිරීම් ප්‍රමාදවීම, ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාදවීම ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝකිරීමට සිදුව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු විසින් රු.1,389,272,688 ක් හා එක්සත් ජනපද ඩොලර් 6,212,417 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් (Claims for EOT) 28 ක් ඉල්ලුම් කර තිබුණු බැවින් අසම්භාව්‍ය බැරකමක් පැවතුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) 2016 ඔක්තෝබර් 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් පරිදි ජාතික ආරක්ෂක විද්‍යායතනය 2021 මැයි මස ස්ථාපිත කර, එහි ප්‍රථම පාඨමාලාවේ සහතික පත් ප්‍රදානය 2022 සැප්තැම්බර් 14 දින සිදුකර ඇතත් ආයතනය පිහිටුවීමට අදාල පනත් කෙටුම්පත් සම්මතකර නොතිබීමෙන් ආයතනයට අදාල නීතිමය ප්‍රතිපාදන සැලසී නොතිබුණි.

(ආ) 2016 මාර්තු 30 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් පරිදි ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය 2016 ජූලි මස පිහිටුවා තිබුණි. එහෙත් මෙම ආයතනය නීත්‍යානුකූල පදනමින් ස්ථාපනය කිරීම වර්ෂ 6 කට වැඩි කාලයක් ප්‍රමාදවී පැවතුණි. ආයතනය පිහිටුවීමට අදාල පනත් සම්මත කිරීම ප්‍රමාදවීම ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරේ අහිතකරව බලපා තිබුණි.

(ඇ) උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව 2016 වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට යෝජිතව පැවතියද පාරිසරික අනුමැතියන්ගේ ප්‍රමාදයන්, ඉදිකිරීම් ප්‍රමාදයන් හා ප්‍රසම්පාදන ප්‍රමාදයන් ආදිය හේතුවෙන් සැලසුම්ගත කාලසීමාවන් තුළ අපේක්ෂිත කාර්යසාධන මට්ටම් කරා ලඟාවී නොතිබුණි.

ව්‍යාපෘති කාලසීමාව වර්ෂ 06 කින් දීර්ඝකර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පැවති සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 71.5 ක් බව වාර්තාගතවිය. මෙම ව්‍යාපෘතිය සැලසුම්ගත කාලපරාසයන් තුළ අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත සන්නද්ධ සේවා අතර ඒකාබද්ධ උපාය මාර්ගික සංනිවේදනය පවත්වාගැනීමේ මූලික අරමුණ කාලීනව ඉටුකර ගැනීමට තවදුරටත් ප්‍රමාදවෙමින් පැවතුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර අවස්ථා කීපයකදී කැඳවන ලද නමුදු ලංසු ලේඛණවල සංශෝධනයන් සිදුකලයුතු වීම, ලංසු කරුවන් විසින් ලංසු කොන්දේසි සපුරා නොතිබීම, නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි පිරිවිතර සංශෝධනය කලයුතු වීම ආදී කරුණු හේතුවෙන් ලංසු අවලංගු කර තිබුණ අතර 2021 ජනවාරි 11 දින ප්‍රසම්පාදන කාර්යයන් නැවත අරඹා ඇතත් ලංසු ඇගයීම් ප්‍රමාදය හා ප්‍රසම්පාදන අභියාචනා ක්‍රියාවලියකට යොමුවීම ආදී කරුණු හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ලබාදීම 2022 අප්‍රේල් 20 දක්වා ප්‍රමාද වී තිබුණි. 2022 වර්ෂයේ ප්‍රතිපාදන අවුරා තැබීම හා වියදම් සීමා කිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කාර්ය තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ අනුව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වර්ෂ 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණු අතර එය ව්‍යාපෘතිය ප්‍රමාද වීම කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 38.54 ක් වැයකර මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් හා රු.මිලියන 562.16 ක් වැයකර ඉදිකිරීම් නිමකර තිබුණු සන්නිවේදන කුළුණු 11 සහ එයට සම්බන්ධිත උපාංග මැදිරි සමගාමී ක්‍රියාවන්ගේ දීර්ඝ ප්‍රමාදය හේතුවෙන් 2020 වර්ෂයේ සිට අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකිව තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

3.2.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සඳහා වන අතිරේකය 35 අනුව ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවකට රු. මිලියන 200 ක් දක්වා වන ප්‍රසම්පාදනයන් සඳහා අනුමැතිය ලබාදිය හැකිවුවත් ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගොඩනැගිලි 1, 2, සහ 4 සඳහා සෝෆා කට්ටල 390 ක් සහ මේස (Coffee Table) 110 ක් එකවර මිලදී ගැනීමට කටයුතු නොකර අවස්ථා 3 ක් යටතේ මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් සැලකිය යුතු පරිදි මිල ගණන් වැඩිවී පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව සියළුම ගොඩනැගිලි සඳහා 2021 අගෝස්තු 29 දින එකවර මිල කැඳවීම සිදුකලේ නම් සිදුවී ඇති රු. 3,855,140 මිල විචලන අවාසිය අවම කරගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය.

3.2.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය අනුව ලංසුකරුවකු ඉදිරිපත් කරන ලද ලංසුව ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසු ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අදාල ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කල යුතු වුවත්, අමාත්‍යාංශය විසින් සෝභා කට්ටල සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙත ඇණවුම් ප්‍රදානය කිරීමට දින 33 සිට දින 52 දක්වා ප්‍රමාද වී තිබුණි.

3.3 පාඩු හා හානි

ත්‍රිවිධ හමුදා මූලස්ථාන ව්‍යාපෘතියට අයත් EXPO OTDR Tester උපකරණය 2019 අප්‍රේල් 02 වන දින සිට අස්ථානගතවීමෙන් රු.2,077,328 ක අලාභයක් සිදුවී ඇතත්, එම අලාභයෙන් 2023 මැයි 03 දින වනවිටත් අයකරගෙන ඇති ප්‍රමාණය රු.180,035 ක් පමණක් විය.

3.4 කළමනාකරණ දුර්වලතා

උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය 2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් අත්හිටුවා ඇති ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති අතර සලසා තිබූ රු.මිලියන 141.4 ක ප්‍රතිපාදන අවුරා තබා ඇතත් ව්‍යාපෘතියේ ඉදිරි කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය ප්‍රමාණවත් කාර්ය මණ්ඩලක් පමණක් පවත්වා ගනිමින් වියදම් අවමකර ගැනීමට කටයුතු කළයුතු වුවත්, එතෙක් පැවති මුළු ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂය තුල වැටුප් හා වේතන ගෙවා තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ආරක්ෂක අමාත්‍යාංශය				
ජ්‍යෙෂ්ඨ මට්ටම	78	58	20	
තෘතියික මට්ටම	09	06	3	-
ද්විතියික මට්ටම	253	230	23	
ප්‍රාථමික මට්ටම	132	120	12	-
අනියම් /කොන්ත්‍රාත්	-	18	-	18

එකතුව	472	432	58	18
රාජ්‍ය බුද්ධි සේවය				
ජ්‍යෙෂ්ඨ මට්ටම	39	35	04	-
තෘතියික මට්ටම	132	112	20	
ද්විතියික මට්ටම	2,190	2,082	108	
ප්‍රාථමික මට්ටම	44	40	4	-
අනියම්	25	-	25	-
කොන්ත්‍රාත්	-	10	-	10
එකතුව	2,430	2,279	161	10
ජාතික ශිෂ්‍යභට බලකාය				
ජ්‍යෙෂ්ඨ මට්ටම	02	-	02	-
තෘතියික මට්ටම	04	-	04	-
ද්විතියික මට්ටම	21	04	17	-
ප්‍රාථමික මට්ටම	136	91	45	-
අනියම්	50	48	02	-
එකතුව	213	143	70	-

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ.) අමාත්‍යාංශයේ තනතුරු 58 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු 20 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය.

(ආ) ජාතික ශිෂ්‍යභට බලකායේ තනතුරු 70 ක් පුරප්පාඩුව පැවති අතර ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු පුරප්පාඩු හේතුවෙන් මූල්‍ය පාලන හා ආයතනික පරිපාලන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීම කෙරේ අහිතකරව බලපා තිබුණි.

(ඇ) අමාත්‍යාංශය හා ඒ යටතේ වන අනෙකුත් අංශවල රාජකාරී සඳහා ත්‍රිවිධ හමුදා කාර්යය මණ්ඩලය ලෙස නිලධාරීන් හා සෙසු නිළයන්ට අයත් හමුදා සාමාජිකයන් 700 ක් සේවා නියුක්ත කර තිබුණු අතර ඒ සඳහා වන පාරිශ්‍රමික අදාල ත්‍රිවිධ හමුදා විසින් දරා තිබුණි.

(ඇ) ජාතික ආරක්ෂක විද්‍යායතනය සඳහා අවශ්‍ය වියහැකි කාර්යය මණ්ඩලය නිශ්චය කිරීම, තනතුරු ඇති කිරීම, බදවාගැනීමේ පරිපාටි සැකසීම හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව ඇතුළු නිශ්චිත ආයතන මගින් අනුමැතිය ලබාගැනීම ආදිය සිදුකළ බවට අනාවරණය නොවුණු අතර පරිපාලනමය කාර්යයන් සඳහා ත්‍රිවිධ හමුදාවන්හි නිලධාරීන් හා සෙසු නිලයන්ට අයත් 132 කින් යුත් කාර්ය මණ්ඩලයක් යොදවාගෙන තිබුණු අතර දැනට පවත්වනු ලබන පාඨමාලාවේ උපරිම ධාරිතාවය පුද්ගලයන් 40 ක් පමණක් වන බැවින් සාපේක්ෂව ඉහල පරිපාලනමය කාර්ය මණ්ඩලයක් සේවා නියුක්තකර ඇති බව නිරීක්ෂණය විය.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය
4
කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% -90%	**75%- 89%**	**50%- 74%**
පරිපාලන අංශය			
අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දුන් දේශීය පුහුණු වැඩසටහන් ගණන	-	-	50%
රණවිරුවන් සඳහා බෙදා හරින ලද ඉඩම් ගණන	90%	-	-
මූල්‍ය අංශය			
මුදල් අවශ්‍යතාවය පුරෝකථනය හා ඉල්ලුම් කිරීම	100%	-	-
බැංකු සැසඳුම් වාර්තා සකස් කිරීම	100%	-	-
වවුචර් සහතික කිරීම සහ ගෙවීම	100%	-	-
වැය ලෙජර හා මුදල් පොත් නඩත්තු කිරීම හා තුලනය කිරීම	100%	-	-
මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා භාරදීම	100%	-	-
භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳීම	100%	-	-
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	100%	-	-
සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය			
ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම		85%	-
පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර / බලපත්‍ර නිකුත් කිරීම හා අනුමැතිය ලබාදීම	100%	-	-
අන්තරායකාරී බහාලුම් සහිත නැව් සඳහා අවසරපත්‍ර ලබාදීම	100%	-	-
සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු සඳහා අවසරපත්‍ර ලබාදීම	100%	-	-
තාක්ෂණ අංශය			
ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය		82.00%	
උපාය මාර්ගික සන්නිවේදන ජාල ව්‍යාපෘතිය			71.4%
පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය			
ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ කාර්යභාරයන් පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම	100%	-	-
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ආරක්ෂක විෂය පථයට අදාළ නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම	100%	-	-
ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ත්‍රිවිධ හමුදාව ඇතුළු ආයතනවලට අවශ්‍ය ඉඩම් අත්කර/ පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම		80%	-

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% -90%	**75%- 89%**	**50%- 74%**
අමාත්‍යාංශ විෂය පථයට අදාලව ප්‍රතිපත්ති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු හා දත්ත සැපයීම හා යාවත්කාලීන කිරීම	90%	-	-
ඉඩම් අත්කර ගැනීම්වලට අදාලව ලැබෙන මහජන ඉල්ලීම් හා දුක් ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම.	90%	-	-
සැලසුම් අංශය			
ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	100%		
ප්‍රගති වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම	100%		
ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම	100%		
අමාතයාංශය යටතේ වන වෙනත් ආයතනයන්හි වාර්ෂික වාර්තා හා කාර්යසාධන වාර්තා අනුමත කිරීම සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සැකසීම	100%		
තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම	-	75%	
මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඉදිරිපත් කිරීම	100%		
අයවැය ඇස්තමේන්තු සකස් කිරීම	100%		
ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	100%		
හමුදා සම්බන්ධීකරණ අංශය			
ආරක්ෂක අමාත්‍යාංශයෙහි ආරක්ෂාව සම්බන්ධ කටයුතු කිරීම.	100%	-	-
රටෙහි ඇතිවන විවිධ තත්ත්වයන් යටතේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පති වෙත ආරක්ෂක ලේකම්තුමා විසින් ලබාදෙන උපදෙස් ලබාදීම.	100%	-	-
විදේශීය තානාපති කාර්යාලවල සේවයේ නියුතු ආරක්ෂක උපදේශකයින් සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම සහ අවශ්‍ය අනෙකුත් සම්බන්ධීකරණ.	100%	-	-
ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරන ත්‍රිවිධ හමුදා අයවලුන්ගේ ආරක්ෂක නිෂ්කාශන ලබාදීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා උත්සව/පෙලපාලි සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා තූර්යවාදන කණ්ඩායම් ලබාදීම	95%	-	-
ත්‍රිවිධ හමුදාවන් විසින් අරමුදල්වලින් කරන ව්‍යාපෘති	100%	-	-
වැදගත්කමින් යුතු ස්ථාන වල රූගත කිරීම්/ ඡායාරූප ගතකිරීම් සඳහා අවසර ලබා දීම.	95%	-	-
ටෙලිනාට්‍ය, වෙළඳ දැන්වීම්, චිත්‍රපට සඳහා ත්‍රිවිධ හමුදා නිලඇඳුම්/ උපකරණ යොදාගැනීම සඳහා අවසර ලබා දීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසු නිලයින් සඳහා ත්‍රිවිධ හමුදා නිල ඇඳුමින් යුතුව සිවිල් උත්සව සඳහා සහභාගි වීමට අවසර ලබා දීම.	100%	-	-
රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ශ්‍රමදාන වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සහභාගි කරවීම.	100%	-	-
විදේශීය දූත පිරිස්/ විදේශීය හමුදා දූත පිරිස්වල සංචාර සම්බන්ධීකරණය කිරීම සහ පිළියෙළ කර දීම.	100%	-	-
අතිගරු ජනාධිපතිතුමා සහභාගිවන රාජ්‍ය උත්සව සඳහා අධිසහායකයින් ලබාදීම.	100%	-	-
ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන සහ ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධතාවයෙන් ආපදා කළමණාකරණය සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම.	100%	-	-
විදේශීය දූත මෙහෙවරෙහි යෙදෙන විදේශීය නිලධාරීන් සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදීම.	100%	-	-

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්ෂ නිමැවුම		
	100% -90%	**75%- 89%**	**50%- 74%**
විදේශීය යුධ ගුවන් යානා සහ නාවික යාත්‍රා සඳහා ආරක්ෂණ නිෂ්කාශන ලබාදීම.	100%	-	-
ත්‍රිවිධ හමුදාව වෙතින් ලබාගන්නා සේවාවන් සඳහා විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙතින් කෙරෙන ඉල්ලීම්වලට පිළිතුරු ලබා දීම.	100%	-	-
විවිධ භාණ්ඩ, ගුවන් යානා, නාවික කොටස් සඳහා රේගු නිෂ්කාශන ලබාදීම සඳහා ආරක්ෂක නිෂ්කාශනයන් ලබා දීම.	100%	-	-
ජල ස්කූටර්, ජෙට් ස්කී ආනයනය හා අපනයනය කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදීම.	100%	-	-
යුද්ධ ගුදම් නැවිගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම.	100%	-	-
ගුවන් තොටුපල/ වරාය/ ත්‍රිවිධ හමුදා සංකීර්ණ/ අධි ආරක්ෂිත කලාප සඳහා සංචාරය කිරීම සඳහා අවසර ලබාදීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා නිලධාරීන්/ රාජ්‍ය නිලධාරීන් සමඟ පවත්වන රාජතාන්ත්‍රික හමුවීම් සම්බන්ධීකරණය කරදීම.	100%	-	-
ආගමික ස්ථාන හා රාජ්‍ය ආයතන සඳහා ත්‍රිවිධ හමුදා භටපිරිස් ලබා දීම සම්බන්ධීකරණය කර දීම.	100%	-	-
ධීවරයන්, නීතිවිරෝධී සංක්‍රමණිකයන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නැවත ඔවුන්ගේ රටවල්වලට භාරදීම ආදී කටයුතු සම්බන්ධීකරණය කිරීම.	100%	-	-
නියමුවන් රහිත ගුවන් යානා ගුවන්ගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම.	95%	-	-
ත්‍රිවිධ හමුදා නිලධාරීන් මාධ්‍ය ඉදිරියේ පෙනී සිටීමට හෝ මාධ්‍ය වෙත ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබාදීම.	100%	-	-
මාළු ඇල්ලීම, සමීක්ෂණ, පිහිණුම් සහ නාවික කටයුතු සඳහා විශේෂිත වූ වෙරළ තීරවල එම කටයුතු සඳහා අනුමැතිය ලබාදීම.	95%	-	-
සඳහිරු සෑය ස්තූපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම.	100%	-	-
ආරක්ෂක ලේකම්තුමා විසින් පවරනු ලබන අමතර රාජකාරීන් ඉටුකිරීම.	100%	-	-
අභ්‍යන්තර විගණන අංශය			
ආරක්ෂක අමාත්‍යාංශය	99.44 %		
යුද්ධ හමුදාව		75%	
නාවික හමුදාව		75%	
ගුවන් හමුදාව		75%	
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	100%		
මෙට්‍රොපොලිටන් කැම්පස්		75%	
ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය	100%		
ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය	95%		
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	95%		
ජාතික ශිෂ්‍යභට බලකාය	95%		
අපි වෙනුවෙන් අපි අරමුදල	100%		
ජාතික ආරක්ෂක විද්‍යාතනය			
ජාඇවි පුස්තකාලය සඳහා අවශ්‍යතා මිලදී ගැනීම	-	-	-
මුම්ටාස් මහල් ප්‍රධාන ගොඩනැගිල්ලෙහි වහලය අලුත්වැඩියා කිරීම	134%		
සෙසුනිල නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම	-	-	-
පරිගණක ආශ්‍රිත අයිතමයන් මිලදී ගැනීම			13.25%
වෙනත් ප්‍රාග්ධන වියදම්			22.33%
රණවිරු සේවා අධිකාරිය			
මාපිය රැකවරණ ව්‍යාපෘතිය යටතේ ,මාසිකව රු.700.00 ක ආධාර මුදලක් ලබන රණවිරු දෙමාපියන් සංඛ්‍යාව	**100%**		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% -90%	75%- 89%	50%- 74%
අබාධිත රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබා දීම .	2022 වසර සඳහා ප්‍රතිපාදන නොලැබීම මත 2021 වසරේ අයවැය මඟින් වෙන් කළ මුදල් මඟින් මිලදී ගත් ආබාධිත සහායක උපකරණ රණවිරුවන් වෙත බෙදා දීම පමණක් සිදු විය.		
අබාධිත රණවිරුවන් සඳහා සනිපාරක්ෂක පහසුකම් ලබා දීම.	ප්‍රතිපාදන නොමැතිවීම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීය.		
ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම	-	-	-
රණවිරු ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ නිවාස හා අර්ධ නිවාස ආධාර ලබා දීම. (විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය)	100% තෝරා ගැනීම - රණවිරු සේවා අධිකාරිය , මුදල් ලබා දීම -ජාතික නිවාස සංවර්ධන අධිකාරිය		
රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	ප්‍රතිපාදන නොමැතිවීම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීය.		
ස්වාභාවික ආපදා හානි ප්‍රතිපූර්ණය කිරීම් හා හදිසි ආපදා ආධාර ලබා දීම	100%	-	-
රණවිරු ප්‍රජාවගේ සෞඛ්‍ය මට්ටම වර්ධනය සඳහා වෛද්‍ය ආධාර ලබා දීම.	100%	-	-
ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරුවන්ගේ දරුවන් වෙත "මාපිය කැපකරු" ශිෂ්‍යත්ව ලබා දීම	දේශීය හා විදේශීය පරිත්‍යාග ලැබීම් මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර පරිත්‍යාග ලැබීමේ ප්‍රමාණය අනුව මාසික ප්‍රතිලාභීන් ගණන වෙනස් වේ.		
රණවිරු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම	96%	-	-
සාමාන්‍ය පෙළ ,උසස් පෙළ අසමත් වන දූ දරුවන්ට වෘත්තීය අධ්‍යාපනය ලබා දීම	100%	-	-
ජාතික රණවිරු අනුස්මරණ දිනය පැවැත්වීම	100%	-	-
මයිලපිටිය රණවිරු උද්‍යානය නඩත්තු කිරීම	100%	-	-
රණවිරු ප්‍රජාව වෙත මූල්‍ය ප්‍රතිලාභ හිමිකර දීම.	-	-	-
වැටුප් නොලබන රණවිරු දෙමාපියන් සඳහා මාසිකව "මාපිය සුරැකුම" මූල්‍ය ආධාරයක් ලබා දීම	93%	-	-
රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම	-	77%	-
රණවිරු ප්‍රජාව උදෙසා ව්‍යවසාය සංවර්ධන වැඩමුළු පැවැත්වීම	100%	-	-
රණවිරු සංසද ප්‍රවර්ධන වැඩසටහන් ගණන	100%	-	-
කාර්ය මණ්ඩල සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම	100%	-	-
දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම	-	-	-
රණවිරු නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා නිවාස ණය ලබා දීම	110%	-	-
රණවිරු ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා වෛද්‍ය ණය ලබා දීම	100%	-	-
රණවිරු දරුවන් සඳහා කුසලතා ප්‍රවර්ධන ණය ලබා දීම	%100	-	-
රණවිරු ප්‍රජාවගේ ස්වයං රැකියා වර්ධනය සඳහා ණය ලබා දීම	112%	-	

- **ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය**

කාර්යසාධක දර්ශකය	කාර්යසාධක මිනුම්	ළඟා වූ ඉලක්කයන්
<u>අධ්‍යාපනික දර්ශකය</u> අ. දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන් සහභාගිවන ප්‍රමාණය. ආ. psc සහ (MSc Def & SS) උපාධිය ලබා ගන්නා නිලධාරීන් ප්‍රමාණය. ඇ. පුළුල් පරාසයක් සඳහා වන දැනුම ලබා ගැනීම. **<u>යටිතල පහසුකම් වර්ධනය කිරීමේ දර්ශකය</u>** ඈ. පුහුණු උපකරණ සහ පුහුණු අවස්ථා වැඩි කිරීම.	අ. ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වය වර්ධනය. ආ මාණ්ඩලික පාඨමාලාව සමත්වීමේ ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරීම. ඇ. ආරක්ෂක විද්‍යාවේදි (MSc Def & SS) පාඨමාලාව හිමිගැන්වීම සඳහා සුදුසුකම් ලබන ප්‍රතිශතය. ඈ. විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධනය කිරීම. ඉ. ජාත්‍යන්තර සහභාගිත්වය වර්ධනය කිරීම. ඊ. තොරතුරු තාක්ෂණ පහසුකම් සංවර්ධනය කිරීම. උ. පුස්තකාලයේ කියවීමේ පහසුකම් හා ගුණාත්මක භාවය වර්ධනය කිරීම.	අ. 2022 වර්ෂයේ දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව 149ක් විය. ආ. උපරිම ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වයක් පවත්වා ගැනිම. ඇ. පාඨමාලාව සඳහා විදේශීය ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වය 22ක් විය. ඈ. මාර්ගගත දේශන හා විභාග පැවැත්වීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනිම. ඉ. ශිෂ්‍ය නිලධාරීන් සඳහා පුහුණු පහසුකම් වැඩි දියුණු කිරිම වෙනුවෙන් රු: 196,981,400.46 ක වටිනාකමකින් යුත් පුහුණු ආධාරක සහ අනෙකුත් සෙසු යටිතල පහසුකම්, උපකරණ මිලදි ගැනීම සිදුකරන ලදි. ඊ. පුස්තකාල පහසුකම් වර්ධනය කිරීම.

පරිච්ඡේදය
5
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1
හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු - 2022
ආරක්ෂක අමාත්‍යාංශය

ආරක්ෂක අමාත්‍යාංශය

තිරසර සංවර්ධන අභිමතාර්ථ හා ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2022

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
තිරසර සංවර්ධන අරමුණු 01 -සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම							
1.1 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම.	1.කාර්යක්ෂම ආපදා සහන සේවා	i. ආපදාව සිදුවී අවම කාලයක් තුළ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම	• පැයක් තුළදී ප්‍රතිචාර දැක්වීම			80	ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
		ii. සහන කටයුතු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම	• පැය 12ක් තුළදී ප්‍රතිපාදන නිදහස් කිරීම			75	
		iii. ප්‍රතිපාදන ලබාදීම	• රු.මි.111.11 ප්‍රතිපාදන නිදහස් කිරීම		50		
	2.රණවිරු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.	i. මා පිය සුරැකුම දීමනාව ලබාදීම	• ලබාදෙන ලද දීමනා ප්‍රමාණය මාසිකව දෙමව්පියන් 750 ±			93	රණවිරු සේවා අධිකාරිය
		ii. මා පිය රැකවරණ දීමනාව ලබාදීම	• ලබාදෙන ලද දීමනා ප්‍රමාණය මාසිකව දෙමව්පියන් 34000 ±			100	
	3. රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන්ගේ ආදායම ඉහළ නැංවීම හා රැකියා අවස්ථා සැලසීම	i. ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්	• පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව-15			100	
		ii. රණවිරු දිරිය ස්වයං රැකියා ණය ලබාදීම	• ලබාදෙන ලද ණය ආධාර සංඛ්‍යාව-56			100	
	4. ප්‍රජා දිළිඳුකම පිටුදැකීම	i. UHKDU හරහා නොමිලේ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා වියදම් කිරීම	• වසරකට මුදල රු. 56,909,461				ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
		ii. දේශීය කර්මාන්ත සඳහා උපදේශන ආධාර සංඛ්‍යාව	• උපදේශනය දුන් ආයතන සංඛ්‍යාව				
		iii. සිසුන් සහ කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන සමාජ සත්කාර ක්‍රියාකාරකම්	• වසරකදී කරන වැඩසටහන් ප්‍රමාණය-14				
1.5 2020 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට	1.ආපදා අවදානම් සම්බන්ධව ආයතනික ධාරිතා වර්ධනය, දැනුවත්	i. දිස්ත්‍රික් මෝසම් වර්ෂාව සඳහා පෙර සූදානම් වැඩසටහන් 26ක් නිම කිරීම	• වැඩසටහන් 15ක් පවත්වා ඇත.	58			ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන
		ii. ප්‍රාදේශීය මෝසම් වර්ෂාව සඳහා පෙර සූදානම් වැඩසටහන් 115ක් නිම	• වැඩසටහන් 55ක් පවත්වා ඇත.	48			

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
ලක් විය හැකි තත්ත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණික තත්ත්වයන්ගෙන් ඇති වන්නා වූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නා වූ හානි සහ ආපදාවලට නිරාවරණය වීම ද අඩු කිරීම	කිරීම් හා පුහුණු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම	කිරීම					
		iii. ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතනයන්හි නිලධාරීන් ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පැවැත්වීම	• වෛද්‍යවරුන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් ඇතුළු පාර්ශවකාර නිලධාරීන් දැනුවත් කිරීමේ 16ක් වැඩසටහන් පවත්වා ඇත.			100	
		iv. ආපදා අවදානම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී පාර්ශවකාර ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා රැස්වීම් 04ක් පැවැත්වීම	• ආපදා අවදානම් සම්බන්ධව සම්බන්ධීකරණ රැස්වීම් 02ක් පවත්වා ඇත.		50		
		v. මහජනතාව තුළ ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා අත්පත්‍රිකා, පෝස්ටර්, පොත් හා සංඥා පුවරු ආදිය සකස් කර බෙදාහැරීම මෙන්ම මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය හා දැනුවත් කිරීම	• අත්පත්‍රිකා, පොත් 400ක් මුද්‍රණය කර බෙදා හැරීම හා මාධ්‍ය සාකච්ඡා 03ක් පැවත්වා ඇත.	30			
		vi. අධ්‍යාපන ක්‍රියාවලියට සම්බන්ධ ආයතන හා සංවිධාන තුළ ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් පැවැත්වීම	• වයඹ හා මධ්‍යම පළාත්හි පළාත් සභා තුළ අධ්‍යාපන අංශයන්හි නිලධාරීන් සඳහා වැඩමුළු 02ක් පළාත් මට්ටමින් පවත්වා ඇත.	33			
		vii. දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 371ක් ක්‍රියාත්මක කිරීම	• දිස්ත්‍රික් මට්ටමින් පාසල් ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන් හා සෙවීම් හා මුදවා ගැනීම් කණ්ඩායම්, තරුණ ප්‍රජාව හා මහජනතාව දැනුවත් කිරීම වැඩසටහන් 150ක් පවත්වා ඇත.	40			
		viii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 07ක් ක්‍රියාත්මක කිරීම	• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව හා කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් 07ක් පවත්වන ලදි.			100	
		ix. දිස්ත්‍රික් මට්ටමින් පළාත් පාලන ආයතනවල ඉංජිනේරුවරුන්, තාක්ෂණික නිලධාරීන්හට ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය	• රත්නපුර, කෑගල්ල හා මාතර දිස්ත්‍රික් මට්ටමේ පළාත් පාලන ආයතනවල ඉංජිනේරුවරුන් හා තාක්ෂණික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වා ඔවුන්ගේ ධාරිතා		50		

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
		පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමට වැඩසටහන් 06 ක් පැවැත්වීම	වර්ධනය කිරීම				
		x. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්හට භූගෝලීය පද්ධති තොරතුරු පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සම්බන්ධ වැඩසටහන් 02ක් පැවැත්වීම	• (ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ) භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ දින 05ක නේවාසික පුහුණු වැඩසටහනක් 02ක් පවත්වා ඇත.			100	
	2.ආපදා අවදානම අවබෝධ කර ගැනීම	i. ආපදා අවදානම සම්බන්ධව සියලු පාර්ශවයන්, දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම	• ආපදා අවදානම සම්බන්ධව දැනුවත්වූ හා පුහුණුව ලැබූ පාර්ශවයන්			100	ආපදා කළමනාකරණ අංශය
		ii. ආයතනික ධාරිතා වර්ධනය ආපදා කළමනාකරණ කණ්ඩායම් හා ඊට සම්බන්ධ සාමාජිකයින්ගේ ධාරිතා වර්ධනය	• පැවැත්වූ ධාරිතා වර්ධන වැඩසටහන් හා වැඩමුළු සංඛ්‍යාව		71		
		iii. බහු උපද්‍රව අවදානම් පැනිකඩ සංවර්ධනය කිරීම නායයෑම් අවදානම් පැනිකඩ නිර්මාණය කිරීම තුළින් ආපදා අවදානම හඳුනාගැනීම හා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	• සංවර්ධනය කළ බහු උපද්‍රව අවදානම් පැනිකඩයන් හා නායයෑම් අවදානම් පැනිකඩයන් හා සම්පූර්ණ කරන ලද පෙර සූදානම් සැලසුම්			74	
2.1.1.ආහාර අනාරක්ෂිතතා අත්විඳීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුළ මධ්‍යස්ථ සේ තිබූ ආහාර අනාරක්ෂිත භාවයේ ව්‍යාප්තිය	1.ආහාර සැපයීමේදී/ පිළිගැන්වීමේදී සිදුවන අපතේ යෑම අවම කිරීම ආහාර අනාරක්ෂිත බව අවම කරන්න	i. සියලු විශ්ව විද්‍යාලවල ආහාර අපතේ යෑම ගණනය කිරීම	• වසරකට අපතේ යවන ආහාර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 71.4				ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
		ii. විශ්ව විද්‍යාල තුළ ආහාර වගා කිරීම	• අස්වනු නෙලන භෝග ප්‍රමාණය 408kg එළවළු				
තිරසර සංවර්ධන අරමුණු 02 - සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම							
2.c සීමාන්තික වශයෙන් ආහාර	1.සීමාන්තික වශයෙන් ආහාර	i.විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර	• ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය පිහිටුවීම			80	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදනය	නිෂ්පාදන ව්‍යාපෘති සිදුකිරීම.	• වී, එළවළු, බඩඉරිඟු, කජු, දේශීය අඹ වගා කිරීම, විවිධ ධාන්‍ය, කුළුබඩු, අමු මිරිස්, කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය ආදී මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.			90	
		ii.පොල් පැළ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය.	• ආරක්ෂක කඳවුර, රාජ්‍ය ආයතනයන්හී රෝපණය කිරීම හා යුද්ධ හමුදා/සිවිල් සාමාජිකයින් හට සහනදායී මිල ගණන් යටතේ ලබාදීම හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලයේ ලබාදීම.			85	
		iii.අපනයන ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය	• අපනයන ඉලක්ක කරගත් බෝග වගා කටයුතු කිරීම.	40			
		iv.දියර කිරි ජීවානුහරණය කිරීම හා දියර කිරි යොදා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වාදීම.	• දියර කිරි යොදා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම.			80	
		v.බිත්තර අවශ්‍යතාවය ලබාදීම.	• අවශ්‍යතාවය සපුරාලීම සඳහා යුද්ධ හමුදා ගොවිපළ ලේයර් සතුන් 25,000 යෙදවීම.			85	
		vi. ශ්‍රී ලංකා ලුණු සංස්ථාව හා එක්ව නිෂ්පාදනය ආරම්භ කිරීම.	• ශ්‍රී ලංකා ලුණු සංස්ථාව එක්ව ලුණු නිෂ්පාදනය කිරීම.			90	
		vii.අක්කර 500 ක TJC අඹ වගා ව්‍යාප්තිය	• පළතුරු ආනයන අවම කිරීම හා දේශීය අවශ්‍යතාවයට රුකුලක් වීම.			95	
		viii.අක්කර 1000 ක පොල් වගා ව්‍යාප්තිය	• යුද්ධ හමුදා කඳවුරු ආවරණය කරමින් ආරම්භ කර ඇති අතර, යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පරිභෝජනය හා සුභසාධන කටයුතු සඳහා ලබාදීම.	40			

<table>
<tr><th rowspan="2">ප්‍රතිපත්ති ඉලක්ක</th><th rowspan="2">උපායමාර්ග</th><th rowspan="2">ඉලක්කය/දර්ශකය</th><th rowspan="2">2022 භෞතික ප්‍රගතිය*</th><th colspan="3">2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**</th><th rowspan="2">වගකීම</th></tr>
<tr><th>0%-49%</th><th>50%-74%</th><th>75%-100%</th></tr>
<tr><td>1</td><td>2</td><td>3</td><td>4</td><td colspan="3">5</td><td>6</td></tr>
<tr><td rowspan="3"></td><td>2.විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම</td><td>i. වාර්ෂිකව වී, එළවළු, බඩඉරිඟු, කජු, දේශීය අඹ, විවිධ ධාන්‍ය, කුළු බඩු වගා කිරීම.
කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන කිරීම</td><td>
<table>
<tr><th>ව්‍යාපෘතියේ නම</th><th>ව්‍යාපෘති ගණන</th><th>අක්කර ගණන</th><th>අස්වැන්න (Kg)</th></tr>
<tr><td>වී</td><td>-</td><td>1,371</td><td rowspan="2">3,676,200</td></tr>
<tr><td>අඳ වී</td><td>2,789</td><td>2,789</td></tr>
<tr><td>බඩ ඉරිඟු</td><td>30</td><td>721</td><td>130,706</td></tr>
<tr><td>කව්පි</td><td>13</td><td>36</td><td>9,□23</td></tr>
<tr><td>කුරක්කන්</td><td>26</td><td>232</td><td>41,629</td></tr>
<tr><td>උඳු</td><td>23</td><td>270</td><td>41,800</td></tr>
<tr><td>රට කජු</td><td>16</td><td>135</td><td>147,236</td></tr>
<tr><td>තල</td><td>30</td><td>2□1</td><td>32,559</td></tr>
<tr><td>වෙනත්</td><td>69</td><td>3,198</td><td>3,529</td></tr>
</table>
</td><td></td><td></td><td></td><td>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>3.දියර කිරි ජීවානුහරණය කිරීම හා දියර කිරි යොදා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම</td><td>ii. අවශ්‍යතාවයට ගැළපෙන පරිදි කිරි නිෂ්පාදන ඉහළ නැංවීම</td><td>• දියර කිරි අස්වැන්න = ලීටර 11,361</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>4.බිත්තර අවශ්‍යතාවය</td><td>i.බිත්තර අවශ්‍යතාවය සපුරා ලිම සඳහා දැනටමත් ශ්‍රීලංනානෙෆ කාශ්‍යප</td><td>• 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා ගම් කුකුළු බිත්තර නිෂ්පාදනය 253 කි.</td><td></td><td></td><td></td><td>ශ්‍රී ලංකා නාවික හමුදාව</td></tr>
</table>

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
	ලබාදීම	ආයතනයෙහි ගම් කුකුලන් යොදා ගනිමින් කාබනික බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතියක් (Organic Egg Production Farm Project) පවත්වාගෙන යන අතර, මේ වන විට ගම් කුකුළන් හා කිකිළියන් සංඛ්‍යාව 60 කින් සමන්විත වේ. ii. තවද, වර්තමානයේ රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ අපේක්ෂිත ඉලක්ක කරා සංවර්ධනය කර ගැනීම සඳහා යෙදවීමට අවශ්‍ය ලේයර් සතුන් හා ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම දුෂ්කර කාර්යයක් වී ඇති බැවින්, මහා පරිමාණයෙන් බිත්තර නිෂ්පාදනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.					
	5. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පාංශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදුකිරීම.	I.Develop a Model to Identify Coconut Plant Shortage in Coconut Land to Increase Coconut Productivity of the country - Stage පොල් ලංකාවේ අත්‍යවශ්‍ය ආර්ථික බෝගවලින් එකකි. එය ශ්‍රී ලංකාවේ පරිභෝජනයට අවශ්‍ය තෙල් නිෂ්පාදනය කරයි. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදුකරන ලද මූලික අධ්‍යයනය මඟින් පොල් වගා භූමිවල පොල් වගා කළ හැකි ස්ථාන හඳුනාගැනීමේ හා පොල් ගස් ගණනය කිරීමට අදාළ මොඩියුලයක් සාර්ථකව නිපදවා ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් පොල් වගාවට සිදුවන වගා හානි ගැන අධ්‍යයනය කළ හැකි මොඩියුලයක් නිෂ්පාදනය කරයි.	• වෙබ් යෙදුම (Web application) සකස් කර ඇත.		65		ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
	6. කාබනික ආහාර නිෂ්පාදනයට, වැවිලි කර්මාන්තය හා සත්ව පාලනයට රණවිරු ප්‍රජාව යොමු කිරීම.	පවත්වා ගෙන යනු ලබන ගෙවතු වගා ගොවිපළ, මී මැසි පාලන බිම්	• වැඩසටහන් 15			100	රණවිරු සේවා අධිකාරිය
2.4. 2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ කාලගුණික වෙනස්වීම් වලට හැඩගැසීම් සඳහා වූ ධාරිතාවයන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණික තත්වයන් , නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක	1. 2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ කාලගුණික වෙනස්වීම්වලට හැඩගැසීම් සඳහා වූ ධාරිතාවයන් ශක්තිමත් කිරීම	i.අවශ්‍ය කැලෑ මාළු ආනයනය කිරීම සම්පූර්ණයෙන් නතර කර කැලෑ සලාක මාළු නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.	• යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩු වෙතින් කැලෑ සලාක මාළු නිෂ්පාදනය කිරීම		60		ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
		ii.රසායනික පොහොර භාවිතය සීමා කිරීම හේතුවෙන් සියලු යුද්ධ හමුදා ගොවිපළ කේන්ද්‍ර කරගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය	• කොම්පෝස්ට් නිෂ්පාදනය කර ශ්‍රී ලංකා පොහොර සංස්ථාව වෙත ලබාදීම	40			
		iii. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනයට දායක වීම.	• කාබනික පොහොර නිෂ්පාදනය	40			
			• කාබනික පොහොර යෙදූ කෘෂිකර්මාන්තය		60		

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
තත්ත්වයන්							
තිරසර සංවර්ධන අරමුණු 03 - නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සිල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම							
3.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	1.සෞඛ්‍ය සේවයේ වන තදබදය අවම කර ගැනීමට,සේවයේ යුතු/අබාධිත/විශ්‍රාමික යුද්ධ හමුදා අයවළුන් සඳහා වෛද්‍ය පහසුකම් ලබා දීමට,යුද්ධ හමුදා අයවළුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා වෛද්‍ය පහසුකම් ලබා දීම වෙනුවෙන් නව හමුදා රෝහල ඉදිකිරීම.	i.පල්ලෙකැලේ ඉදිකරනු ලබන යුහ රෝහල ඉදිකිරීම.	• ඉදිකිරීම් කටයුතු අවසන් අධියරයේ පවතියි.			90	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
	2.යුද්ධ හමුදා රෝහල්/ යුද්ධ හමුදා මූලික රෝහල්/ ක්ෂේත්‍ර රෝහල් ස්ථාපිත කර යුද්ධ හමුදා වෛද්‍ය සේවාව විමධ්‍යගත කිරීම.	i.යුද්ධ හමුදා ඉදිරි පස් වසරක සැලැස්මට අනුව වෛද්‍ය සේවාව විමධ්‍යගත කිරීමේ අරමුණින් අදියර 2 යටතේ යහ මූලික රෝහල් සහ ක්ෂේත්‍ර රෝහල් ස්ථාපිත කර 2025 වර්ෂය වන විට යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව පුළුල් සහ ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම. (I අදියර යටතේ බ්ලැස්, අම්පාර සහ කුරුණෑගල ක්ෂේත්‍ර රෝහල් ද, II අදියර යටතේ හම්බන්තොට සහ කුරුවිට යන ප්‍රදේශයන් ආවරණය කිරීම සඳහා රෝහල් ආරම්භ කිරීම	• නුදුරේදී ආරම්භ කර පවත්වාගෙන යාමට නියමිත ක්ෂේත්‍ර රෝහල බ්ලැස් හි සියලු යටිතල පහසුකම් සපුරා ඇති අතර, වෛද්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා යෝජිත වෛද්‍ය කාර්යය මණ්ඩලය 80%ක ප්‍රමාණයක් මේ වන විට අනියුක්ත කර ඇත.		60		
			• අම්පාර ක්ෂේත්‍ර රෝහල සඳහා යටිතල පහසුකම් හා අනෙකුත් ඉදිකිරීම් සිදුකරමින් පවතී.	40			
			• හම්බන්තොට ක්ෂේත්‍ර රෝහල සඳහා අර්ධ වශයෙන් ඉදි කරන ලද ගොඩනැගිලි සමඟ ඉඩමක් ලැබී ඇත.	35			

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
			• කුරුණෑගල ක්ෂේත්‍ර රෝහල ඉදි කිරීම සඳහා පාන්ගොල්ල ප්‍රදේශයේ භූමියක් යෝජනා කර ඇත.	45			ශ්‍රී ලංකා ගුවන් හමුදාව
	3. නව ගිලන් රථ මිලදී ගැනීම සඳහා යුද්ධ හමුදාධිපති වෙතින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.	i. 2022 වර්ෂය සඳහා VVIP වර්ගයේ ගිලන් රථ 02ක ප්‍රමාණයක් හා සාමාන්‍ය වර්ගයේ ගිලන් රථ 34 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත මිලදී ගැනීම සැලසුම් කර තිබේ.	• 2022 වර්ෂය තුළදී ගිලන් රථ මිලදී ගැනීමට අනුමැතිය ලැබී නොමැත.	20			
	4. ජංගම රසායනාගාර, ජංගම රෝහල් සහ ජංගම පුල්හීම්ස් ඒ ඒ ප්‍රදේශ ආවරණය වන පරිදි අවශ්‍ය ප්‍රමාණයෙන් පවත්වාගෙන යාම.	ii. ජංගම රසායනාගාර, ජංගම රෝහල් සහ ජංගම පුල්හීම්ස් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික උපකරණ සහ අනිකුත් පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.	• යුද්ධ හමුදා රෝහල (කොලඹ) හි මේ වන විටත් වෛද්‍ය සේවාවන් ලබාදීම සඳහා ජංගම බස්රථයක් හා ජංගම රසායනාගාරයක් ස්ථාපිත කොට ඇත.		45		
	5. විශේෂඥ වෛද්‍යවරුන් සඳහා එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී අවස්ථා ලබාදීම සහ ඔවුන් සඳහා නිශ්චිත වැටුප් තල සහ දිරි දීමනා ලබාදීම තුළින් යුද්ධ හමුදාව වෙත බඳවා	iii. යුද්ධ හමුදාව තුළ පවතින විශේෂඥ වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කර ප්‍රශස්ත වෛද්‍ය සේවාවක් හමුදා සාමාජිකයන් / ඔවුන්ගේ පවුල්වල අයවළුන් හා විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයන් / හදිසි ප්‍රතිකාර ඒකක වෙත ලබාදීම.	• 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත බඳවා ගන්නා ලද විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රමාණය 04කි.		45		

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2022 භෞතික ප්‍රගතිය*	2022 වර්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රතිශතය**			වගකීම
				0%-49%	50%-74%	75%-100%	
1	2	3	4	5			6
	ගැනීම.						ශ්‍රී ලංකා නාවික හමුදාව
	6.කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථාන පැවැත්වීම	iv. අධි සත්කාර ඒකක පහසුකම් ලබාදීම	• අතරමැදි මධ්‍යස්ථානවල කොවිඩ් 19 මාසික නේවාසික රෝගීන් සංඛ්‍යාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථාන 08කදී රෝගීන්ට නේවාසිකව ප්‍රතිකාර ලබා දුන් අතර 2022 මැයි මස 17 වන දින සිට එම මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවීය.				
